# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015 අප්‍රේල් 07** වන අඟහරුවාදා
2015 சித்திரை 07 செவ்வாய்க் கிழமை
Thuesday 07th April 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.33 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.33 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.33 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ගරු ඔබතුමන්ලාට ඉදිරිපත් කරනවා.

i. 2015.03.18 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව,

ii. 2015.02.09 වන දින පැවති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ,

iii. 2015.02.02, 2015.03.03, 2015.03.04 හා 2015.03.10 යන දිනවලදී පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තා.

ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පරිවර්තනයන් පසුව ගරු ඔබතුමන්ලාට ලැබෙන්නට සලස්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කොළඹ 13, මහ විද්‍යාල මාවත, අංක 28/1 හි පදිංචි ඒ.එච්. තාජුදීන් යන අයගේ පෙත්සම,

ii. කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, නව ජයවීර මාවත, අංක 20/1 හි පදිංචි වී.පී. රංජනී හේමචන්ද්‍ර යන අයගේ පෙත්සම,

iii. හල්කඳවිල, දුවේගොඩ, අංක 216 හි පදිංචි අයේෂා තරංගනී උදම්යාවල යන අයගේ පෙත්සම සහ,

iv. කොළඹ 02, හයිඩ්පාර්ක් කෝනර්, අංක 46/7 හි පදිංචි ජී. ඇලෙක්සැන්ඩර් යන අයගේ පෙත්සම.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අවිස්සාවේල්ල, කුඩගම, අංක 235/50, එම්.ඩී. ශ්‍යාමා චාන්දනී රූපසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පස්යාල, මත්තෙගොඩ, හේනේපොල පාර, අංක 161/F හි ටී.ඩී.එස්. ජයවතී පෙරේරා යන අයගේ පෙත්සම,

ii. වේවැල්දෙණිය, ඉහළගම, විජයසිරි හි පදිංචි අයි.එච්.ඩබ්ලිව්. විතාරණ යන අයගේ පෙත්සම සහ,

iii. කඩවත, සූරියපාලුව, අංක 93/ඒ/01 ආරියවංශ පෙරේරා යන අයගේ පෙත්සම.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, කැස්බෑව, හොරණ පාර, හරිත පෙදෙස, අංක 187/7 හි පදිංචි යූ.එල්.එස්.එන්. පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, පානදුර, තොටවත්ත, කලීෆා පාර, අංක 11/11 හි පදිංචි එම්.අයි.එම්. හුසේන් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කැලණිය, දුටුගැමුණු මාවත, අංක 104 හි පදිංචි එම්.එල්.ආර්. ෆොන්සේකා යන අයගේ පෙත්සම.

ii. කඩවත, සූරිය පාළුව, අංක 121 හි පදිංචි එම්. වරුණ රුක්මල් යන අයගේ පෙත්සම සහ,

iii. කඩවත, සූරියපාලුව අංක 93ඒ/01 හි පදිංචි ඒ.එම්. ආරියවංශ යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති 02 ක කාලයක් ඉල්ලනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේකට මෙපමණ කල් ගන්න දෙයක් නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, ඇත්ත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇයි ඉතින් මෙපමණ කල් මේ විධියට ගන්නේ? මොකද, අමාත්‍ය මණ්ඩලයක් කිව්වාම, සාමූහිකව වග කියන්න ඕනෑ. ප්‍රධාන ඇමතිතුමා නැති එක මට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේකට උත්තරයක් ඇමතිවරුන් හැටියට දෙන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු ප්‍රධාන අමාත්‍යතුමා අද උත්තර දෙන්න ඉන්නේ. මම හිතන්නේ, පොඩ්ඩක් පරක්කු වෙලා තිබෙනවා. ඒ නිසයි මම කාලයක් ගත්තේ. මොකද, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලංකාවේ ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔය උත්තරය දීලා හරියන්නේ නැහැ. මේක මරණාධාර සමිතියක් නොවෙයි. මේක බස්නාහිර පළාත් සභාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක ඇත්තෙන්ම වගකීමක් තිබෙන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මරණාධාර සමිතියක නම්, මම එය අහගෙන යනවා. මේක පළාත් සභාව.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා කියන්නේ කාලය ගන්න බැහැ. අපේ අදහස් ප්‍රකාශ කරන්න බැහැ. එහෙමද කියන්නේ ඔබතුමා? ඔබතුමා මොකක්ද කියන්නේ කියන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කථා කරලා වැඩක් නැහැ. මම කියන්නේ, පවතින ප්‍රශ්නය මම සභාපතිතුමාට කියන්නේ. මට ඔබතුමාත් එක්ක ප්‍රශ්නයක් නැහැ. සභාපතිතුමා පියවරක් ගන්න ඕනෑ, මේ සභාවට උත්තර දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා සභාවේ ගරුත්වය ආරක්ෂා කරලා කථා කරන්න. ඔබතුමා මොකක්ද කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා අනවශ්‍ය ගැටුම්වලට යන්න අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා සභාවේ ඔය විධියට උත්තර දෙන්න එපා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා මෝඩයෙක් වාගේ නේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෝඩයා කවුද කියලා දන්නවා. හරකා කියන්නේ කවුද කියලා දන්නවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාට මම වැදගත් විධියට කිව්වා නේ? සති දෙකක් ඉල්ලුවා. මහ ඇමතිතුමා එනවා කිව්වා. මෝඩයෙක් වාගේ සභාවේ හැසිරෙන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරකෙක් වගේ හැසිරෙන්න එපා. ගොනෙක් වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. මොකද, මේ ප්‍රශ්නය -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ වචන ආලා අපව යට කරන්න එන්න එපා. ඒවා හරියන්නේ නැහැ. ඒවා පුළුවන් මීගමුවේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කාටවත් අභියෝග කරන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ ප්‍රශ්නය ඇහුවා. ප්‍රශ්නයට උත්තර දුන්නා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මීගමුවේ පුළුවන්. අපිත් එක්ක හරියන්නේ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ ප්‍රශ්නය ඇහුවා. ප්‍රශ්නයට උත්තර දුන්නා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. ඔබතුමා ඉඳගන්න කෝ. ඔබතුමාට අදාළ -

[සභාවේ ඝෝෂා]

මේ ප්‍රශ්නයට කොපමණ කාලයක්ද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කාගේ යුගයද තිබෙන්නේ? ජේ.වී.පී. යුගය ද තිබෙන්නේ? ඔබතුමාගේ යුගය ද තිබෙන්නේ? අනේ කට වහගෙන ඉන්න මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෙපමණ කල් මේ ප්‍රශ්නය ගැන ඉවසගෙන හිටියා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කාගේ යුගය වුණත් අපි භය නැහැ. තමුන්නාන්සේලා වාගේ මිනී මැරුවේ නැහැ අපි. තමුන්නාන්සේලා තමයි මිනී මැරුවේ. මිනී මරුවෝ තමුන්නාන්සේලා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මීගමුවේ මිනිස්සුන්ට කථා කරන විධියට අපට කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේලා මිනී මරපු හැටි අපි දන්නවා. මිනී මරපු හැටි, බස් ගිනි තියපු හැටි අපි දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය දේවල්වලට යන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා කල්පනා කරලා බලන්න. අර මීගමුවේ හන්දියේ බජාර්කාරයින්ට කථා කරන විධියට අපට කථා කරන්න එපා කියන්න. එහෙම කොහොමද අපට කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේලා තමයි මිනී මැරුවේ. අනේ කරුණාකරලා ඉඳගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මීගමුවේ බජාර් එකේ කට්ටියට කථා කරන විධියට අපට කථා කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම මොකක්ද කිව්වේ ගරු සභාපතිතුමා?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම කථා කරලා හරියන්නේ නැහැ, මේ සභාවේ. මෙතුමා කොහොමද එහෙම කථා කරන්නේ?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම කිව්වේ මහ ඇමතිතුමා එනවා. ආපුවාම උත්තර දෙයි කියලා. මොකක්ද ඊට වඩා කිව්වේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක මම ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක බලාගන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී සභාවේ ගණ පූරණය නැහැ. ගණ පූරණය සම්පූර්ණ කරන්න.

***සභාව ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති නොවූයෙන්, ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 09.58 ට යළිත් රැස් විය.***
*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung, Later, It found no quorum Mr. Chairman, suspended the sitting temporarily and it resumed at 09.58 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. මේ අවස්ථාවේදී සභාවේ ගණ පූරණය සම්පූර්ණව තිබෙනවා. නැවත වරක් අපි න්‍යාය පත්‍රයට යනවා. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එකඟ නම්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් සභාවේ දැන් ඉන්නවා. දෙදෙනාගේ එකඟතාවය මත මට ඕනෑ නම් අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, පළමු වැනි ප්‍රශ්නය.

## කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාසල් : ළමුන් ඇතුළත් කිරීම - 2015
## PROVINCIAL SCHOOLS OF COLOMBO DISTRICT: ENROLLMENT OF STUDENTS - 2015

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**01.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/01)**

අ. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාසල්වල 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගනු ලැබුවේද?

ආ. එම ඇතුළත් කිරීම්වලට අනුව පාසලක හඳුනා ගැනීම සඳහා යොදා ඇති පන්තිවල නම් සහිතව එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන හා ඒ ඒ පන්තියේ සම්පූර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන කොපමණද?

ඇ. පුරප්පාඩු සඳහා ක්‍රියාත්විත රාජකාරියේ සිටින පාසල්වල ළමුන් ලෙස අයදුම් කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන ඒ ඒ පාසල්වලට අනුව කීයද?

ඈ. ඒ අනුව ඒ ඒ පන්තිවල ඇතුළත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන කීයද?

ඉ. මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

අ. ඔව්.

ආ. ඇ. සහ ඇ. යන ප්‍රශ්න සඳහා පිළිතුරු ඇමුණුම්.

## 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීම

### කොළඹ කලාපය

| අනු අංකය | පළාත් පාසලේ නම | එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන | ඒ ඒ පන්තියේ සම්පූර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන | ඒ ඒ පාසලට අනුව පුරප්පාඩු සඳහා ක්‍රියාත්මක රජකාරියේ සිටින පවුල්වල ළමුන් ලෙස අයදුම්කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන | ඒ ඒ පන්තිවලට ඇතුළත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන (40 සීමාව තුළ ක්‍රියාත්මකය ඇතුළුව) | පුරප්පාඩු පිරවීමට ගන්නා ක්‍රියා මාර්ගය | පුරප්පාඩු පිරවීම ක්‍රියා නොකරන්නේ නම් එයට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| 01. | අනුරුද්ධ බාලිකා විද්‍යාලය | 29<br>30<br>21 | 04<br>03<br>12 | 01<br>-<br>- | 06<br>10<br>19 | පොරොත්තු ලේඛනයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ අනුමත කළ ලිපි මගින් | අයදුම්පත් ඉදිරිපත් වුවහොත් පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |
| 02. | ශාන්ත ඇන්ඩෘ විද්‍යාලය | 14 | 19 | - | 26 | පාසලට පැමිණෙන සිසුන් ඇතුළත් කර ගැනීම. | එම |
| 03. | හේමමාලි බාලිකා මහා විද්‍යාලය | 1 A - 33<br>1 B -33 | නැත.<br>නැත | එවා නොමැත<br>එවා නොමැත | ක්‍රියාත්මක - 07<br>ක්‍රියාත්මක - 07 | කලාප කාර්යාල අනුමැතියට අනුව | එම |
| 04. | ශ්‍රී සංඝබෝධි විද්‍යාලය | 32 | 01 | නැත | 08 | කලාප තරග | එම |
| 05. | සීවලී මධ්‍ය මහා විද්‍යාලය | 31 | 02 | නැත | 09 | - | එම |
| 06. | ශාන්ත ජෝන් මහා විද්‍යාලය | 1 A - 33<br>1 B -33<br>1 C - 33 | -<br>-<br>- | -<br>-<br>- | 07<br>07<br>07 | -<br>-<br>- | එම |
| 07. | කතිරියා මුස්ලිම් බාලිකා මහා විද්‍යාලය | 1 A - 33 | - | - | 07 | පොරොත්තු ලේඛනය අනුව | එම |
| | | 1 A - 33<br>1 B -33<br>1 C - 33 | 07<br>07<br>07 | -<br>-<br>- | 07<br>07<br>07 | - | එම |
| 08. | ඩිලා සැල් විද්‍යාලය, කොළඹ 15 | 1 A - 33<br>1 B -33 | -<br>- | 01 | 1 A - 06<br>1 B -07 | පොරොත්තු ලේඛනයේ ලකුණු අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවමින් සිටී. | එම |
| 09. | ෆාතිමා මුස්ලිම් බාලිකා විදුහල | සිංහල - 66<br>දෙමළ - 99 | 14<br>21 | -<br>- | 14<br>21 | -<br>- | එම |
| 10. | වෛශාක්‍ය බාලිකා විද්‍යාලය | 03 | 37 | - | 37 | 1. කොට්ඨාශ කාර්යාලයට දැන්වීම.<br>2. කලාප කාර්යාලයට දැන්වීම<br>3. අවට පාසල්වල අතිරික්ත ළමුන් බඳවා ගැනීම. | එම. |
| 11. | ශාන්ත මැතිව් විද්‍යාලය | 1 A - 33<br>1 B - 33 | නැත | නැත | නැත | - | එම |
| 12. | ශාන්ත ක්ලෙයාර් බාලිකා විද්‍යාලය | 1A – 23<br>1B – 23<br>1C – 23<br>1T – 35 | 1A – 10<br>1B – 10<br>1C – 10<br>1T – 00 | - | 1A – 17<br>1B – 17<br>1C – 17<br>1T – 05 | කලාප කාර්යාලයට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම මගින්. | |
| 13. | ශාන්ත සෙබස්තියන් සිංහල විද්‍යාලය | 75 | - | - | 05 | - | එම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14. | ශ්‍රී සද්ධර්මෝදය මහා විද්‍යාලය | 06 | 27 | - | 34 | අවට පිහිටා ඇති පෙරපාසල්වලට ගොස් පාලකවරුන්ගෙන් සිසුන් ඉල්ලීම.<br>බැනරයක් ප්‍රදර්ශනය කර අයදුම්පත් කැඳවීමට මග පෙන්වීම. ගෙවල්වලට ගොස් දෙමව්පියන් දැනුවත් කිරීම. | එම |
| 15. | ශ්‍රී සංඝරාජ මධ්‍ය විද්‍යාලය | 23 | 10 | - | 17 | සමාන්තර ශ්‍රේණි එකක් පමණී ඇත්තේ | එම |
| 16. | හම්සා විදුහල (දෙමළ මාධ්‍ය) | 1A - 27<br>1B - 28 | 06<br>05 | - | 13<br>12 | - | එම |
| 17. | ශාන්ත ජෝශප් බාලිකා විදුහල | 1A - 33<br>1B - 33<br>1C - 32 | - | 04<br>04<br>04 | 03<br>03<br>03 | කලාපයෙන් බාර ගැනීම | එම |
| 18. | විද්‍යාතිලක විද්‍යාලය | 03 | 30 | නැත | 37 | කොට්ටාශ කාර්යාලයෙන්/ කලාප කාර්යාලයෙන් ලැබෙන යොමු කිරීම හා දෙමව්පියන්ගෙන් ලැබෙන ඍජු යොමු කිරීම. | එම |
| 19. | ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලය | 1A - 17<br>1B - 22 | 16<br>11 | -<br>- | 23<br>18 | කලාප අධ්‍යාපන කාර්යාලය හරහා එවන ළමයි | එම |
| 20. | ශ්‍රී රාසික් ෆරීඩ් මුස්ලිම් විද්‍යාලය | 1A - 33<br>1B - 33<br>1C - 32 | -<br>-<br>01 | 01<br>-<br>01 | 06<br>07<br>06 | වෙනත් පාසල්වලට දැනුම් දී තිබේ.<br>උදෑසන රැස්වීමට දැනුම් දී තිබේ. | එම |
| 21. | ආචාර්ය බදියුදීන් මහමද් විද්‍යාලය | දෙමළ - 40<br>සිංහල - 40 | - | - | - | අදාළ නැත. | එම |
| 22. | ශාන්ත මරියා මහා විද්‍යාලය | 06 | 27 | - | 34 | - | එම |
| 23. | කුමාර විද්‍යාලය | 34 | - | 06 | - | - | එම |
| 24. | රාමක්‍රිෂ්ණා විද්‍යාලය | 28 | 05 | - | 12 | - | එම |
| 25. | ශාන්ත සෙබස්තියන් දෙමළ මහා විද්‍යාලය | 30 | 03 | - | 10 | - | එම |
| 26. | සියලු සාන්තුවරුන්ගේ විද්‍යාලය | 1A - 33<br>1B - 33 | - | 01 | 06<br>07 | - | එම |
| 27. | රෝමානු කතෝලික බාලිකා විද්‍යාලය | 29 | 04 | - | 11 | කලාපයෙන් එවන ළමුන් | එම |
| 28. | අගමැති විද්‍යාලය | 25 | 8 | නැත | 15 | කොට්ඨාශය හා කලාප කාර්යාලය මගින් | එම |
| 29. | හෝලි රොසරි රෝමානු කතෝලික සිංහල විදුහල | 11 | 22 | - | 29 | - | එම |
| 30. | යසෝදරා විද්‍යාලය | ඕලු - 32<br>කුමුදු - 32<br>මානෙල් - 32<br>නෙළුම් - 32 | 01<br>01<br>01<br>01 | 07<br>07<br>07<br>07 | 01<br>01<br>01<br>01 | පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙළට පුරප්පාඩු පුරවනු ලැබේ. | එම |
| 31. | ශාන්ත මරියා බාලිකා මහා විද්‍යාලය | 19<br>19 | 14<br>14 | - | 21<br>21 | කලාප පළාත් අනුමැතිය අනුව | එම |
| 32. | ශාන්ත මයිකල් විද්‍යාලය | 06 | 27 | - | 34 | - | එම |
| 33. | මහින්ද විද්‍යාලය | 1A - 26<br>1B - 24<br>1C - 17 | 1A - 07<br>1B - 09<br>1C - 16 | තවම ලැබී නොමැත. | 1A - 14<br>1B - 16<br>1C – 23 | පුරප්පාඩු පිළිබඳ දැනුම් දී ඇත. | එම |
| 34. | ආවේ මරියා විද්‍යාලය | 1A - 30<br>1B - 30 | 03<br>03 | නැත<br>නැත | 10<br>10 | සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් ඇතුළත් කර ගනු ලැබේ. | එම |
| 35. | මිහිඳු සිංහල මහා විදුහල | 23 | 10 | - | 17 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | එම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 36. | ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලය, කොළඹ 09. | 1A - 30<br>1B - 30 | 03<br>03 | -<br>- | 10<br>10 | -<br>- | එම |
| 37. | ශ්‍රී සංඝමිත්තා බාලිකා විද්‍යාලය | 1-1 – 31<br>1-2 – 31<br>1-3 - 31<br>1-4 - 31<br>1-5 - 31<br>1-6 - 31<br>1-7 - 31 | 02<br>02<br>02<br>02<br>02<br>02<br>02 | 07<br>07<br>07<br>07<br>07<br>07<br>07 | 02<br>02<br>02<br>02<br>02<br>02<br>02 | - | එම |
| 38. | ශාන්ත මරියා සිංහල මිශ්‍ර විද්‍යාලය, කොළඹ 03. | 15 | 18 | නැත | 25 | කලාප කාර්යාලයේ අනුමැතිය සහිතව එවන සිසුන් | එම |
| 39. | සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහා විද්‍යාලය | මෙත්තා - 24<br>කරුණා - 32<br>මුදිතා - 34 | -<br>02<br>- | 04<br>04<br>03 | 02<br>03<br>03 | බස්නාහිර පළාත් අධ්‍යක්ෂ මගින් | එම |
| 40. | කණපති හින්දු බාලිකා මහා විදුහල | 1 A - 35<br>1 B – 35 | -<br>- | -<br>- | 1 A - 05<br>1 B - 05 | - | එම |
| 41. | ශාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය | 33<br>33 | -<br>- | -<br>- | 07<br>07 | නාම ලේඛනයක් කාර්යාලයට දී ඇත | එම |
| 42. | කැත්‍රිඩල් පිරිමි විද්‍යාලය | 1 A - 29<br>1 B - 27 | 1 A – 04<br>1 B – 06 | නැත.<br>නැත. | 1 A - 11<br>1 B - 13 | කලාප කාර්යාලයට දැනුම් දීම මගින් | එම |
| 43. | කොටහේන සිංහල කනිෂ්ට විද්‍යාලය | 1A - 31<br>1B - 31<br>1C - 30<br>1D - 30 | 02<br>02<br>03<br>03 | - | 09<br>09<br>10<br>10 | කලාප කාර්යාලය මගින් | එම |
| 44. | ඒ.ඊ. ගුණසිංහ විද්‍යාලය | 15 | 18 | - | 25 | අවට පාසල් නොලැබුණු දරුවන්ගෙන් | එම |
| 45. | බාරොන් ජයතිලක විද්‍යාලය | 35 | - | - | 05 | කලාප හෝ පළාත් කාර්යාල අනුමත කර එවන ලිපිවලට අනුව ඇතුළත් කර ගනු ලැබේ. | එම |
| 46. | ලින්ඩ්සේ බාලිකා විද්‍යාලය | 1A - 20<br>1B - 19<br>1C - 20 | 13<br>14<br>13 | 05<br>05<br>06 | 18<br>19<br>19 | දෙවන පොරොත්තු ලේඛනය හා පාසලට අයදුම්පත් එවූ ළමුන් ලේඛනය අනුමැතිය සඳහා කලාප කාර්යාලයට එවා ඇත. | එම |
| 47. | මහවත්ත ශාන්ත අන්තෝනි සිංහල විදුහල | 24<br>27 | -<br>- | නැත<br>නැත | 06<br>13 | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ අනුමැතියට යටත්ව | එම |
| 48. | ඇරතියුසා විද්‍යාලය | 16 | 17 | - | 24 | ඉදිරිපත් වන දරුවන් ඇතුළත් කරමි. | එම |
| 49. | ශාන්ත අන්තෝනි බාලිකා ප්‍රාථමික විදුහල | 99 | - | - | 21 | - | එම |
| 50. | ශාන්ත ලුසියා විද්‍යාලය | 23 | 10 | - | 17 | කලාප කාර්යාලයෙන් එවන සිසුන් මගින් | එම |
| 51. | ශාන්ත අන්තෝනි පිරිමි විදුහල | 1A - 28<br>1B - 30<br>1C - 27 | 05<br>03<br>06 | -<br>-<br>- | 12<br>10<br>13 | - | එම |
| 52. | රත්නාවලී බාලිකා විදුහල | 1A - 26<br>1B - 25<br>1C - 26 | 07<br>08<br>07 | - | 14<br>15<br>14 | - | එම |
| 53. | අල් අමීන් විදුහල | 06<br>- | 27<br>33 | -<br>- | 34<br>40 | - | එම |
| 54. | අල් හිජ්රා මුස්ලිම් විදුහල | 25<br>25 | 08<br>08 | -<br>- | 15<br>15 | - | එම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 55. | දකුණු කොළඹ හින්දු මහා විදුහල | 1A - 32<br>1B - 32 | 01<br>01 | -<br>- | 08<br>08 | - | එම |
| 56. | ශ්‍රී මේධානන්ද විදුහල | 13 | 20 | - | 07 | - | එම |
| 57. | වුල්වන්ඩාල් බාලිකා මහා විදුහල | 1A - 40<br>1B - 40<br>1T - - | -<br>-<br>- | 01<br>-<br>- | -<br>-<br>- | -<br>-<br>- | එම |
| 58. | ජයන්ති විදුහල | 1A - 19<br>1B - 18 | 14<br>15 | -<br>- | 21<br>22 | ඇතුළත් වීමට පැමිණෙන සියලු ළමුන් භාරගනු ලැබේ. | එම |
| 59. | මෝදර ආනන්ද ප්‍රාථමික විදුහල | 1A - 28<br>1B - 30<br>1C - 27 | 05<br>04<br>05 | -<br>-<br>- | 12<br>11<br>12 | - | එම |
| 60. | මහාමාත්‍ය විද්‍යාලය | 1A - 46 | - | - | - | පන්ති කාමර ඉඩ පහසුකම් ඇත. එහෙත් ගුරුභවතෙකුගේ පුරප්පාඩුවක් පවතී. එය සම්පූර්ණ වුවහොත් තවත් පන්තියක් ආරම්භ කළ හැක. | එම |

## ශ්‍රී ජයවර්ධනපුර කලාපය

| අනු අංකය | පාසල | සමාන්තර පන්ති සංඛ්‍යාව | අවසාන ලේඛනයේ ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | පොරොත්තු ලේඛනයෙන් ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | ක්‍රියාන්විතය සහා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව | ක්‍රියාන්විත රාජකාරීවලින් පැමිණ ඇති සංඛ්‍යාව **(රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අත්සනින් යුතු ලිපිවලින් පමණක්)** | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සනින් තොරව වෙනත් ලිපිවලින් ඇතුළත් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | ඇතුළත් කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | **40** සීමාව තුළ පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය | 04 | 138 | 03 | 28 | 06 | - | 147 | 13 |
| | බප/ජය/විද්‍යාකර බා.වි. (නීලම්මහර) | 03 | 60 | 30 | 21 | 01 | - | 91 | 29 |
| 02 | බප/ජය/කොට්ටාව ධර්මපාල වි | 09 | 264 | 33 | 63 | 0126 | - | 323 | 37 |
| 03 | බප/ජය/මහරගම ජනාධිපති වි. | 04 | 107 | 25 | 28 | 11 | - | 143 | 17 |
| | බප/ජය/ ජනාධිපති ආදර්ශ ප්‍රා.වි. | 02 | 48 | 07 | 14 | - | - | 55 | 25 |
| 04 | බප/ජය/කොට්ටාව ආනන්ද වි | 04 | 91 | 17 | 28 | 05 | 24 | 137 | 23 |
| 05 | බප/ජය/මාදිවෙල ශ්‍රී රාහුල වි | 01 | 12 | - | 07 | - | - | 12 | 28 |
| 06 | බප/ජය/උඩහමුල්ල ශ්‍රී රාහුල වි | 01 | 28 | - | 07 | - | - | 28 | 12 |
| 07 | බප/ජය/කොට්ටාව විද්‍යාදාන වි. | 02 | 70 | - | 14 | - | 10 | 80 | - |
| 08 | බප/ජය/රුක්මලේ මහා වි. | 01 | 33 | - | 07 | - | 05 | 38 | 02 |
| 09 | බප/ජය/මහරගම බෞද්ධ වි | 01 | 24 | - | 07 | - | 02 | 26 | 14 |
| 10 | බප/ජය/දෙපානම ධර්මපාල වි. | 01 | 16 | - | 07 | - | - | 16 | 24 |
| 11 | බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල වි. | 04 | 125 | 07 | 28 | 02 | - | 134 | 26 |
| 12 | බප/ජය/පමුණුව ක.වි. | 01 | 01 | - | 07 | - | - | 01 | 39 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | බප/ජය/ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වි | 03 | 62 | 48 | 21 | - | 10 | 120 | - |
| 14 | බප/ජය/තලවතුගොඩ අග්‍රාමාත්‍ය වි. | 02 | 64 | - | 14 | - | 03 | 67 | 13 |
| 15 | බප/ජය/ස්ටැංලි තිලකරත්න වි. | 01 | 23 | - | 07 | - | - | 23 | 17 |
| 16 | බප/ජය/මාලපල්ල විජයසෝම වි. | 02 | 60 | 06 | 14 | 01 | - | 67 | 13 |
| 17 | බප/ජය/ධර්මාශෝක ක.වි | 04 | 84 | 43 | 28 | 01 | - | 128 | 32 |
| 18 | බප/ජය/බුවනෙකබා ප්‍රා.වි. | 03 | 53 | 12 | 21 | - | 39 | 104 | 16 |
| 19. | බප/ජය/ ආනන්ද බාලිකා වි. | 04 | 99 | 19 | 28 | 03 | - | 121 | 39 |
| 20. | බප/ජය/ සමුද්‍රදේවී බාලිකා වි. | 05 | 106 | 32 | 35 | 30 | - | 168 | 32 |
| 21. | බප/ජය/ජයවර්ධනපුර මහා වි. | 04 | 90 | - | 28 | - | 26 | 116 | 44 |
| 22. | බප/ජය/ ජයවර්ධනපුර බාලිකා වි. | 04 | 83 | 26 | 28 | - | 38 | 147 | 13 |
| 23. | බප/ජය/නාවල ජනාධිපති බාලිකා වි. | 06 | 182 | 15 | 42 | 05 | 01 | 203 | 37 |
| 24. | බප/ජය/ජනාධිපති ප්‍රාථමික වි. | 03 | 59 | 12 | 21 | 01 | 22 | 94 | 26 |
| 25. | බප/ජය/ශාන්ත තෝමස් වි | 03 | 55 | 20 | 21 | - | 25 | 100 | 20 |
| 26. | බප/ජය/උඩහමුල්ල විජේරාම වි | 01 | 18 | - | 07 | - | - | 18 | 22 |
| 27. | බප/ජය/රේවත රාජකීය වි. | 01 | 22 | - | 07 | - | - | 22 | 18 |
| 28. | බප/ජය/සිරිපැරකුම්බා වි. | 01 | 12 | - | 07 | - | - | 12 | 28 |
| 29. | බප/ජය/ශ්‍රී සෝභිත වි. | 01 | 15 | - | 07 | - | - | 15 | 25 |
| 30. | බප/ජය/රාජගිරිය දෙමළ වි. | 01 | 10 | - | 07 | - | - | 10 | 30 |
| 31. | බප/ජය/ජයවර්ධනපුර හින්දු වි. | 01 | 17 | - | 07 | - | - | 17 | 23 |
| 32. | බප/ජය/සිරිහද වි..(හේවාවිතාරණ ප්‍රා.වි) | 02 | 80 | - | 14 | - | - | 80 | - |
| 33. | බප/ජය/මාලඹේ ශ්‍රී රාහුල බාලිකා වි. | 04 | 120 | 12 | 28 | 15 | - | 147 | 13 |
| 34. | බප/ජය/මාලඹේ ආදර්ශ පිරිමි වි. | 04 | 117 | 15 | 28 | 12 | - | 144 | 16 |
| 35. | බප/ජය/කහන්තොට ප්‍රා.වි.<br>(ආදර්ශ වි. ප්‍රාථමිකය) | 02 | 58 | 08 | 14 | 01 | | 67 | 13 |
| 36. | බප/ජය/මුනිදාස කුමාරතුංග වි | 03 | 90 | 09 | 21 | 04 | - | 103 | 17 |
| 37. | බප/ජය/ඉහළ බෝමිරිය ක.වි. | 04 | 132 | 28 | 28 | - | - | 160 | - |
| 38. | බප/ජය/ශ්‍රී යශෝධරා මහා වි. | 02 | 51 | 06 | 14 | - | 10 | 67 | 13 |
| 39. | බප/ජය/ලංකාසභා ක.වි. | 04 | 100 | 13 | 28 | - | 04 | 130 | 30 |
| 40. | බප/ජය/ශ්‍රී සුබෝධි ක.වි. | 02 | 53 | 07 | 14 | - | - | 66 | 14 |
| 41. | බප/ජය/කොතලාවල ප්‍රා.වි. | 03 | 80 | 17 | 21 | - | 31 | 118 | 02 |
| 42. | බප/ජය/කොරතොට<br>සෝමානන්ද වි. | 02 | 43 | - | 14 | - | 10 | 70 | 10 |
| 43 | බප/ජය/තලංගම විද්‍යාවර්ධන වි. | 01 | 26 | 21 | 14 | - | - | 26 | 14 |
| 44. | බප/ජය/එම්.එච්.ඩී. ජයවර්ධන ප්‍රා.වි. | 02 | 38 | - | 14 | - | 21 | 80 | - |
| 45. | බප/ජය/තලාහේන ම.වි. | 01 | 18 | - | 07 | - | - | 18 | 22 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 46. | බප/ජය/දේවමිත්ත ම.වි. | 01 | 30 | - | 07 | - | - | 30 | 10 |
| 47. | බප/ජය/වැලිවිට ශාන්ත මරියා වි. | 01 | 24 | - | 07 | - | - | 24 | 16 |
| 48. | බප/ජය/ශ්‍රී ඉන්ද්‍රෙජාති වි. | 02 | 50 | - | 14 | - | - | 50 | 30 |
| 49 | බප/ජය/යාකාල ශ්‍රී සීලාලංකාර වි. | 02 | 56 | - | 14 | - | 09 | 65 | 15 |
| 50. | බප/ජය/දැඩිගමුව ක.වි. | 02 | 52 | - | 14 | - | - | 52 | 28 |
| 51. | බප/ජය/ඔරුවල ක.වි. | 04 | 103 | 28 | 28 | 01 | 38 | 160 | - |
| 52 | බප/ජය/හේවාගම ක.වි. | 01 | 16 | - | 07 | - | - | 16 | 24 |
| 53. | බප/ජය/බටපොත සුදර්ශන වි. | 01 | 26 | - | 07 | - | 04 | 30 | 10 |
| 54. | බප/ජය/රත්න ක.වි. | 01 | 33 | - | 07 | - | - | 33 | 07 |
| 55. | බප/ජය/ඇවරිවත්ත විද්‍යාලෝක වි. | 01 | 11 | - | 07 | - | - | 11 | 29 |
| 56. | බප/ජය/කලපලුවාව සිද්ධාර්ථ වි. | 01 | 20 | - | 07 | 01 | - | - | - |
| 57. | බප/ජය/ගුණසේකර ක.වි. | 04 | 116 | 20 | 28 | - | - | 20 | 20 |
| 58. | බප/ජය/රණාල ක.වි. | 03 | 94 | 07 | 21 | - | 23 | 160 | - |
| 59. | බප/ජය/පෝරේ ක.වි. | 02 | 73 | - | 14 | - | - | 73 | 07 |
| 60. | බප/ජය/ නවගමුව සිරි සුමනතිස්ස ප්‍රා.වි. | 03 | 100 | - | 21 | - | 20 | 120 | - |
| 61. | බප/ජය/විද්‍යාරාජ වි. | 02 | 49 | 05 | 14 | - | 11 | 65 | 15 |
| 62. | බප/ජය/ශ්‍රී රාහුල ම.වි. - මුල්ලේරියාව | 04 | 132 | - | 28 | 01 | 27 | 160 | 29 |
| 63. | බප/ජය/අඹතලේ සමුද්‍රෙද්වි බාලිකා වි. | 02 | 51 | - | 14 | - | - | 51 | - |
| 64. | බප/ජය/ගොතටුව මහා වි. | 03 | 82 | - | 21 | - | 10 | 92 | 28 |
| 65. | බප/ජය/ටෙරන්ස් එස් ද සිල්වා වි. | 02 | 45 | - | 14 | - | 01 | 46 | 34 |
| 66. | බප/ජය/කුඩාබත්ගමුව ධර්මපාල වි. | 03 | 96 | - | 21 | - | 12 | 108 | 12 |
| 67. | බප/ජය/කොටුවිල ගාමිණී වි. | 02 | 55 | - | 14 | - | - | 55 | 25 |
| 68. | බප/ජය/සාන්ත ජෝසප් වි. | 01 | 29 | - | 07 | | 01 | 30 | 10 |
| 69. | බප/ජය/මීතොටමුල්ල ශ්‍රී රාහුල වි. | 01 | 17 | - | 07 | - | - | 17 | 23 |
| 70. | බප/ජය/විද්‍යාවර්ධන ප්‍රා.වි. - වැල්ලම්පිටිය | 04 | 138 | - | 28 | - | 02 | 140 | 20 |
| 71. | බප/ජය/වේරගොඩ ක.වි | 01 | 20 | - | 07 | - | - | 20 | 20 |
| 72. | බප/ජය/අඹතලේ ටිකිර කුමාර වි. | 03 | 91 | - | 21 | - | 02 | 93 | 27 |
| 73. | බප/ජය/කුඩාබුත්ගමුව සෝමාදේවි වි. | 02 | 38 | 17 | 14 | - | 25 | 80 | - |
| 74. | බප/ජය/එදිරිවීර සත්වන්ද්‍ර වි. | 03 | 84 | - | 21 | 01 | 29 | 114 | 06 |
| 75. | බප/ජය/කොටිකාවත්ත රෝමානු කතෝලික වි. | 01 | 33 | - | 07 | - | - | 33 | 07 |
| 76. | බප/ජය/ටිබෙට් එස් මහින්ද වි. | 02 | 58 | - | 14 | - | - | 58 | 22 |

## හෝමාගම කලාපය

| අනු අංකය | පාසල | සමාන්තර පංති සංඛ්‍යාව | අවසාන ලේඛනයෙන් ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | පොරොත්තු ලේඛනයෙන් ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | ක්‍රියාන්විතය සඳහා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව | ක්‍රියාන්විත රාජකාරීවලින් පැමිණ ඇති සංඛ්‍යාව (රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අත්සනින් යුතු ලිපිවලින් පමණක්) | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් තොරව වෙනත් ලිපිවලින් ඇතුළත් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | ඇතුළත් කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | **40** සීමාව තුළ පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | බප/හෝ/ශාන්ත ජෝන් බොස්කො මි.වි., හංවැල්ල | 3 | 72 | 18 | 21 | 03 | - | 102 | 18 |
| 2. | බප/හෝ/හෝමාගම ම.වි. හෝමාගම | 7 | 192 | 39 | 49 | 14 | - | 245 | 35 |
| 3. | බප/හෝ/මායාදුන්න ම.වි., හංවැල්ල | 4 | 116 | 16 | 28 | 10 | - | 142 | 18 |
| 4. | බප/හෝ/සිරිපියරතන ක.වි., පාදුක්ක | 4 | 122 | 10 | 28 | 18 | - | 150 | 10 |
| 5. | බප/හෝ/සුභාරතී මහාමාත්‍ය වි., ගොඩගම, හෝමාගම | 4 | 132 | 11 | 28 | 28 | - | 160 | - |
| 6. | බප/හෝ/යුධ හමුදා විද්‍යාලය, පනාගොඩ, හෝමාගම | 5 | 132 | 36 | 35 | 12 | - | 177 | 23 |
| 7. | බප/හෝ/ජනාධිපති විද්‍යාලය, හෝමාගම | 4 | 99 | 15 | 28 | 12 | - | 126 | 34 |
| 8. | බප/හෝ/වෑතර ක.වි., පොල්ගස්ඕවිට | 4 | 96 | 36 | 28 | - | - | 132 | 28 |
| 9. | බප/හෝ/ජනාධිපති වි., අවිස්සාවේල්ල | 6 | 182 | 16 | 42 | 26 | - | 224 | 16 |
| 10. | බප/හෝ/අමරසිරි පද්මපෙරුව ක.වි. පාදුක්ක | 2 | 56 | 10 | 14 | - | - | 66 | 14 |
| 11. | බප/හෝ/රෝමාණු කතෝලික විදුලය, පහත්ගම | 4 | 132 | 09 | 28 | 05 | - | 137 | 23 |
| 12. | විජයවර්ධන ම.වි. | 4 | 160 | නැත | නැත | නැත | - | 160 | නැත |
| 13. | ජල්තර ම.වි. | 2 | 47 | නැත | - | නැත | - | 47 | 33 |
| 14. | පනාගොඩ ශ්‍රී පරාක්‍රම ම.වි. | 4 | 132 | 28 | 28 | - | - | 160 | නැත |
| 15. | මුල්ලේගම ම.වි. | 1 | 43 | නැත | - | නැත | - | 43 | නැත |
| 16. | ඔලබොඩුව සොයිසා ම.වි. | 1 | 17 | නැත | - | නැත | - | 17 | 23 |
| 17. | මත්තේගොඩ විද්‍යාදීප ම.වි. | 4 | 132 | 03 | - | නැත | - | 135 | 25 |
| 18. | මාගම්මන ම.වි. | 3 | 111 | 09 | - | නැත | - | 120 | නැත |
| 19. | සියඹලාගොඩ ධර්මපාල ක.වි. | 1 | 30 | නැත | - | නැත | - | 30 | 10 |
| 20. | පාලාගම සිරිපැරකුම් ක.වි. | 1 | 10 | නැත | - | නැත | - | 10 | 30 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 21. | කහතුඩුව ඩබ්ලිව් ඇන් පෙරේරා ක.වි. | 1 | 46 | නැත | - | නැත | - | 46 | නැත |
| 22. | අම්බලන්ගොඩ සිරිපති ක.වි. | 1 | 22 | නැත | - | නැත | - | 22 | 18 |
| 23. | කිරිවත්තුඩුව ජයතිලක ක.වි. | 1 | 30 | නැත | - | නැත | - | 30 | 10 |
| 24. | දියගම ක.වි. | 2 | 80 | නැත | - | නැත | - | 80 | නැත |
| 25. | මීඩගාඩ බෞද්ධ ක.වි. | 3 | 108 | 12 | නැත | නැත | - | 120 | නැත |
| 26. | වටරැක ක.වි. | 4 | 159 | නැත | - | - | - | 159 | 01 |
| 27. | පානලුව ක.වි. | 1 | 36 | නැත | - | නැත | - | 36 | 04 |
| 28. | බටවල ක.වි. | 1 | 16 | නැත | - | නැත | - | 16 | 24 |
| 29. | මීගොඩ ධර්මරාජ වි. | 3 | 95 | 25 | - | 02 | - | 120 | නැත |
| 30. | ලෙනගල ක.වි. | 2 | 75 | 05 | - | නැත | - | 80 | නැත |
| 31. | හබරකඩ ක.වි. | 2 | 66 | 14 | - | නැත | - | 80 | නැත |
| 32. | දොලහේන ක.වි. | 1 | 24 | නැත | - | නැත | - | 24 | 16 |
| 33. | මාවත්ගම ක.වි. | 1 | 15 | නැත | - | නැත | - | 15 | 25 |
| 34. | පිටිපන ක.වි. | 4 | 124 | නැත | - | නැත | - | 127 | 33 |
| 35. | නියදගම විද්‍යාකීර්ති ක.වි. | 3 | 108 | නැත | - | නැත | - | 108 | 12 |
| 36. | ආටිගල ක.වි. | 1 | 24 | නැත | - | නැත | - | 24 | 16 |
| 37. | සංඝාරාම මද්දුමබණ්ඩාර ක.වි. | 2 | 48 | නැත | - | නැත | - | 48 | නැත |
| 38. | දීපන්ගොඩ ක.වි. | 1 | 40 | නැත | - | නැත | - | 40 | නැත |
| 39. | ශාන්ත මරියා ම.වි. | 3 | 120 | - | - | පැමිණ නැත | - | 120 | නැත |
| 40. | පුවක්පිටිය උතුර ම.වි. | 3 | 86 | 12 | - | පැමිණ නැත | - | 98 | 22 |
| 41. | ඇස්වත්ත පණ්ඩුකාභය ම.වි. | 1 | 26 | නැත | - | නැත | - | 26 | 14 |
| 42. | අකරවිට ම.වි. | 1 | 37 | 03 | - | නැත | - | 37 | 03 |
| 43. | පඤ්ඤාගුල ම.වි. | 1 | 14 | නැත | - | නැත | - | 14 | 26 |
| 44. | කහහේන බොරළුගොඩ ම.වි. | 2 | 80 | නැත | - | නැත | - | 80 | නැත |
| 45. | ඉලුක්ඕවිට ක.වි. | 1 | 41 | නැත | - | නැත | - | 41 | නැත |
| 46. | වැලිකන්න රෝ. ක.ක.වි. | 1 | 28 | නැත | - | - | - | 28 | 12 |
| 47. | කළුඅග්ල සිද්ධාර්ථ ක.වි. | 1 | 16 | නැත | - | නැත | - | 16 | 24 |
| 48. | කඩුගොඩ ක.වි. | 1 | 28 | 12 | - | නැත | - | 28 | 12 |
| 49. | කොස්ගම සුමේධ ක.වි. | 3 | 121 | නැත | - | නැත | - | 121 | නැත |
| 50. | කනන්පැල්ල ක.වි. | 1 | 19 | නැත | - | නැත | - | 19 | 21 |
| 51. | අලුත් අම්බලම ආදර්ශ ක.වි. | 3 | 107 | 07 | - | නැත | - | 114 | 06 |
| 52. | මානකඩ ක.වි. | 1 | 04 | නැත | - | නැත | - | 04 | 36 |
| 53. | ඇස්වත්ත දකුණ ක.වි. | 1 | 19 | නැත | - | නැත | - | 19 | 21 |
| 54. | පුවක්පිටිය දකුණ ක.වි. | 1 | 21 | නැත | - | නැත | - | 21 | 19 |
| 55. | පුවක්පිටිය රෝ.ක.ක.වි. | 1 | 37 | නැත | - | නැත | - | 37 | 03 |
| 56. | බොල්ලතාව ක.වි. | 1 | 22 | නැත | - | නැත | - | 22 | 18 |
| 57. | ලහිරුගම බෞද්ධ ක.වි. | 1 | 07 | නැත | - | නැත | - | 07 | 33 |
| 58. | පුවක්පිටිය සී.සී. දෙමළ වි. | 3 | 105 | 06 | - | නැත | - | 111 | 09 |
| 59. | ශාලාවවත්ත දෙමළ වි. | 1 | 04 | නැත | - | නැත | - | 04 | 36 |
| 60. | සිරිනිවාස වත්ත දෙමළ වි. | 1 | 07 | නැත | - | නැත | - | 07 | 33 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 61. | වගවත්ත දෙමළ වි. | 1 | 09 | නැත | - | නැත | - | 09 | 31 |
| 62. | සිරිසුමනජෝති ම.වි. | 2 | 63 | නැත | - | නැත | - | 63 | 17 |
| 63. | පහළ හංවැල්ල ක.වි. | 1 | 10 | නැත | - | නැත | - | 10 | 30 |
| 64. | නිරිපොළ රෝ.ක.ක.වි. | 1 | 07 | නැත | - | නැත | - | 07 | 33 |
| 65. | දිද්දෙණිය ක.වි. | 1 | 40 | නැත | - | නැත | - | 40 | නැත |
| 66. | මාවතගම ආදර්ශ ක.වි. | 1 | 28 | නැත | - | නැත | - | 28 | 12 |
| 67. | හංවැල්ල මලියදේව ක.වි. | 1 | 38 | නැත | - | නැත | - | 38 | 02 |
| 68. | වග ශ්‍රී රතනසාර ම.වි. | 1 | 34 | නැත | - | නැත | - | 34 | 06 |
| 69. | මලගල ම.වි. | 1 | 34 | නැත | - | නැත | - | 34 | 06 |
| 70. | දඹෝර ක.වි. | 1 | 17 | නැත | - | නැත | - | 17 | 23 |
| 71. | අංගම්පිටිය ක.වි. | 1 | 32 | නැත | - | නැත | - | 32 | 08 |
| 72. | උඩගම ක.වි. | 1 | 11 | නැත | - | නැත | - | 11 | 29 |
| 73. | වේරගල ශ්‍රී ඥානවිමල ක.වි. | 1 | 42 | 05 | - | නැත | - | 42 | නැත |
| 74. | අංගමුව ක.වි. | 1 | 11 | නැත | - | නැත | - | 11 | 29 |
| 75. | එම්.ඩී.එච්. ජයවර්ධන ක.වි. | 1 | 74 | නැත | - | නැත | - | 74 | 06 |
| 76. | ගලගෙදර ක.වි. | 1 | 33 | නැත | - | නැත | - | 33 | 07 |
| 77. | ගලගෙදර මුස්ලිම් වි. | 1 | 25 | නැත | - | නැත | - | 25 | 15 |
| 78. | කෙළිමඩල ක.වි. | 2 | 78 | නැත | - | නැත | - | 78 | 02 |
| 79. | බොරළුවතැන්න ක.වි. | 1 | 02 | නැත | - | නැත | - | 02 | 38 |
| 80. | පිටුම්පේ ක.වි. | 2 | 66 | නැත | - | නැත | - | 66 | 14 |
| 81. | පාදුක්ක දෙමළ වි. | 1 | 03 | නැත | - | නැත | - | 03 | 37 |
| 82. | මාදොළුවාව ම.වි. | 2 | 60 | නැත | - | නැත | - | 60 | 20 |
| 83. | දාම්පෙ ක.වි. | 1 | 32 | නැත | - | නැත | - | 32 | 08 |
| 84. | ලියන්වල ආනන්ද සමරකෝන් ක.වි. | 2 | 76 | නැත | - | නැත | - | 76 | 04 |
| 85. | බෝපේ රාජසිංහ ප්‍රාථමික වි. | 3 | 82 | 35 | - | 03 | - | 120 | නැත |

## පිළියන්දල කලාපය

| අනු අංකය | පාසල | සමාන්තර පංති සංඛ්‍යාව | අධ්‍යයන ලේඛනයෙන් ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | පොරොත්තු ලේඛනයෙන් ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | ක්‍රියාන්විතය සඳහා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව | ක්‍රියාන්විත රාජකාරිවලින් පැමිණ ඇති සංඛ්‍යාව (රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අත්සනින් යුතු ලියුවලින් පමණක්) | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් තොරව වෙනත් ලියුවලින් ඇතුළත් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | ඇතුළත් කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | **40** සීමාව තුළ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | බප/පිළි/ සෝමවීර චන්ද්‍රසිරි වි. | 08 | 212 | 26 | 56 | 04 | - | 242 | 78 |
| 2. | බප/පිළි/ දකුණු කොළඹ විද්‍යා වි. | 03 | 93 | 06 | 21 | 19 | - | 101 | 19 |
| 3. | බප/පිළි/ ශාන්ත ජෝශප් බා.වි. | 03 | 84 | 158 | 21 | 19 | - | 118 | 02 |
| 4. | බප/පිළි/ අංක 01 කණිෂ්ට වි. | 07 | 185 | 25 | 56 | 10 | - | 220 | 60 |
| 5. | බප/පිළි/ ශ්‍රීමත් ජෝන් කොතලාවල | 05 | 111 | - | - | - | - | - | - |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකාබද්ධ | | | | | | | | |
| 6. | බප/පිළි/ බටකැත්ත සුමනසාර වි. | - | - | 54 | 35 | - | - | 165 | 35 |
| 7. | බප/පිළි/ ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය | 02 | 64 | 02 | 14 | 03 | - | 69 | 11 |
| 8. | බප/පිළි/ රාවතාවත්ත මැතෝදිස්ත වි. | 03 | 39 | 59 | 21 | 01 | - | 99 | 21 |
| 9. | බප/පිළි/ බෞද්ධ බාලිකා වි. | 04 | 78 | 47 | 28 | - | - | 125 | 35 |
| 10. | බප/පිළි/ දෙහිවල රාජකීය ප්‍රාථමික විද්‍යාලය | 02 | 44 | 22 | 14 | - | - | 66 | 29 |
| 11. | බප/පිළි/ ශාන්ත ජෝන් විද්‍යාලය | 06 | 173 | 25 | 42 | 13 | - | 211 | 29 |
| 12. | බප/පිළි/ ධර්මසේන ආටිගල බා.වි. | 05 | 131 | 34 | 35 | 02 | - | 167 | 33 |
| 13. | බප/පිළි/ ලලිත් ඇතුලත්මුදලි වි. | 03 | 49 | 26 | 21 | - | - | 75 | 45 |
| 14. | බප/පිළි/ උසස් බාලිකා වි. | 04 | 117 | 15 | 28 | 01 | - | 133 | 27 |
| 15. | බප/පිළි/ මොරටු මහා විද්‍යාලය | 04 | 49 | 26 | 21 | - | - | 132 | 28 |
| 16. | බප/පිළි/ සාන්ත සෙබස්තියන් බා.වි. | 02 | 52 | 14 | 14 | - | - | 66 | 14 |
| 17. | බප/පිළි/ මාම්පේ ක.වි. | 03 | 74 | 25 | 21 | - | - | 99 | 21 |
| | | | | | | | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සනින් නිකුත් කළ ලිපි | | |
| 18. | බප/පිළි/ කළුබෝවිල බුද්ධඝෝෂ ක.වි. | 01 | 20 | - | 07 | - | 02 | 22 | 18 |
| 19. | බප/පිළි/ ශාස්ත්‍රානන්ද විද්‍යාලය, කරගම්පිටිය | 02 | 32 | - | 14 | - | 03 | 35 | 45 |
| 20. | බප/පිළි/ කඳවල නවෝද්‍යා මහ විද්‍යාලය | 02 | 55 | - | 14 | - | 05 | 60 | 20 |
| 21. | බප/පිළි/ සුබෝධ බාලිකා විද්‍යාලය, දෙහිවල | 01 | 14 | - | 07 | - | 01 | 15 | 25 |
| 22. | බප/පිළි/ ශ්‍රී පුණ්‍යකාම විද්‍යාලය, ගල්කිස්ස | 01 | 07 | - | 07 | - | - | 07 | 33 |
| 23. | බප/පිළි/ දෙහිවල මොතෝදිස්ත විද්‍යාලය | 01 | 04 | - | 07 | - | 01 | 05 | 35 |
| 24. | බප/පිළි/ ශාන්ත මරියා විද්‍යාලය, දෙහිවල | 01 | 20 | - | 07 | - | 15 | 35 | 05 |
| 25. | බප/පිළි/ කරගම්පිටිය විජය විද්‍යාලය | 01 | 09 | - | 07 | - | - | 09 | 31 |
| 26. | බප/පිළි/ පාමංකඩ ශ්‍රී සංඝමිත්තා විද්‍යාලය | 01 | 03 | - | 07 | - | - | 03 | 33 |
| 27. | බප/පිළි/ ශ්‍රී ධර්මාරාම ම.වි. | 01 | 09 | - | 07 | - | 04 | 13 | 23 |
| 28. | බප/පිළි/ රත්මලාන රෝමානු කතෝලික වි. | 01 | 30 | - | 07 | - | - | 30 | 10 |
| 29. | බප/පිළි/ ශ්‍රී අත්තදස්සී විද්‍යාලය, රත්මලාන | 01 | 21 | - | 07 | - | - | 21 | 19 |
| 30. | බප/පිළි/ ගලිකිස්ස ශාන්ත අන්තෝනි වි. | 01 | 23 | - | 07 | - | 05 | 28 | 12 |
| 31. | බප/පිළි/ ශ්‍රී ඥානේන්ද්‍ර විද්‍යාලය, රත්මලාන | 01 | 12 | - | 07 | - | - | 12 | 28 |

| 0707 | | | | | | | | | 0708 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 32. | බප/පිළි/ කවිදජ විද්‍යාලය | 01 | 29 | - | 07 | - | - | 29 | 11 |
| 33. | බප/පිළි/ අත්තිඩිය ආදර්ශ ප්‍රා.වි. | 02 | 66 | 14 | 14 | - | - | 80 | - |
| 34. | බප/පිළි/ ධර්මෝදය වි. | 02 | 66 | 05 | 14 | - | - | 71 | 09 |
| 35. | බප/පිළි/ දෙහිවල දෙමළ විද්‍යාලය | 01 | 14 | - | 07 | - | - | 14 | 26 |
| 36. | බප/පිළි/ නුගේගොඩ දෙමළ විද්‍යාල | 01 | 14 | - | 07 | - | 04 | 18 | 22 |
| 37. | බප/පිළි/ මෙතෝදිස්ත උසස් වි. | 03 | 96 | - | 21 | - | 01 | 97 | 23 |
| 38. | බප/පිළි/ ලක්ෂපතිය ශික්ෂාදාන ම.වි. | 01 | 06 | - | 07 | - | - | 06 | 34 |
| 39. | බප/පිළි/ තෙලවල ශ්‍රී රාහුල ම.වි. | 01 | 36 | - | 07 | - | - | 36 | 04 |
| 40. | බප/පිළි/ විල්ලෝරාවත්ත ඥානිස්සර බෞද්ධ විද්‍යාලය | 01 | 13 | - | 07 | - | - | 13 | 27 |
| 41. | බප/පිළි/ ශ්‍රී සද්ධර්මෝදය විද්‍යාලය, කොරලවැල්ල | 01 | 03 | - | 07 | - | - | 03 | 37 |
| 42. | බප/පිළි/ ජනජය විද්‍යාලය | 01 | 24 | - | 07 | - | - | 24 | 16 |
| 43. | බප/පිළි/ කටුබැද්ද බෝධිරාජ විදුහල | 01 | 20 | - | 07 | - | - | 20 | 20 |
| 44. | බප/පිළි/ සුනන්දෝපනන්ද ප්‍රා.වි. | 01 | 35 | - | 07 | - | - | 35 | 05 |
| 45. | බප/පිළි/ කල්දෙමුල්ල සැලීනා විද්‍යාලය | 02 | 66 | - | 14 | - | 02 | 68 | 12 |
| 46. | බප/පිළි/ කඩලාන ශාන්ත අන්තෝනි වි. | 01 | 31 | - | 07 | - | - | 31 | 09 |
| 47. | බප/පිළි/ උයන ක.වි. | 01 | 25 | - | 07 | - | - | 35 | 15 |
| 48. | බප/පිළි/ ඇරැව්වල විද්‍යාලෝක ම.වි. | 03 | 97 | - | 21 | - | 10 | 107 | 13 |
| 49. | බප/පිළි/ බෝකුන්දර මහින්ද වි. | 01 | 33 | - | 07 | - | - | 33 | 07 |
| 50. | බප/පිළි/ වේරහැර කණිෂ්ට වි. | 01 | - | - | - | - | - | - | - |
| 51. | බප/පිළි/ සුනේත්‍රාදේවී බාලිකා වි. | 02 | 50 | - | 14 | - | 10 | 60 | 20 |
| 52. | බප/පිළි/ බටුවන්දර කණිෂ්ට වි. | 02 | 67 | - | 14 | - | - | 67 | 13 |
| 53. | බප/පිළි/ ආනන්ද සමරකෝන් වි. | 01 | 18 | - | 07 | - | - | 18 | 22 |
| 54. | බප/පිළි/ බොරලැස්ගමුව ආදර්ශ ප්‍රා.වි. | 02 | 62 | - | 14 | - | - | 62 | 18 |
| 55. | බප/පිළි/ නැගෙනහිර ඇරැව්වල ධර්මපාල ම.වි. | 04 | 99 | 38 | 21 | - | - | 137 | 23 |
| 56. | බප/පිළි/ මකුළුදූව නව ආදර්ශ වි. | 02 | 48 | - | 14 | - | 10 | 58 | 22 |
| 57. | බප/පිළි/ හැඩිගම ශ්‍රී සුදර්ශන ක.වි. | 01 | 17 | - | 07 | - | 11 | 38 | 02 |
| 58. | බප/පිළි/ දැල්තර කණිටු විදුහල | 01 | 30 | - | 07 | - | - | 30 | 10 |
| 59. | බප/පිළි/ මාකන්දන ශ්‍රී සුදර්ශන ම.වි. | 03 | 97 | - | 21 | - | 09 | 106 | 14 |

ඉ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(බ.ප.), පළාත් අධ්‍යාපන ලේකම් හා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් වන අභියාචනා අනුව කටයුතු කරනු ලැබේ.

ඊ. අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මේකේදී මට ඔබතුමා කියන එක පැහැදිලි නැහැ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට, කලාප අධ්‍යක්ෂවරුන්ට එන අභියාචනා හරහා මොකක්ද නිර්දේශයක් දෙනවා කියලා තමයි කියන්නේ. ඒක කොහොමද වෙන්නේ? ඒ කියන්නේ මෙතක් කල් වුණු ක්‍රමයටද? නැත්නම් වෙනස් ක්‍රමයකටද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතෙක් කල් වුණු ක්‍රමයට තමයි. ගරු මන්ත්‍රීතුමනි, මහජන දිනයේදී මට ඉදිරිපත් වන ඒවා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට ඉදිරිපත් වන ඒවා, මහජන නියෝජිතයන්ට ඉදිරිපත් වන ඒවා සැලකිල්ලට අර ගන්නවා. සමහර විදුහල්පතිවරු නිර්දේශ ඉදිරිපත් කරනවා. මොනවා හරි අඩුපාඩු නිසා අවට ළමයින්ව ඇතුළත් වෙලා නැහැ. ඒ අය ලබා ගැනීම සුදුසුයි කියලා සමහර පාසල්වලින් ලේඛන එවනවා. ඒ පිළිබඳව විරෝධතා නැත්නම් කිසිම ගැටළුවක් නැතිව අපි ඒ වාගේ ඒවා ඇතුළත් කරනවා. ඉතිරි ඒවාට අභියාචනා සලකා බලා - දැන් උදාහරණයකට ගරු සභාපතිතුමනි, පසුගිය දවසක ආවා. ඒ දරුවාගේ අත් දෙකම නැහැ. ඒ දෙමව්පියෝ ඉල්ලනවා, අයියා යන පාසලට ඒ දරුවා ඇතුළත් කරන්න. මොකද, බස් එකකටවත් නගගන්න බැහැයි කියලා. අන්න ඒ වාගේ ඒවාට අපි ප්‍රමුඛතාවයක් ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රධාන ලේකම් කාර්යාලයෙනුත්, ඒ වාගේම බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්නුත් මේ සම්බන්ධව පළාත් සභාවට නිර්දේශයක් එවලා තිබෙනවා. එතකොට ඒ නිර්දේශය ඇතුළේ තිබෙන්නේ, මෙතෙක් සම්මුඛ පරීක්ෂණවලින් තෝරා ගෙන ඉවර වෙලා ඉතිරි, පොරොත්තු ලේඛනවල ඉන්න අයව, ඒ ඒ ඝනයන්වලට සමාන්තරව ඉතිරි ළමුන් ටික ගන්නය කියලයි. එතකොට මෙන්න මේකත් එක්ක -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙන්න මේක පැහැදිලි කරන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තියක් අනුව මම හිතන්නේ, උසාවියෙන් ලැබුණු නියෝගයක් අනුව දරුවන් ඇතුළත් කර ගන්නා වූ ප්‍රමාණය හා සීමාව තිබෙනවා. එක එක Categories වල, පොරොත්තු ලේඛනවල තෝරා ගන්නා ප්‍රමාණය තිබෙනවා. එසේ තෝරා ගෙන ඇතුළත් කර ගැනීම් ඉවර වුණාට පස්සේ ගරු සභාපතිතුමනි, 42 සීමාවට ළමයි පස් දෙනෙක්. එක පන්තියකට ළමයි පස් දෙනෙක් නැත්නම් හතර දෙනෙක්. අභියාචනා දෙකක් දාලා. ක්‍රියාත්මකයේ පහක් ඉතිරි වෙනවා. ගරු මන්ත්‍රීතුමා, ක්‍රියාත්මකයේ දැම්මාට පස්සේ ළමයි එක්කෙනෙක් දෙන්නෙක් තමයි ඉන්නේ. අන්න ඒක තමයි අපි ගොඩක් වෙලාවට අභියාචනාවලින් පළ කරන්නේ. අපි 42 සීමාව යන්න කටයුතු කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මගේ මේ ප්‍රශ්නවල අහලා තිබෙනවා. පුරප්පාඩු ගණන කොපමණද කියලා. සාමාන්‍යයෙන් දළ වශයෙන් මේවායේ ප්‍රමාණය කියන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේකේ එක එක ඒවාට තිබෙනවා, පිටු ගොඩක්. ඉතින් මම එකින් එක ඕනෑ නම් කියන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. එහෙම නොවෙයි. ඔතැන එකතුවක් නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒක සම්පූර්ණ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් මේකයි. ඒක දැන ගන්න ඕනෑ, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. අපි දන්න විදියට ක්‍රියාත්මකයෙන් කියලා මහා විශාල ප්‍රමාණයක් එන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉතින් ඒ නිසා මහා විශාල ප්‍රමාණයක් පුරප්පාඩු හැටියට මේකේ තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, මේ ප්‍රශ්නය හරහා මට වුවමනාව තිබුණේ, ඔබතුමා ලවා ඉල්ලීමක් කරන්නේ, මේ පොරොත්තු ලේඛනයේ හිටපු ළමයින්ට විශාල අසාධාරණයක් වෙනවා. මොකද, ඒ අයව මේකේදී පැත්තකට වැටෙනවා. එක එක්කෙනාගේ නිර්දේශ දෙන්න ගියාට පස්සේ. අන්න ඒකට අසාධාරණයක් නොවී මේක ක්‍රියාත්මක කරන්නය කියන ඉල්ලීම තමයි අපි කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පැහැදිලිවම ගරු සභාපතිතුමනි, චක්‍රලේඛය අනුව ඒ සීමාව තුළ ඇති වන පුරප්පාඩුවට, ඒ අදාළ Category එක පුරවන්න කිසිම බාධාවක් නැහැ. එහෙම තිබුණු තැන්වලටත් උපදෙස් දුන්නා, ඒ බඳවා ගැනීම කරන්නය කියලා. මේක ක්‍රියාන්විතයේ ඉතිරි වන එක විතරයි අපි මේ කථා කරන්නේ. මේ ක්‍රියාන්විතයේ එහෙම එකක් නැහැ ගරු මන්ත්‍රීතුමා. පැහැදිලිවම තිබෙන්නේ, අර Categoris වල තිබෙන පුරප්පාඩු පුරවන්න අපෙන් ඇසිය යුතුවත් නැහැ. ඒක ඒ විදුහල්පතිවරුන්ටම පුළුවන් බඳවා ගන්න. ඒකට අපි අත ගහන්නේවත් නැහැ. ඒක උසාවියෙන් ආපු නියෝගයක්. අපට අත ගහන්න බැහැ ඒකට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම කියන්නේ ඒක නොවෙයි. මම කියන්නේ, 33 න් පස්සේ තිබෙන ටික ගැන මේ කියන්නේ. ඔබතුමා අත ගහන්න බැහැයි කියන්නේ ඔය 33 දක්වා පුරවන එකට නේ? ඒකෙන් පස්සේ ක්‍රියාන්විතයෙන් කියලා ඉතිරි කර ගන්න ටික විදුහල්පතිවරු පුරවන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒවා ඉස්කෝලේ කරන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. ඉස්කෝලේ කරන්නේ නැති නිසා නේ මේ ප්‍රශ්නය එන්නේ. ඒ පොරොත්තු ලේඛනයේ ඉතිරි අය ගන්නවා නම්, මෙහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. ඒක බොරු කථාවක්. ගරු මන්ත්‍රීතුමා, එහෙම කොහේ හරි ඉස්කෝලයකින් කරලා තිබුණොත්, මම ඒ ගැන පරීක්ෂණයක් කරන්නම්. අපේ ක්‍රියාන්විත පාසල්වලට විතරයි මේ ගැටළුව තිබෙන්නේ. අනික් කිසිම පාසලකට 42 සීමාවට වෙනකල්ම විදුහල්පතිවරුන්ට ගන්න දෙනවා. පාසල් 56 ක විතරයි. ඒකෙනුත් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. 56 ක විතරයි මේ ගැටළුව තිබෙන්නේ. ඒකෙත් ක්‍රියාන්විතයේ පුරප්පාඩුවලට විතරක් ඇති වන ඒවාට තමයි අපි අර -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ අවබෝධය ගොඩක් විදුහල්පතිවරුන්ට නැහැ. මම කථා කළා නේ මේ ප්‍රශ්නය.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක මම සොයලා බලන්නම්.

## බස්නාහිර පළාතේ පාසල් : 6 න් ඉහළ ශ්‍රේණිවල සාක්ෂරතාව

SCHOOLS OF WESTERN PROVINCE : LITERACY IN CLASSES ABOVE GRADE 6

**02.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/02)**

අ. බස්නාහිර පළාතේ ඒ ඒ කලාප කාර්යාලවලට අනුව 6, 7, 8, 9, 10 හා 11 ශ්‍රේණිවල ලිවීම හා කියවීමට නොහැකි ශිෂ්‍යයන් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ආ. වාර්තාව අනුව ලිවීමට හා කියවීමට නොහැකි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ. මෙම ශ්‍රේණි පරාසයන්හි පසුගිය වසර 05 තුළ පාසල් ඒම අතරමග නැවතුන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ. ඒ කුමන පාසල්වලද? කුමන ශ්‍රේණිවලද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.[1]

ආ.

| කලාපය | | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | - | 551 |
| ශ්‍රී ජයවර්ධනපුර | - | 163 |
| හෝමාගම | - | 546 |
| පිළියන්දල | - | 362 |
| ගම්පහ | - | නැත. |
| කැලණිය | - | 865 |
| මිනුවන්ගොඩ | - | 864 |
| මීගමුව | - | 425 |
| කළුතර | - | 1659 |
| මතුගම | - | 82 |
| හොරණ | - | 1109 |
| **මුළු එකතුව** | **-** | **6626** |

ඇ.

| කලාපය | | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ - 892 | | |
| ශ්‍රී ජයවර්ධනපුර | - | 301 |
| හෝමාගම | - | 106 |
| පිළියන්දල | - | වාර්තා වී නොමැත. |
| ගම්පහ | - | 355 |
| කැලණිය | - | 361 |
| මිනුවන්ගොඩ | - | 943 |
| මීගමුව | - | 219 |
| කළුතර | - | 166 |
| මතුගම | - | 45 |
| හොරණ | - | 60 |
| **මුළු එකතුව** | **-** | **3448** |

ඈ. ඇමුණුම් මගින් දක්වා ඇත.[2]

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

***න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු මහා මාර්ග විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Lakshman Nipuna Arachchi., Member, under item No. 03 of the agenda, was presented to the Hon. Minister of Roads, Electricity and Power, and as two weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the next Council sitting.*

## හේනේගම මධ්‍ය මහා විද්‍යාලය : කැලණිය අධ්‍යාපන කලාපය

HENEGAMA MADYA MAHA VIDYALAYA:
KELANIYA EDUCATION ZONE

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/09)**

අ. කැලණිය අධ්‍යාපන කලාපයේ හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ විෂමාචාරයන් පිළිබඳ විගණන පරීක්ෂණයක් සිදු කර ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. එම විගණන පරීක්ෂණය අනුව විදුහල්පතිවරයා විසින් විෂමාචාරයක් සිදු කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. ඔබතුමා හා ඔබ අමාත්‍යාංශය මගින් ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. මෙම විදුහල්පතිවරයාට විෂමාචාර චෝදනා තිබියදී දිගින් දිගටම මෙම පාසලේ විදුහල්පති තනතුරේ රඳවා සිටීම විනය පටිපාටියට පටහැනි බව ඔබතුමා නොදන්නේද?

ඉ. මෙම විදුහල්පතිවරයා පාසල තුළ සිදු කළ විෂමාචාරයන්ට අදාළව සිදු කළ විගණන පරීක්ෂණයද ඉදිරිපත් කරමින් අල්ලස් හා දූෂණ වංචා කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති බව ඔබතුමා දන්නේද?

[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.

ඊ. එසේ නම් ඒ සම්බන්ධව ඔබතුමා විසින් ගත් ක්‍රියාමාර්ග කවරේද?

උ. ඉහත කී විගණන පරීක්ෂණය සිදු කර සැලකිය යුතු කාලයක් ගතව තිබියදීත් මෙම විදුහල්පතිවරයා සම්බන්ධව විධිමත් විනය ක්‍රියාමාර්ග නොගැනීමට හේතු මොනවාදැයි මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. විගණන පරීක්ෂණයේ පෙන්වා දී ඇති කරුණු සනාථ වන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමට මූලික විමර්ශනයක් සිදු කර ඇත. ඒ මත සිදු කරනු ලබන විධිමත් විනය පරීක්ෂණයේදී විෂමාචාරයක් සිදු කර තිබේද යන්න පිළිබඳව අනාවරණය වනු ඇත.

ඇ. මේ වන විට මූලික විමර්ශනය අවසන් කොට ඇති අතර විධිමත් විනය පරීක්ෂණය සඳහා චෝදනා පත්‍ර සකස් කරමින් පවතී.

ඈ. විධිමත් විනය පරීක්ෂණය අවසානයේදී ඔහුට විරුද්ධව ඇති චෝදනා සනාථ වුවහොත් ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගනු ඇත.

ඉ. ඒ බව වාර්තා වී නොමැත.

ඊ. අදාළ නොවේ.

උ. දැනටමත් විධිමත් විනය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේ කාරණයටම අදාළව පසුගිය වසරේ අගෝස්තු මාසේ 19 වැනිදා මා මේ සභාවේ මෙලෙසම ප්‍රශ්න කළා. ඒ අවස්ථාවේදී ඔබතුමා ලබා දුන්න පිළිතුරු මා සතුව තිබෙනවා. එතකොට නැවතත් මාස අටක් ගත වෙලත් එවැනිම පිළිතුරු තමයි ඔබතුමා විසින් ලබා දෙමින් තිබෙන්නේ. එතකොට දැන් මේ පසුගිය වතාවේ ඔබතුමා ලබා දුන්න පිළිතුරුවලත් කියනවා, මෙම විදුහල්පතිවරයාව වහාම ක්‍රියාත්මක වන පරිදි එම පාසලෙන් ඉවත් කර බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන්න නිර්දේශ කරලා තිබෙනවා. ඒ වාගේම 2011, 2012 වර්ෂවල සම්පූර්ණ මූල්‍ය විගණනයක් සිදු කර විදුහල්පතිගෙන් රජයට අය විය යුතු මුදලක් ඇත්නම් එය අය කර ගැනීමට නිර්දේශ කරලා තිබෙනවාය කියලා. එතකොට එසේ තිබියදී මාස අටක් ගත වෙලත්, තවදුරටත් මේ විදුහල්පතිවරයා මේ පාසලේ තබා ගනිමින් කටයුතු කරන්නේ ඇයි?

ගරු සභාපතිතුමනි, මේ තිබෙන්නේ, 2014 අගෝස්තු මස 19 වැනිදා හැන්සාඩ් වාර්තාව. මම ප්‍රශ්න කරපු සහ උත්තර ලබා දීපු හැන්සාඩ් වාර්තාව. එතකොට මේ උත්තර දෙකම සමානයි. එතකොට මාස අටකට පස්සෙත් අපට ලැබෙන්නේ එහෙම උත්තර නම්, විශේෂයෙන්ම හේනේගම මධ්‍ය මහා විද්‍යාලය කියන්නේ, ඔබතුමා දන්නවා, බස්නාහිර පළාතේ විශේෂයෙන්ම අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් පාසල් අතරින් ඉතා විශිෂ්ට පාසලක්. එතකොට ඒ පාසලේ මෙවැනි විදුහල්පතිවරයෙක් තබා ගැනීම පිළිබඳව මම පළමු වතාවට ප්‍රශ්න නගලා මාස අටකට වැඩි කාලයක් වෙනවා. එතකොට මා සතුව තිබෙනවා, 2013 විගණන වාර්තාව. මේ තියෙන්නේ, එම විගණන වාර්තාව. මේ විගණන වාර්තාව ඉතා පැහැදිලිව ඔහු සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මා සතුව මේ තිබෙන්නේ, 2015 ජනවාරි මස 15 වැනිදා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට මේ විදුහල්පතිවරයා සම්බන්ධව කරපු පැමිණිල්ල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දැන් පැහැදිලි කිරීමක් කරන්න දෙන්න අමාරුයි මට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙතෙක් මෙවැනි කරුණු රැසක් තිබියදී ඇයි තවදුරටත් - මොකද, පළමු වැනි වතාවේදී ඔබතුමා මට උත්තර දුන්නා, මොහුව පළාත් කාර්යාලයට අනුයුක්ත කරනවාය කියලා. නමුත් මේ වන තුරු, මාස අටක් ගත වෙලත් ගරු සභාපතිතුමනි, තවමත් එවැනි කටයුත්තක් සිදු වෙලා නැහැ. මේ දූෂිත විදුහල්පතිවරයා තවදුරටත් පාසලේ කටයුතු කරමින් සිටිනවා. ඉතින් මේක මේ රටේ දහස් ගණනක දරුවන්ට කරන බරපතළ අපරාධයක්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අල්ලස් හෝ දූෂණ එකට පැමිණිල්ලක් කළ පමණින් අපට කටයුතු කරන්න බැහැ. දෙවැනි කාරණාව, මූලික පරීක්ෂණය අවසන් වෙලා චෝදනා පත්‍රය ලබා දුන්නායින් පස්සේ තමයි ක්‍රියාමාර්ගයක් ගන්න වෙන්නේ මොහුව අනුයුක්ත කරන්න. මම දන්නවා ඔබතුමා කියන දේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ මම කියන්නේ මහ ඇමතිතුමනි, මේකේ ගත වුණු කාලය ඉතා දීර්ඝ කාලයක්. දැන් මාස අටක්, පළමු වැනි වතාවේ මම ප්‍රශ්න අහලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මේ නිලධාරීන් එක්ක මේක සොයලා බලලා ඊළඟ සභාවේදී උත්තර දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

## මීගමුව සිට මුතුවාඩිය දක්වා මගී බස් රථයක් නොමැතිකම
NON-AVAILABILITY OF A BUS FOR TRANSPORTATION FROM NEGOMBO TO MUTHUWADIYA

**05.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/10)**

අ. මීගමුව සිට මුතුවාඩිය දක්වා මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට දීර්ඝ කාලයක සිට බස් රථයක් නොමැති බව ඔබතුමා දන්නේද?

ආ. මේ නිසා විශේෂයෙන්ම උදෑසන රාජකාරී සඳහා ගමන් ගැනීමේදීත්, දරුවන්ට පාසලට යාම සඳහාත්, සවස නැවත නිවෙස් බලා යාමේදීත්, ඔවුන් දැඩි පීඩාවට පත්ව ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඇ. ඒ සඳහා ඔබතුමා යම් පියවරක් ගෙන තිබේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

ඉ. මෙම ප්‍රදේශයේ ජනතාවගේ පොදු ගමන් අවශ්‍යතාව ඉටු කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධ කර ගෙන ඔබතුමා යම් පියවරක් ගන්නේද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අ. දනිමි. 2008 වර්ෂයේදී රද්දොළුගම ඇවරිවත්ත(මුතුවාඩිය හරහා) බස් රථ 02 ක් සේවයේ යොදවා තිබුණද අඩු ආදායම් මාර්ග නිසා මාස 03 කින් පමණ පසු ධාවනයෙන් ඉවත් විය.

ආ. ඔව්. සිසු සැරිය යටතේ පෞද්ගලික බස් රථ 02 ක් යොදවා ඇත.

ඇ. ධාවනය වූ බස් රථ දෙක මාර්ගයෙන් ඉවත් වූ පසුව අවස්ථා කිහිපයකදීම බස් හිමියන් පෞද්ගලික බස් රථ හිමියන් පෙළඹවීමට උත්සාහ කළ ද අනාර්ථික මාර්ගයක් වීමෙන් එම උත්සාහය ව්‍යවර්ථ වී ඇත.

ඈ. 'ඇ' යටතේ පිළිතුරු ලබා දී ඇත.

ඉ. ඇවරියවත්ත සිට ජා-ඇළ දක්වා නව බස් සේවාවක් (මල්ගස් හංදිය, රද්දොළුගම උදම්විට හරහා) ආරම්භ කිරීමට උත්සාහ කළත් පසුගිය කාලයේ බැරිව ගියා. ඒකට නැවතත් කටයුතු කරන්න කිව්වා. ඊළඟට ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ "ගැමි සැරිය" යටතේ ලංගම හෝ පෞද්ගලික බස් රථයක් යෙදවීමට කටයුතු කරන්නය කියලා දැනටමත් ඉල්ලීමක් කරලා තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට මේක අඩු ආදායම් ලබන මාර්ගයක් වෙන්න පුළුවන්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, අඩුම තරමේ උදෑසන පාසල් දරුවන් පාසල් යන අවස්ථාවේදී සහ වැඩ කරන ජනතාව සේවයට වාර්තා කරන අවස්ථාවේදීත් නැවත නිවෙස් බලා ඒමට අවශ්‍ය අවස්ථාවලදීවත් අඩුම තරමේ බස් රථයක් යොදන්න ඔබතුමාගේ පැත්තෙන් අවධානය යොමු කරනවාද කියන කාරණාව දැන ගන්න කැමැතියි.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පැහැදිලිව ගරු මන්ත්‍රීතුමා, සිසු සැරිය යටතේ අපි බස් රථ දෙකක් දාලා තිබෙනවා. ඒක අපට කරන්න පුළුවන්. නමුත් රාජකාරී කරන අය සඳහා අපට ඉල්ලීමක් පෞද්ගලික අයගෙන් කරන්න පුළුවන්. ටෙන්ඩර් කැඳවන්න පුළුවන්. නමුත් කවුරුත් භාර ගත්තේ නැත්නම් මට ඇමතිවරයා විධියට වෙන කරන්න දෙයක් නැහැ. ඒකට තමයි මම යෝජනා කරලා තිබෙන්නේ. අනාර්ථික මාර්ගවලට ගැමි සැරිය කියලා අලුත් ව්‍යාපෘතියක් ආණ්ඩුවේ තිබෙනවා. ඒක ටික කාලයක් දෙනවා. ආර්ථික වශයෙන් වාසි වුණාට පස්සේ ඒක අයින් කරනවා. ඉතින් අපි දැනටමත් ඉල්ලීමක් කරලා තිබෙනවා රාජකාරී සඳහා වාර්තා කරන අයට, එහෙම නැත්නම් වෙනත් අයට ගැමි සැරිය යටතේ බස් රථයක් දෙන්න අපට අදාළ ඒ බලපත්‍රය ලබා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ සඳහන් නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතැන පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මේක අපි දාලා තිබෙන්නේ, කුමාර වෙල්ගම මැතිතුමා මැදිහත් වෙලා ලබා දීපු එකක්. මේක පොදු සංවිධානයක් හරහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලට තමයි මේක ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. එවකට රජයේ ප්‍රවාහන ඇමතිවරයා වශයෙන්. ඒ නිසා මම ඒ ලැයිස්තුව දෙන්නම්. අර සංවිධානයේ නම මේකට ලැබිලා නැහැ. ඒක ඔබතුමාට ලබා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමාට සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද එවකට ප්‍රවාහන අමාත්‍ය කුමාර වෙල්ගම ඇමතිතුමා සහ එවකට පළාත් සභා අපේක්ෂක සෙනල් වෙල්ගම විසින් බස් රථ කීයක් ලබා දීලා තිබෙනවාද කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සෙනල් වෙල්ගම මන්ත්‍රීතුමා විසින් කියලා නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔවුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් බස් රථ ලබා දෙනවා කියලා කළුතර දිස්ත්‍රික්කයේ හැම තැනම බෝඩ් ගහලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා

Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම නොවෙයි. ඒක පොදු සංවිධානයක් හරහා ලබා දෙන දෙයක්. ගරු මන්ත්‍රීතුමනි, මේකට අදාළව තොරතුරුත් එක්ක ලබන සභාවේදී මට උත්තර දෙන්න පුළුවන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හොඳයි. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය ඊළඟ රැස්වීමට ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*Question ordered to refer to the next Council sitting.*

# කළුතර/මතුගම කලාපීය පාසල් : පාසල් උපකරණ බෙදා දීම
SCHOOLS OF KALUTARA/ MATHUGAMA ZONES: DISTRIBUTION OF OFFICE EQUIPMENT

**07.**

**නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/12)**

අ. කළුතර හා මතුගම අධ්‍යාපන කලාපවල පාසල්වල පළමු වසර සිසුන් සඳහා පාසල් බෑග් සහ උපකරණ බෙදා දීමේ ව්‍යාපෘතියක් 2015 පෙබරවාරි සහ මාර්තු මාසවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැවැත්වීද?

ආ. නොඑසේ නම් එම කාලය තුළ එවැනි උත්සව පාසල් තුළ හෝ පාසල්වලින් පිට පැවැත්වූ බව ඔබතුමා දන්නේද?

ඇ. නිල ඇඳුමින් පාසල් වේලාව තුළ දරුවන් එම උත්සව සඳහා පාසල්වලින් පිටතට යැවීමට ඒ ඒ පාසල්වල විදුහල්පතිවරුන්ට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අවසර ලබා දී තිබේද?

ඈ. එසේ අවසරයක් නැතිව දරුවන් එම උත්සවවලට සහභාගී කරවූයේ නම් අදාළ විදුහල්පතිවරුන් වරදක් කර තිබේද?

ඉ. එවැනි වරදක් කර තිබේ නම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. නැත.

ආ. විශේෂ උත්සව ලෙස පැවැත්වූයේ නැත. පළමු ශ්‍රේණියේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් රැස් කර එකී උපකරණ පාසල්වලදීම බෙදා දෙන ලදී.

ඇ. මේ සඳහා කැමැත්ත දක්වන දෙමව්පියන් සමඟ ගොස් එම උපකරණ ලබා ගන්නා ලෙස කලාප හා කොට්ඨාශ අධ්‍යක්ෂ මගින් පාසල් වෙත දන්වා ඇත.

ඈ. අවසරයකින් තොරව සහභාගී කර නැත.

ඉ. අදාළ නොවේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා දෙවැනි ප්‍රශ්නයට සඳහන් කළේ එවැනි උත්සව පාසලින් පිට පැවැත්වූයේ නැත කියලයි. එහෙම නේද? ඒ කියන්නේ උපකරණ පාසල්වලට බෙදා දෙනවා විතරද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විශේෂ උත්සව ලෙස පැවැත්වූයේ නැත. පළමු ශ්‍රේණියේ සිසුන්, ගුරුවරුන් හා දෙමාපියන් රැස් කර එකී උපකරණ පාසල්වලදීම බෙදා දෙන ලදී කියලයි තිබෙන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මම ඔබතුමාගේ දැන ගැනීමට කියන්නේ. ඔබතුමාව සම්පූර්ණයෙන්ම නොමග යවලා තිබෙන්නේ. මතුගම ශ්‍රවණාගාරයට ඒ අවට පාසල් රාශියක් උදෑසන 8.30 ට කැඳවලා, පාසල් වේලාව තුළදී, පාසල් නිල ඇඳුමෙන් 1 වන ශ්‍රේණියේ ළමයින් කැඳවලා ඔය උත්සවය තිබුණා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, ඒක කියලා තිබෙනවා මේකේ. ඒ දෙමව්පියන්ගෙන් කැමැති අයට ඒක භාර ගන්න යන්න කියලා අවසර දීලා තිබෙනවා කියලා තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

දෙමව්පියන් ගියාට ප්‍රශ්නයක් නැහැ. මම අහන්නේ මේ පළමු වැනි පන්තියට ඇතුළත් වුණු පුංචි දරුවෝ ඉස්කෝලයට යන නිල ඇඳුමින්, පාසල් වේලාව තුළ ගෙනියපු එකයි වැරැද්ද. දැන් ඔබතුමා දකින්න ඇති ජනාධිපතිතුමාත් කිව්වා, පාසල් ළමුන් උත්සවවලට

[ ගරු නලින්ද ජයතිස්ස ]

සම්බන්ධ කර ගැනීමේදී යම් සීමාවක් තියෙන්න ඕනෑ කියලා. නමුත් මේ පසුගිය ආණ්ඩුව කරපු වැඩක්. ළමයි උත්සවවලට සම්බන්ධ කර ගත්තා. මේ තාත්තලා පුතාලා දෙන්නා මේ උත්සවයට සම්බන්ධ වුණා. ඔබතුමා දන්නවා සිද්ධිය.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේකේ කියලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම නම් කවුද අවසර දුන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අවසර දීලා තිබෙනවා. සහභාගී කර නැත කියලා තිබෙනවා. විස්තර මේකේ නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

නැහැ. මම අහන්නේ එහෙම නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ පළාත් අධ්‍යාපන ලේකම්වරයා අවසර ලබා දීලා තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේකේ එහෙම තොරතුරු දීලා නැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමා පිළිගන්නවා. එහෙම වෙලා තිබෙනවා නම් වැරැද්දක්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ඒ ප්‍රශ්නය ඇහුවොත් මම ලබන පාර පිළිතුරු දෙන්නම්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

පළාත් අධ්‍යාපන ලේකම්වරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතියක් නැතිව විදුහල්පතිවරු එහෙම ළමයි සහභාගී කෙරෙව්වොතින් ඒක වැරැද්දක් නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා ප්‍රශ්නය ඇහුවා නම්, මම ඊළඟ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මම අහන්නේ ඒක තමයි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. අහන්න. මම ඊළඟ සභාවේදී උත්තර දෙන්නම්.

# රෝහල්වල බාහිර රෝගීන් : නැවතීමේ කාමර
# OUTPATIENTS IN HOSPITALS: WAITING ROOMS

**08.**

**නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/15/13)**

අ. රෝහල්වල බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන් සඳහා නැවතීම් කාමර (Waiting room) ඉදි කිරීමේ ව්‍යාපෘතියක් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන්නේද?

ආ. ඒ සඳහා තෝරා ගත් රෝහල් මොනවාද?

ඇ. එක් එක් නැවතීමේ කාමරයක වර්ග අඩි ප්‍රමාණය කොතෙක්ද?

ඇ. එක් එක් ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන්ව කොපමණද?

**ගරු රංජිත් සෝමවංශ (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)**
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

අ. ඔව්.

ආ. කොළඹ දිස්ත්‍රික්කය (අවිස්සාවේල්ල මූලික රෝහල, දැඩිගමුව මධ්‍යම බෙහෙත් ශාලාව)
ගම්පහ දිස්ත්‍රික්කය (වතුපිටිවල මූලික රෝහල)
කළුතර දිස්ත්‍රික්කය (පිඹුර මූලික රෝහල, මතුගම දිසා රෝහල, හොරවල මධ්‍යම බෙහෙත් ශාලාව.

ඇ. වර්ග අඩි 390.

ඈ.

| දිස්ත්‍රික්කය | වෙන් කරන මුදල (රු. මිලියන) | වියදම (රු. මිලියන) |
|---|---|---|
| කොළඹ | 4.8 | 0 |
| ගම්පහ | 2.4 | 0 |
| කළුතර | 7.5 | 2.1 |

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මම ඇත්තටම ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්න අහන්න නොවෙයි හිටියේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අහන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

නමුත් අන්තිම ප්‍රශ්නයේ එක් එක් ඉදි කිරීම සඳහා වැය කළ මුදල වෙන් වෙන්ව කොපමණද කියලා නේ අහලා තිබෙන්නේ. එක් එක් ඉදි කිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන්ව කොපමණද? ඒ කියන්නේ මට ඕනෑ කරන්නේ, පිඹුර රෝහලට මෙහෙමයි. වැත්තෑවට මෙහෙමයි. මීගහතැන්නට මෙහෙමයි කියලා වෙන් වෙන්ව. දිස්ත්‍රික්කයට නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මිලියන 7.5 තුනෙන් බෙදන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

නැහැ. ඒක හරියන්නේ නැහැ. එහෙම එක ගනණද ගියේ. එක ගණන ගියා නම් කමක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම විස්තරාත්මකව පැහැදිලි කරන්නම්. දැනට අපි අත්හදා බැලීමක් හැටියටයි මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ. මොකද, රෝහල්වලට ගියාම ලැබුණු අම්හිරි අත්දැකීමක් තමයි, රෝගී වුණු, වියපත් වුණු, වයස්ගත දෙමව්පියෝ බෙහෙත් ලබා දීමේ පෝලිමේ ඉන්නවා. ඒ නිසා හැමෝටමත් නොවෙයි මේක හැදුවේ. ඒ නිසාවෙන් ඒ කවුන්ටරයෙන් තමන්ට හිමි අංකය අරගෙන අර විවේක කාමරයේ අසුන් ගෙන රැඳී සිටීමටයි මෙම පහසුව ඇති කළේ. එතැන අපි තව බොහෝ දේවල් ඇති කරලා තිබෙනවා. මොකද, මාධ්‍ය හරහා සෞඛ්‍ය විද්‍යාත්මක උපදෙස් ලබා ගන්න. වෙනත් හදිසි පිපාසයක් ඇති වුණොත් සංසිඳවා ගන්න. ඒ ඔක්කොම දීලා තිබෙනවා.

ඒකේදී අපි අත්හදා බැලීමක් කළේ. දැනට ඒ කාරණාව සාර්ථකයි කියලා මට දැනෙනවා. සමහර රෝහල්වලට මේ කාරණා මීට වඩා ටිකක් - ඒ රෝහලේ OPD එකට, බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව පදනම් කර ගෙන මේ තත්ත්වය මීට වඩා සංවර්ධනාත්මකව කරන්න සිදු වෙයි කියලා මට හිතෙනවා. මම ඔබතුමාගෙන් වෛද්‍යවරයෙක් හැටියට සහ මගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාගේ විධිමත් සැලසුම් අදහස් තිබෙනවා නම් මම ලිඛිතව බලාපොරොත්තු වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

බොහොම ස්තුතියි.

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, *"ඉන්දික මහීෂ බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක නිවාඩු අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ දිනවල ගොඩක් අපට හිතවත් අය, අපේ පාක්ෂිකයෝ විවිධ ආකාරයෙන් දුරකථන ඇමතුම් දීලා අපෙන් විමසන කාරණයක් තිබෙනවා. මම කැමැතියි, ඒ කාරණය පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරන්න. ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව 2015 ජනවාරි 29 වැනිදා අතුරු අයවැයක් ඉදිරිපත් කළා. ඒ අතුරු අයවැයේ එක තැනක මෙන්න මෙහෙම සඳහන් වෙනවා. පසුගිය දශකය තුළ ජීවන වියදම ඉහළ යාම නිසා දැඩි සේ පීඩාවට පත් කාන්තාවන්ට සැලසෙන විශේෂ සහනයක් ලෙස රජයේ බැංකුවල උකස් කරන ලද රුපියල් ලක්ෂ දෙක නොඉක්මවන වටිනාකමින් යුත් උකස් කළ ස්වර්ණාභරණ මත අය කෙරෙන පොළිය කපා හරිනු ඇත. මම කැමැතියි ඒක යළිත් කියන්න. කපා හරිනු ඇත කියලා. ඒ අනුව ගරු සභාපතිතුමනි, අපි දන්නවා මේ රටේ බොහොමයක් ජනතාව පසුගිය කාලයේ මේ අපේ කාන්තාවන්ගේ පසුම්බියේ තිබුණේ සල්ලි නොවෙයි. රත්තරන් බඩු උකස් තියපු රිසිට්පත. ඉතාම අමාරුවෙන් ජීවත් වුණේ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, ඒ අනුව 2015.03.10 වැනිදා -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

අපට උකස් තියලා ඒවාට තවම සල්ලි ඇවිල්ලා නැහැ. සමූපකාරයට. සල්ලි දෙන්නේ නැහැ නේ ඔය කිව්වාට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඔබතුමා අහන්නේ නැහැ නේ මම කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. පුංචි කාලයක් තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

දැන් ඔබතුමා මාර්ගයෙන් අපි ඉල්ලන්නේ. සමූපකාර ග්‍රාමීය බැංකුවල උකස් තියලා තිබෙන ඒවාට අපි ලිපි ගණනාවක් ලියලා තිබෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

යහපාලනයෙන් දෙයි කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි මම මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

දින 100 යි. වැඩ බින්දුවයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ අනුව ගරු සභාපතිතුමනි, 2015.03.10 වැනි දින මුදල් අමාත්‍යාංශය සියලුම රාජ්‍ය බැංකුවල සාමාන්‍යාධිකාරීවරුන්ට චක්‍රලේඛයක් යවනවා. මේ අයවැය මගින් යෝජනා කරපු සහනය ලබා දීම පිළිබඳව. ඒකේ එක තැනක සඳහන් වෙනවා, මේ සහනය ලැබෙන්නේ අක්‍රීය අංශයේ තිබෙන රත්තරන් බඩුවලට. හැබැයි, ඒ අක්‍රීය අංශයේ ඒ භාණ්ඩ තියෙන්න ඕනැ. 2015 ජනවාරි 31 වන දිනට හෝ ඊට කලින්. ඒ නිසා

මාස 15 කට කලින්, ඒ කියන්නේ 2013 ඔක්තෝබර් 31 වන කොට උකස් තියපුවා වෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් අපි දන්නවා ගරු සභාපතිතුමනි, රත්තරන් බඩු උකස් තියලා, මාස 12 න් වෙන්දේසි කරනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව දුන්න පොරොන්දු ඔක්කොම ඔහොම තමයි. ක්‍රියාත්මක කරන්න බැරි පොරොන්දු දෙන්නේ. එකක්වත් ක්‍රියාත්මක කරන්නේ නැහැ. දින සීයයි. වැඩ බින්දුවයි. මිනිස්සු රවට්ටපු එක විතරයි ඔය ආණ්ඩුව කළේ. ඔය දින සීයටම කළේ මිනිස්සු රවට්ටපු එක, මුලා කරපු එක විතරයි. කරපු යහපාලනයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ මන්ත්‍රීතුමා ඒ ආණ්ඩුවේ නැහැ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අපි ඡන්දය දුන්නේ නැහැ. ඔයාලා නේ පත් කර ගත්තේ ඡන්දය දීලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එතුමාට කථා කරන්න දෙන්න. බාධා කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපි දන්නවා වැඩිපුර මාස තුනක් ලබා දෙනවා. මාස 15 න් අනිවාර්යයෙන් මේ භාණ්ඩ වෙන්දේසි වෙනවා. එතකොට දැන් මම බැංකු ගණනාවකට කථා කළාම ඒ අය කියනවා, ඔන්න දැන් ඇවිල්ලා තිබෙනවා අලුත් ලිපියක්. 17.5% වශයෙන් තිබුණු පොලී අනුපාතය 12% ක් විතරක් අය කරන්න. 5.5% ක් කපා හරින්නය කියලා. හැබැයි, මේකේ තිබෙන්නේ පොලිය කපා හරිනු ඇත කියලයි. ඇත්ත වශයෙන්ම රුපියල් දහ දාහකට රත්තරන් බඩුවක් තියලා තිබුණොත් ඒ අනුව 17.5% සිට 12% ට අඩු කළොත් අඩු වෙන්නේ රුපියල් පන්සිය පනහයි. හැබැයි, ඒක නොවෙයි සැබෑ කතන්දරය. ගරු සභාපතිතුමනි, මෙහෙම රත්තරන් බඩු බැංකුවල නැත. වෙන්දේසි කර ඇත. අද උදේ කථා කළා ලංකා බැංකුවේ හිතවත් කෙනෙකුට. මම ඇහුවා දැන් අලුත් චක්‍රලේඛය ආවා නේ? එහෙම තිබෙනවාද කියලා. ඒක තමයි මන්ත්‍රීතුමා ප්‍රශ්නය. එහෙම රත්තරන් බඩු අපි ළඟ අක්‍රීය තත්ත්වයෙත් නැහැ. ඒ නිසා මට කියන්න අවශ්‍ය වෙන්නේ මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද ජනතාව අපෙන් අහනවා. ඔබතුමන්ලාගෙනුත් අහනවා ඇති. පක්ෂ විපක්ෂ භේදයක් නැතිව ආණ්ඩුවෙනුත් අහනවා. (බාධා කිරීම්)

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමා මෙතැන කෑගහන්නේ. ජෙනරාල්ට එතැනදී කෑ ගහන්න කියන්න කෝ? ඇත්ත කියන්න. ඔබතුමා මාධ්‍යයට කථා කරන්නේ. ඒවා කථා කරන්න ඕනෑ එතැන. මෙතැන නොවෙයි. යහපාලනය ගැන කථා කරන්නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එතුමාගේ හඬ මෙතැන. එතුමා පළාත් සභාවේ කථා කරන්න ඕනෑ. එතුමා පළාත් සභා මන්ත්‍රී.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ජෙනරාල්තුමා මෙතැනට මාව එව්වේ ජනතාව වෙනුවෙන් කථා කරන්න. මගේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කථා කරන්නයි මෙතැනට ආවේ. ඔබතුමා ඇයි ඔපමණ කලබල වෙන්නේ. මෙතුමා ජනප්‍රිය වෙන්න හදනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒ මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න. මේක යහපාලනයද? ආණ්ඩුවේ වැරැද්දක් පෙන්වලා දෙන්න බැහැ. ඔන්න යහපාලනය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක බලලා ටියුෂන්වල ළමයි වැඩි වෙන්නේ නැහැ. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවට

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ආවේ ජෙනරාල්තුමාට එතැන ගිහිල්ලා මේ ප්‍රශ්න කථා කරන්න නොවෙයි. මේ පළාතේ ජනතාවට බලපාන ප්‍රශ්න මෙතැන කථා කරන්න. මේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද 34,000 ක් මට දුන්නේ මට කථා කරන මිනිස්සු ගැන මේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මගේ ඉල්ලීම. ගරු සභාපතිතුමනි, මම මේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මට ඊයෙත් කාන්තාවක් ඇවිල්ලා පෙන්නුවා උකස් කරපු රිසිට් එකක්. මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ දෙනවයි කියපු සහනය ලබා ගන්න පුළුවන්තරම් ආණ්ඩුවට බලපෑම් කරන්න කියලා. ඒකයි මගේ ඉල්ලීම.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාව පිළිබඳව. මොකද, සමූපකාර අමාත්‍යවරයා විධියට මට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න වෙලා තිබෙනවා. මොකද, දැන් ග්‍රාමීය බැංකුවල විශාල විධියට උකස් තියපු අය ඇවිල්ලා අපෙන් විවිධ ඉල්ලීම් කරනවා. මේවා කපා හරින්නේ නැද්ද කියලා. දැන් අපි පළාත් සභාවක් විධියට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න සිදු වෙලා තිබෙනවා. ජනතාව එනවා පොළිය කපා හැරියා කියලා. අපි කියනවා, අපේ එහෙම එකක් නැහැයි කියලා. චක්‍රලේඛයක් නැහැ. දැන් අපි තුන් හතර පාරක් ලිපි ලේඛන යවලා තිබෙනවා. ඒ නිසා ඉතා වැදගත් කථාවක් කළේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා අපි ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, ඒ අදාළ ආයතනවලට දැනුම් දෙන්න. විශේෂයෙන්ම ප්‍රායෝගිකව කරන්න පුළුවන් නීතිමය ක්‍රමවේදය ලිඛිතව එවන්නත්, ඒ වාගේම ග්‍රාමීය බැංකු අංශය මේකට සම්බන්ධ කර ගන්නත් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.30 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.30 a.m. and then resumed.*

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි දැන් උදේ පාන්දර මේ සභාවට එන්න ඕනෑ. අපේ වැඩ කටයුතු කර ගන්න අපට පෞද්ගලික කාර්ය මණ්ඩලයක් පත් කර ගෙන තිබෙනවා. අපි මේ සභාවට පත් වෙලා ආපු මුල් කාලයේ තිබුණු උනන්දුව මේ සේවකයෝ දක්වන්නේ නැහැ දැන්. නොදක්වන්න හේතුව තමයි, ඒගොල්ලෝ කියනවා, මේ රටේ බහුතරයක් කථා කරන්නේ පඩි වැඩි වීමක් ගැන. රු. 13,000 ක් ගැන, 10,000 ක් ගැන, 5,000 ක් ගැන කථා කරනවා. මේකෙන් ඔබතුමන්ලා ළඟ වැඩ කළාට අපට මේ පඩි වැඩිවීම වෙන්නේ නැද්ද? එතකොට, රජයේ මේ කථා කරන ඒවා අපට ලැබෙන්නේ නැද්ද කියලා මේ අය නිරන්තර ප්‍රශ්න කිරීමක් කරනවා. ඒ වාගේම යම් කලකිරීමකටත් පත් වෙලා තිබෙනවා. අපේ ළඟ වැඩ කරනවා. අපි දෙන මුදල විතරයි. අවුරුදු සමය එනවා. අනික් අය කියනවා, Festival Advance කියලා. අරවා කියනවා මේවා කියනවා. මුකුත් මේ අයට ලැබිලා නැහැ. එතකොට ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් - අපේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට. අපි ළඟත් හතර පස් දෙනෙක් වැඩ කරනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ වන විට සභා ලේකම් කාර්යාලයෙන් ගරු ආණ්ඩුකාරතුමාව ඒ කාරණය සම්බන්ධයෙන් දැනුවත් කරලා තිබෙනවා. එතුමා ඒ පිළිබඳව කැබිනට් සංදේශයක් දාන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. ඒ නිසා ඉදිරි කාලය තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරලා ඒ වාර්තාව ගරු ආණ්ඩුකාරතුමාට යැව්වාට පසුව තමයි ඒ වැටුප් වැඩිවීම ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. එතෙක්

අපට සභා ලේකම් කාර්යාලයට වැඩි වීමක් ලබා දෙන්න ක්‍රමයක් නැහැ. බලයක් නැහැ. තවම කෙරිලා නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතුමාගේ වරප්‍රසාදය හරි. කැබිනට් සන්දේශයක් දාන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා ඒක හරි. පිළිගන්නවා. හැමෝටම තිබෙන ප්‍රශ්නයක් ඒක. මන්ත්‍රීවරු 104 දෙනාටම බලපාන ප්‍රශ්නයක් ඒක. නමුත් ආණ්ඩුකාරතුමා උපදෙස් දීලා තිබෙන්නේ කැබිනට් සන්දේශයක් මගින් ඉදිරිපත් කරන්නය කියලයි. ඊට පස්සේ ඒක අනුමත කරලා දෙනවා. ගැටළුවක් වෙන්නේ නැහැ. කැබිනට් එකත් සභාවේ නැහැ නේ ඉතින්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නිලධාරීන් ඉඳලා අපි කියන දේවල්වලට ඇහුම්කන් දීලා, මෙතුමාගේ වරප්‍රසාදයට ඇහුම්කන් දීලා කඩිනමින් ඒකට පියවරක් ගන්න ඕනෑ. අපේ කාර්ය මණ්ඩලයට කියන්න ඕනෑ. මේ කියන කථාව ඇත්ත. හෙට අනිද්දා අවුරුදු එනවා. ඒ අයත් සේවකයෝ. ඒ අයට arrears එකක් ගෙවන්න තිබෙනවා. මෙතැන නිලධාරී මණ්ඩලය ඉන්න ඕනෑ. ගැලරියේ ඉන්න ඕනෑ. ඉස්සර මේකේ නිලධාරීන් ඔක්කොම පිරිලා. අද කෝ නිලධාරීන්?

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම දැන් මේ පළාත් සභාවට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. අපි නවකයෝ වශයෙන්, දැන් ගියවර අපේ ජගත් අංගගේ හිටපු ඇමතිතුමා කථා කරන කොට, එතුමාගේ කාලය හමාරයි කියන කොට එතුමා කියනවා, මට ඒකෙන් වැඩක් නැහැ. මම රීතිවලට ගරු කරලා මගේ කථාව මම පැයක් කරනවා කියලා. එතකොට මේ නීතිරීති පිළිබඳ අවබෝධය අපට අඩුයි. හිටි ගමන් ලිපියක් දානවා. මගේ නොදැනුවත්කම කියන්නේ. මම කියන්නේ, මේ නවක මන්ත්‍රීවරුන්ට යම් පුහුණුවක් ලබා දෙන්න කියලා. මේ නවක මන්ත්‍රීවරුන්ට නීති සහ රීති සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දුන්නොත් මේ සභාව මීට වඩා විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යන්න පුළුවන්කමක් ලැබෙනවා. මොකක් හරි වැඩ මුළුවක් පවත්වලා මේ කටයුත්ත කළොත් හොඳයි කියලා තමයි - (බාධා කිරීම්) අපට විදේශ පුහුණුවක් අවශ්‍ය වෙන්නේ නැහැ. මම කථා බහ කරන කොට අපට තේරෙනවා අලුත් මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව අවබෝධය අඩුයි කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ වන විට පළාත් සභා ලේකම් කාර්යාලයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් හදලා තිබෙනවා. මේ කාර්ය මණ්ඩලවලට වැටුප් වැඩි වීම සම්බන්ධව. ඉතාම ඉක්මණට ඒ වාර්තාව අද ගරු සභා කටයුතු ඇමතිතුමාට යොමු කරනවා. එතුමා හරහා කැබිනට් එකට ඉක්මණටම ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. අනික් එක, අපි මුලින් වැඩ මුළුවක් පැවැත්වුවා. මට මතකයි, අපි අලුත් සභාවට පැවැත්වුවාට ඒකට සහභාගීත්වය අසාර්ථකයි. බොහොම අඩුවෙන් සහභාගී වුණේ ඒකට. තව එකක් දාමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු යහපාලනය මම හිතන්නේ අද වන කොට හිමින් හිමින් නැති වෙිගෙන යනවා. විශේෂයෙන්ම ජනතාව ඡන්දය ලබා දුන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව පත් කර ගන්න. මේ රටේ තිබුණු දූෂණය, වංචාව, හොරකම හා ජනාධිපති ක්‍රමය පිළිබඳව සහතිකයක් ජනතාවට ලබා දුන්න හින්දා. නමුත් අද වන කොට හිමින් හිමින් මේක වෙනස් වෙිගෙන යනවා. විශේෂයෙන්ම පසුගිය ආණ්ඩුවේ චෝදනා ලබපු ඇමතිවරු අද යහපාලන ආණ්ඩුවේ ඉඳගෙන ඉන්නවා. ඒ නිසා අද ජනතාව අතරත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මේ ජනතාව ප්‍රතික්ෂේප කරපු එවැනි අය අද කොහොමද -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් අගමැතිතුමාට කියන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පත් කරන්නේ අගමැතිතුමා නොවෙයි. ජනාධිපතිතුමා. පත්වීම් දෙන්නේ ජනාධිපතිතුමා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි කියන්නේ, ජනතාවගේ අපේක්ෂාව අද ඉටු වෙනවාද නැද්ද කියන එකේ ප්‍රශ්නයක් තිබෙනවා. ජනතාව ඡන්දය දුන්නේ මොකකටද කියන එක ගැන අද ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ රටේ ඒ දුන්න පොරොන්දු අනුව දින 100 වැඩ පිළිවෙළ, දූෂණය වංචාව, හොරකම ගැන සොයා බලලා - ඒ අයව අද තිබෙන යහපාලන ආණ්ඩුවට ගත්තාම අද තිබෙන යහපාලන ආණ්ඩුවත් දූෂිත ආණ්ඩුවක් බවට පත් වේගෙන එනවා. විශේෂයෙන්ම සමහර ඇමතිවරු, චන්ද්‍රිකා මැතිනියගේ ඇඳුම් ගලවලා පාරේ හෙළුවෙන් යවනවා කියපු අය අද මේ යහපාලන ආණ්ඩුවට ඇවිල්ලා ඉඳගෙන ඉන්නවා. උසස් අධ්‍යාපනය ගැන ප්‍රශ්න තිබුණු ඇමතිවරු, ජනතාව ප්‍රතික්ෂේප කරපු අය අද මේ යහපාලන ආණ්ඩුවේ ඇවිල්ලා ඉඳගෙන ඉන්නවා. සමහර අය කිව්වා, කාලා කාලා දැන් ඩෙසර්ට් එක විතරයි කන්න තිබෙන්නේ කියලා. ඒ අයත් අද යහපාලන ආණ්ඩුවේ ඉඳගෙන ඉන්නවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ මොනවාටද කියන එක අද මම හිතන්නේ, මේ රටේ වත්මන් යහපාලන ආණ්ඩුවට ප්‍රශ්නයක් වෙලා තිබෙනවාය කියන එක ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය අපි කථා කළේ, මේ රටේ තිබෙන දූෂණය, වංචාව නවත්වන්න. මේ ඉන්න ජනාධිපතිවරයා මේ ආණ්ඩුව වෙනස් කරන්න ඕනෑය කියලා. නමුත් අද එක්සත් ජාතික පක්ෂයටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා එවැනි ආණ්ඩුවක අපි කොහොමද ඉඳගෙන ඉන්නේ කියලා. ඒක අපටත් ප්‍රශ්නයක් වෙලා. මොකද, අපි ගිහිල්ලා කෑ ගහලා කිව්වේ ඒවා. අද සමහර අය, මේ යහපාලන ආණ්ඩුවේ ඉන්න අය අද ලොකු ලොකු ටෝක් දානවා. ඒගොල්ලෝ බැස්ස නිසා තමයි අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාව පරද්දලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කළේ කියලා කියනවා. නමුත් ඒගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා. ඊට වඩා වුවමනාවක් මේ රටේ ජනතාවට තිබුණා. ඒගොල්ලෝ බැස්සත් නැතත් මේ රටේ ජනතාවට ඊට වඩා වුවමනාවක් තිබුණා, මේ තිබුණු ක්‍රමය වෙනස් කරන්න. ඒ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ නිසා තමයි ජනතාව ඒ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා ඒ ජනාධිපතිතුමාව ප්‍රතික්ෂේප කළේ. අන්න ඒක අද මේ රජයත් මේ ජනාධිපතිතුමාත් අමතක කරන්න හොඳ නැහැයි කියන එක මම මතක් කරලා දෙනවා.

**கௌரவ மொஹமட் முஜிபுர் ரஹுமான்**
Hon. Mohamed Mujibur Rahuman

நன்றி கௌரவ தவிசாளர் அவர்களே இம் மேல் மாகாண சபையிலே என்னுடைய பேச்சை முதல் முறையாக தமிழிலே பேசுவதற்குக் காரணம், தமிழ் மொழியிலே இச் சபையில் யாரும் பேசுவதில்லை என்பதன் காரணமாக இங்கு இருக்கக் கூடிய தமிழ் மொழி ஹன்சாட் அறிக்கையாளரின் தொழிலுக்கு ஒரு பிரச்சினை இன்று உருவாகியுள்ளது. தமிழ் மொழியிலும் எனக்கு உரையாற்ற முடியும் என்பதினால் அம் மொழியில் பேசி இந்த ஹன்சாட்டைச் செய்யக் கூடியவருடைய தொழிலைப் பாதுகாக்க வேண்டும் என்று நான் நினைத்தேன்.

கௌரவ தவிசாளர் அவர்களே, இன்று ஜனாதிபதி மைத்ரிபால சிரிசேன அவர்களின் ஆட்சியின் கீழ் ஒரு முக்கியமான விடயத்தை ஜனாதிபதி அவர்கள் எடுத்திருக்கிறார்கள் அது என்னவென்றால், இந் நாட்டிலே 1950 களில் இருந்து தேசிய கீதம் தமிழ் மொழியில் பாடக் கூடிய வாய்ப்பு இருந்து வந்தது. அன்று தமிழ் பேசும் மக்கள் வாழக் கூடிய வடக்கு கிழக்கு பிரதேசத்திலும் தேசிய கீதத்தை தமிழ் மொழி மூலம் பாட அக்காலத்தில் இருந்த எல்லா அரசாங்கங்களும் அனுமதியினை வழங்கியிருந்தன. எங்களுக்குத் தெரியும் அன்று டட்லி சேனாநாயக்க, சிரிமாவோ பண்டாரநாயக்க, சந்திரிக்கா பண்டாரநாயக்க, ஜே.ஆர். ஜயவர்தன அதேபோல் ஆர். பிரேமதாச ஆகியோர்களின் ஆட்சிக் காலத்திலும் அதேபோல் எல்லோரினதும் ஆட்சிக் காலத்திலும் அவர்கள் யாழ்ப்பாணத்திற்குச் சென்றாலும், மட்டக்களப்பிற்குச் சென்றாலும் அரசாங்கத்திற்கு உரிய விழாக்களின் போது தேசிய கீதத்தினை சிங்கள மொழியில் மாத்திரம் அல்ல தமிழ் மொழியிலும் பாடுவதற்கு அன்று அனுமதியினை வழங்கி இருந்தனர்.

ஆனால் மஹிந்த ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில், இந் நாட்டில் யுத்தம் முடிவடைந்த பின்பும், இந் நாட்டில் இனங்களுக்கு மத்தியில் சாமாதானத்தை உருவாக்குவதற்குரிய ஒரு வாய்ப்பு மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு கிடைத்தது, ஆனாலும் மஹிந்த ராஜபக்ஷ அவர்கள் அவ் வாய்ப்பினைப் பயன்படுத்தாமல், அவர்கள்

மீண்டும் இந் நாட்டில் இனவாதத்தை உருவாக்கி அவர்களுடைய ஆட்சி முறையைத் தொடர்வதற்குத் தான் மஹிந்த ராஜபக்ஷ அவர்கள் அன்று முயற்சி செய்தார்கள். தவிசாளர் அவர்களே, இந் நாட்டில் வாழக் கூடிய தமிழ் பேசும் மக்களுக்கும் வடக்கு கிழக்கில் வாழக் கூடிய மக்களுக்கும் தமது தாய் மொழியான தமிழ் மொழி மூலம் தேசிய கீதத்தை பாடக் கூடிய வாய்ப்பை கௌரவ மஹிந்த ராபக்ஷ அவர்கள் அவர்களது ஆட்சிக் காலத்தில் இல்லாமல் செய்தது மிகவும் மோசமான ஒரு விடயம் என நான் நினைக்கின்றேன்.

ஏனென்றால், அப் பிரதேசத்தில் பல இயக்கங்கள் இருந்து கொண்டு அவர்களுடைய தனி நாட்டுப் போராட்டத்தை நடாத்திய நேரத்தில், அப் போராட்டத்திற்கு அப் பிரதேசத்தில் வாழக் கூடிய மக்களை இணைத்துக் கொள்ள முயற்சிக்கும் நேரத்தில் எங்களுடைய இவ் இலங்கையைப் பற்றி அவர்களுடைய தாய் மொழியான தமிழ் மொழி மூலம் தேசிய கீதத்தை பாடக் கூடிய வாய்ப்பை நாம் இல்லாமல் செய்தால் மீண்டும் அம் மக்கள் இனவாத ரீதியாக செயற்பட கூடிய இயக்கங்களின் பின்னால் தான் செல்வார்கள்.

எனவே தான் இன்று எங்களுடைய ஜனாதிபதி மைத்ரிபால சிறிசேன அவர்கள் நல்லாட்சியின் கீழ் ஒரு முக்கியமான முடிவை எடுத்திருக்கிரார்கள். வடக்கு கிழக்கில் வாழும் மக்களுக்கு மாத்திரம் அல்லாமல் இந் நாட்டில் தமிழ் மொழியை தனது தாய் மொழியாக பேசக் கூடிய மக்களுக்கு தமிழ் மொழி மூலம் தேசிய கீதத்தை பாடக் கூடிய வாய்ப்பை மீண்டும் ஏற்படுத்திக் கொடுத்திருக்கிறார்கள். அதற்காக நாம் எங்களுடைய நன்றியை ஜனாதிபதி மைத்ரிபால சிறிசேன அவர்களுக்கு தெரிவிக்க வேண்டும். ஏனென்றால் தமிழ் பேசக் கூடிய மக்களின் அபிலாசைகளையும், உணர்வுகளையும் அவர்கள் புரிந்து கொண்டுள்ளார் என்பதற்காக நாம் ஜனாதிபதி அவர்களுக்கு நன்றியைத் தெரிவிக்க வேண்டும்.

தவிசாளர் அவர்களே, ஜனாதிபதி மைத்ரிபால சிறிசேன அவர்கள் இந் நாட்டில் உள்ள இனங்களுக்கு மத்தியில் மீண்டும் ஒற்றுமையை உருவாக்குவதற்குரிய முடிவை எடுத்தமைக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொண்டு எனது பேச்சை முடித்துக் கொள்கின்றேன் நன்றி.

ගරු ජනක වැලිවත්ත
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ වත්මන් තත්ත්වය පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මීට මාසයකට පමණ ඉහතදී හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ පැවති අධ්‍යක්ෂ මණ්ඩලය තාවකාලිකව අත්හිටුවලා, බස්නාහිර පළාත් සභාවේ කොමසාරිස්වරයා විසින් ඔහුගේ අධීක්ෂණය යටතේ, කොමසාරිස් පාලනයකට හෝමාගම සමූපකාර සමිතිය නතු කරලා තිබෙනවා. සමූපකාර සමිතියේ සිදු වුණාය කියන අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් තමයි මේ තාවකාලික අත්හිටුවීම කර තිබෙන්නේ. නමුත් එදා ඒ ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම කථා කරද්දී ගරු ඇමතිතුමාත්, සමූපකාර කොමසාරිස්තුමාත් කිව්වේ, මේ පරීක්ෂණය සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් තියෙනවා කියලා. මේ සිද්ධ වෙලා තිබෙන සිද්ධිය සම්බන්ධයෙන් සමූපකාරයේ නිලධාරීන්, ඒ වාගේම ඒ රත්තරන් බඩු විකිණීම සම්බන්ධයෙන් මහජන බැංකුව, ඒ වාගේම කොමසාරිස්තුමාගේ බලය ගත් නිලධාරියෙක් මේ වෙන්දේසිය සිදු වන අවස්ථාවේ සමූපකාරය තුළ ඉඳලා තිබෙනවා. නමුත් අද වන තෙක් ඒ කිසිම නිලධාරියෙකුට විරුද්ධව කොමසාරිස්වරයා මේ වන කොටවත් තීරණයක් අරන් නැහැ. නමුත් ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඒ තීරණය ගන්න වෙලාවේත් වාඩි නොවුනු නියෝජිතයන්ගේ පත්වීම අත්හිටුවලා, ඒ අවස්ථාවේ පත් වෙලා නොසිටි අධ්‍යක්ෂ මණ්ඩලය අත් හිටුවලා වැරදි ආකාරයෙන් කොමසාරිස්වරයාට ඕනෑ විධියට, ඕනෑ ආකාරයෙන් කටයුතු කරලා තිබෙනවා. මේ වන කොට, ඒ කොමසාරිස් පාලනය මාසයක් එකහාමාරක් පමණ කාලයක් ගත වන කොට හෝමාගම සමූපකාර සමිතිය දැඩි ලෙස අර්බුදවලට මුහුණ දීලා සිටිනවා.

මේ අවුරුදු සමයේ පසුගිය වර්ෂයේ හෝමාගම සමූපකාරය තුළ ඉතිරි කිරීම් පමණක්, අවුරුදු මාසය තුළ ඉතිරි කිරීම් පමණක් කෝටි 12 ක්. ලක්ෂ 1200 කට අධික ප්‍රමාණයක් ඉතිරි කිරීම් තිබිලා තිබෙනවා. වාර්තාගත ඉතිරි කිරීම් ප්‍රමාණයක්. ඒ වාගේම වෙළඳාම මාර්තු මාසේ 15 වැනිදා සිට අප්‍රේල් මාසේ 15 වැනිදා වන කොට ලක්ෂ 1000 කට වැඩිය, කෝටි 10 කට වැඩිය වෙළඳාමක් වෙලා තිබෙනවා. නමුත් මේ කොමසාරිස් පාලනය තුළ අද මේ වන කොට ඒ තත්ත්වය ලාභ ලබා ගැනීමේ තත්ත්වයට ගෙනැල්ලා නැහැ. කරලා තිබෙන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරලා තමන්ට ඕනෑ දේ විතරක් කර ගෙන. කිසිම පාලනයක් නැහැ. ලාභ ලබපු හෝමාගම සමූපකාරය අද

[ ගරු ජනක වැලිවත්ත ]

අර්බුදවලට මුහුණ දීලා. වර්ෂය තුළ අවුරුදු අවස්ථාවේදී සේවකයන්ට ලබා දෙන බෝනස් දීමනා ලබා දීලා නැහැ. උත්සව දීමනා ලබා දීලා නැහැ. මේ වාගේ තත්ත්වයකට අද හෝමාගම සමූපකාරය පත් කරලා තිබෙනවා. විශේෂයෙන් මම ඔබතුමා මගින් ඉල්ලා සිටින්නේ කොමසාරිස්තුමා කිව්වා, මාසයක කාලයක් තුළ පරීක්ෂණය පවත්වලා වැරදිකරුවන්ට දඬුවම් ලබා දෙනවාය කියලා. අපි ඒ පිළිබඳව එතැන ඉන්නවා. නමුත් කොමසාරිස්තුමා ඒක එක විධියකට විතරයි කරන්නේ. ඔහුට ඕනෑ වුණේ මේ අධ්‍යක්ෂ මණ්ඩලය අයින් කරන එක විතරයි. නමුත් ඒ සම්බන්ධයෙන් වන නිලධාරීන් පිළිබඳව තවමත් මේ වන තුරු - වගකීමෙන් කියනවා. කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ වෙන්දේසිය සිදු වන අවස්ථාවේ, මහජන බැංකුවේ අධීක්ෂණය යටතේ මහජන බැංකුවේ නිලධාරියෙක් හිටියා. ඒවාගේම කොමසාරිස්තුමාගේ අධීක්ෂණය යටතේ කොමසාරිස්තුමා පත් කරපු නිලධාරියෙක් හිටියා. සමූපකාරයේ සාමාන්‍යාධිකාරීවරයා හිටියා. සමූපකාරයේ තව සේවකයෝ හිටියා. අධ්‍යක්ෂ මණ්ඩලය හිටියේ පිටත. ඒ කිසිම දෙයකට තීරණයක් ගන්නේ නැතිව ඉතාමත්ම අත්තනෝමතික විධියට කොමසාරිස්තුමා කටයුතු කළේ, දේශපාලන වුවමනාවකට. දේශපාලන වශයෙන් පත් වුණු හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරීම තමයි කළේ. මේ පිළිබඳව අප්‍රසාදය පළ කරනවා. තවත් තිබෙනවා කාලය, එතුමාට. මේ පිළිබඳව සාධාරණයක් කරනවා නම්.

කොමාසරිස්වරයාගේ ක්‍රියාකලාපය පිළිබඳව විවිධ චෝදනා තිබෙනවා. සමූපකාරයේ උදවිය කියනවා කොමසාරිස්තුමා යම් යම් දේවල් ඉල්ලා සිටියා. වාහනවලට ඩීසල් ගහන්න කිව්වා. වාහන එහේ යවන්න කිව්වා. මුදල් ඉල්ලා සිටියා. ඒවා නොදුන් නිසා තමයි එතුමා මේ ක්‍රියාමාර්ගය ගත්තේ කියලා. නමුත් මේ ආකාරයෙන්ම වෙන්දේසි කරපු තවත් සමූපකාර තිබෙනවා. ඒ සමූපකාරවලින් යම් යම් වරප්‍රසාද ලබා ගන්නා නිසා ඒ සමූපකාරවලට විරුද්ධව මේ කොමසාරිස්තුමා ක්‍රියාකරන්නේ නැහැ. මෙතැනට විතරක් ක්‍රියාත්මක කළා කියන එක මම මේ සභාවේ ප්‍රකාශ කරමින්, මේ සඳහා සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා ඉල්ලා සිටිනවා. මොකද, මේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒ වන කොට පත් නොවුණු නිලධාරීන් ඉන්නවා. ඒ වාගේම ඒ අවස්ථාවේ නොසිටි නිලධාරීන් ඉන්නවා. ඒ හැම දෙනාටම මේ චෝදනාව එල්ල වෙලා තිබෙන නිසා මේකට සාධාරණයක් කරන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයේ දෙවැනි ලැයිස්තුවේ, ඒ කියන්නේ, සංයුක්ත ලැයිස්තුවේ ආරක්ෂාව පිළිබඳව පැහැදිලි කිරීම් කරලා තිබෙන්නේ රාජ්‍යයේ ආරක්ෂාව සහ ජාතික සුරක්ෂිතභාවය, අභ්‍යන්තර ආරක්ෂාව, නීතිය හා සාමය පැවැත්වීම හා පළමුවැනි ලැයිස්තුවේ අංක 01 දරන විෂයන්හි දක්වා ඇති ප්‍රමාණයන්ට හැර අපරාධ වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම කියන කාරණා තුළදී පළාත් සභාව ප්‍රමුඛව ක්‍රියා කළ යුතුයි කියන අදහස මේ තුළ ගම්‍ය වෙනවා. කෙසේ වෙතත් වර්ග සැතපුම් 25322 ක් වැනි කුඩා රටක් තුළ සිදු වන බොහෝ අපරාධ ලෙස, පෞද්ගලික දේපළ පැහැර ගැනීම්, ගෙවල් දොරවල් කඩා බිඳ, ඔවුන්ගේ දේපළ මංකොල්ලකෑම්, පෞද්ගලික ආයතනවල මූල්‍ය වංචාවන් ආදී වශයෙන් බලනකොට මේ පිළිබඳව විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පැවරෙන වගකීම තුළ නීතිය හා සාමය විෂයය යටතේ විශේෂ අවධානයක් ඔබතුමා මගින් අපට එතුමා වෙතට යොමු කිරීමට සිද්ධ වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙසේ යොමු කිරීමට සිද්ධ වෙන්නේ, මේ රට තුළ පසුගිය කාලය තුළ සිදු වුණු මිනී මැරුම් දෙස බලනකොට විශේෂයෙන්ම පසුගිය දවස්වල රත්ගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ ඝාතනය. එම්.ඩී. මෙන්ඩිස් ගරු සභාපතිතුමා සමඟ තව දෙදෙනෙක් මේ වනකොට මාරාන්තික තුවාල ලබලා රෝහල්ගතව සිටිනවා. ඔහුගේ ජීවිතය අවසාන වුණා. ඒ වාගේම කහවත්තේ මේ වනකොට 18 වැනි කාන්තාවත් මරණයට පත් වෙලා තිබෙනවා. මේ සිදුවීම් කොපමණ බිහිසුණුද කිව්වොත් අද මේ මොහොතකට පෙර කථා වුණේ, කාන්තාවක් නැති වුණාම කණේ තිබෙන එක කරාබුවක් නැති වෙනවාලු. ඒ කියන්නේ, මේ සිද්ධීන් සියල්ලටම පොදුවේ එක් අයෙක් සම්බන්ධයි කියන සටහනක් තබා තමයි මේ සිදුවීම් සිද්ධ වෙන්නේ. නමුත් තවමත් නිදැල්ලේ මේ අය මේ ක්‍රියාමාර්ගවල යෙදිලා ඉන්නවා. ඒ වාගේම

බණ්ඩාරගම පොලීසියේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයාව පසුගිය දින ගෙල කපා මරණයට පත් කරනවා. ඔහුගේ දේහය අදයි තමන්ගේ නිවසට රැගෙන එන්නේ. ඉතින් මෙවැනි තත්ත්වයන් යටතේ මේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් 104 දෙනෙක් කටයුතු කරනවා.

අපි ඉතිහාසයේ මෙවැනි අපරාධ රට තුළ දැක තිබෙනවා. මනුෂ්‍ය ජීවිතයට ගෞරවයක් නැතිව රට තුළ ක්‍රියාත්මක වුණු වකවානු. අපේ ජීවිතයේ අපට මතක ඇති කාලය 1971 වකවානුව. ඊට පස්සේ 1983, 1988, 1989. එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදී සංවිධානය පුරා වසර 30 ක් තිස්සේ කරපු සාපරාධී මිනී මැරුම්. ඒත් එක්කම ඔබතුමාට මතක ඇති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත්. අදත් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට ඉදිරිපත් වෙන්න හිටපු සියලුදෙනාම වාගේ ඝාතනයට ලක් වුණා. ආර්. ප්‍රේමදාස මැතිතුමා. ගාමිණී දිසානායක මැතිතුමා. ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා. ඒ වාගේම චන්ද්‍රිකා මැතිනිය ජීවත් වෙලා සිටියත් ඇහැක් අහිමි වෙලා ඉන්නවා. ඒ වාගේ මේ රටේ අනාගතය භාරගන්න ඉන්න රාජ්‍ය නායකයින් විශාල ප්‍රමාණයක් ඒ ත්‍රස්තවාදයේ ගොදුරන් බවට පත් වුණා.

ඒ වාගේම මේ සභාව නියෝජනය කරපු ගරු සුනිල් මෙන්ඩිස් මන්ත්‍රීතුමා. මොරටුව ආසනය නියෝජනය කරපු අපේ තරුණ අමාත්‍යවරයා, අපේ හිතවත් විරන්ත ප්‍රනාන්දු ගරු අමාත්‍යතුමා. ඒ වාගේම අපේ කෝකිලා ගරු මන්ත්‍රීතුමියගේ දයාබර සොහොයුරා අපේ හිතවත් නාමල් ගුණවර්ධන මන්ත්‍රීතුමා. මේ ආදී වශයෙන් මන්ත්‍රීවරු විවිධ අවස්ථාවලදී ඝාතනයට ලක් වුණා. මා දන්නේ නැහැ, මේවාට අදාළ ඝාතකයින් කීයෙන් කීදෙනෙක් සොයා ගන්න ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සමත් වුණාද කියලා. භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා. අපේ කවුන්සිල් එකේ නොවෙයි. පිට. මම කියන්නේ අපේ කවුන්සිලයේ ඝාතනයට ලක් වුණු ගරු මන්ත්‍රීවරු. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම අවධානය යොමු කරනවා. මේ අනාරක්ෂිත භාවය අද මේ මන්ත්‍රීවරු 104 දෙනාටත් තිබෙනවා. මේ පවතින මේ අපරාධ රැල්ලත් එක්ක. ඔවුන් නිරන්තරයෙන් මේ සමාජය තුළ විවිධ ප්‍රශ්නවලට මැදිහත් වන අය. ඊයේ පත්තරයක තිබුණා. මම දැන් අපේ ලේකම්තුමාත් එක්ක කථා කරන කොට හෙළිදරව් වුණේ. අනියම් සම්බන්ධතාවයක් පිළිබඳව තාත්තා පුතාට අවවාද කරනවා. තාත්තාට ගහලා මරලා දාන පුතා තමන්ගේ ත්‍රීවිල් රථයෙන් තාත්තාගේ ඇඟ උඩින් එහාට මෙහාට හත් අට පාරක් යනවා. ඒ කෝපය ඒ තරම් දරුණු විධියට තමයි පිරිමහ ගන්නේ. ඉතින් ඒ විධියට මේ මනුෂ්‍යත්වයේ තිබෙන ගෞරවණීය ස්වභාවය, මනුෂ්‍ය මනස තුළ තිබෙන මනුෂ්‍ය ගුණධර්ම දැඩි පිරිහීමකට ලක් වුණු වකවානුවක් බවට මේ වකවානුව පත් වෙලා තිබෙන නිසා මහජනයා තුළ නිරන්තරයෙන් ගැවසෙමින්, මහජන ප්‍රශ්නවලට මැදිහත් වන මේ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගරු ඔබතුමා මගින් නීතිය හා සාමය කටයුතු පිළිබඳව භාරව ඉන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු ආණ්ඩුකාරතුමාට විශේෂ වගකීමක් මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පවරලා තිබෙනවා. ආණ්ඩුකාරතුමාට. ආණ්ඩුකාරතුමා තමන්ගේ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව මීට වැඩිය දැඩි ක්‍රියාමාර්ගයකට ප්‍රවේශ වීම අතිශය වැදගත් කාරණාවක්. ගරු සභාපතිතුමනි, වුණාට පස්සේ අංජනන් එළි බලලා වැඩක් නැහැ. උණාට පස්සේ බලලා වැඩක් නැහැ. ඉස්සෙල්ලා ආරක්ෂාව සඳහා සුළු අවියක් දීලා තිබුණා. රටේ ආරක්ෂාව හොඳයි කියලා නැවත ඒක භාර ගත්තා. ඉස්සර පොලිසි නිලධාරීන් දෙදෙනෙකුගේ ආරක්ෂාව දීලා තිබුණා. මට මතකයි, ඉතිහාසයේ 1993 වාගේ වකවානුව වනකොට - පළාත් සභාව 88, 89 න් පටන් ගත්තේ භීෂණය නිසා. ඉතින් මොන තත්ත්වයක් යටතේ හරි අද දවස වන විට අපි ඉතාමත් කනගාටුවෙන් කියනවා, අද රටේ මිනිස්සු ජීවත්වන සමහර අය - මේ කිසිම රාජ්‍ය නායකයෙකුට අපි දොස් කියනවා නොවෙයි. කිසිම ආණ්ඩුවකට අපි දොස් කියනවා නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා ඉතාමත් අවිහිංසාවාදීයි. එතුමාගේ පාලන කාලය නිසා මේක සිද්ධ වුණායි කියලා අපි කියන්නේ නැහැ. මොකක් හරි යුද්ධයේ පසුගාමී තත්ත්වයක් නිසා වෙන්න පුළුවන්. වෙන විවිධ කාරණා නිසා වෙන්න පුළුවන්. අද වන විට නැවත ඝාතන රැල්ලක ආරම්භයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඔබතුමාගේ දැඩි අවධානය මේ සඳහා යොමු කරනවා. බස්නාහිර පළාත් ආරක්ෂක කමිටුවක් තිබෙනවා. ගරු ඔබතුමා මගින් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. අපට මේ පසුගිය මාස හතර ඇතුළත බස්නාහිර පළාත තුළ, අභ්‍යන්තරයේ ගෙවල් කැඩීම් කොපමණ සිදු වෙලා තිබෙනවාද? දේපළ මංකොල්ල කෑම්, ජීවිත හානි ආදී වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුව

[ ගරු ජගත් අංගගේ ]

තුළ ඇති වාර්තා අනුව අපේ ප්‍රදේශයේ දැන් වත්මන් ආරක්ෂක තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් අපේ ගරු මන්ත්‍රීවරුන්ට කරන්න පුළුවන් නම්, අපට පුළුවන් වෙයි රටේ යම්කිසි වෙනසක් ඇති කරන්නය කියලා යම් විධියක බලපෑමක් කරන්න.

පොලීසිය භාර අමාත්‍යතුමා, එතුමාටත් මේ පිළිබඳ වගකීමක් තිබෙනවා. මොකද හේතුව, විශේෂයෙන් බස්නාහිර පළාත කියන්නේ, සමස්ත රටේ අගනුවර. වැඩි බහුතර ජනතාවක් ජීවත්වන බලප්‍රදේශය. මේ ප්‍රදේශය තුළ ජීවත්වන සාමාන්‍ය සිවිල් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම. ඔවුන්ගේ පෞද්ගලික දේපළ පිළිබඳ ආරක්ෂාව තහවුරු කිරීම. ඒ වාගේම මේ මහජන නියෝජිතයින්ගේ නිතර මහජන ප්‍රශ්නවලට මැදිහත්වන මහජන නියෝජිතයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. මේ ආදී වශයෙන් විවිධ කේන්ද්‍රයන් තුළ, විවිධ දත්තයන් යටතේ මේ පිළිබඳ අවධානය යොමු කරලා, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු 104 දෙනාගේ ආරක්ෂාව පිළිබඳ වගකීම දරන්න කියන ඉල්ලීම ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරමින් ඔබතුමා මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ගයක් ගෙන මේ සභාවට වාර්තා කරන්නේ නම් ඉතා අගය කොට සලකන බව පවසමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම කථා කරන්නේ, පානදුර ශ්‍රී ලංගම ආයතනය පිළිබඳව ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් උද්ගත වෙලා තිබීම පිළිබඳවයි. මොකද, ඒකට හේතුව අපි දන්නවා. අපි විශේෂයෙන්ම අපේ රාජ්‍ය දේපළ විනාශ වුණාට පස්සේ - 89, 90 කාලයේ ජනතා විමුක්ති පෙරමුණ මගින් මේ රාජ්‍ය දේපළ ගිනි තියලා විනාශ කළාට පස්සේ බොහොම අමාරුවෙන් තමයි CTB ආයතන ලංගම ආයතන යන්තම් පණ ගැටගහගෙන ජනතාවට ඒ සේවය ලබා දුන්නේ. ඒ ලබා දීලා, මේ දේශපාලනයත් එක්ක - (බාධා කිරීමක්) ලංගම ආයතන ටික ජනතා විමුක්ති පෙරමුණ ගිනි තියපු හැටි ආයිත් අහගන්න ඕනෑ හින්දාද කොහෙද මේ කථා කරන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඡන්දයට බස් ගෙනිච්ච ඒවායේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බස් ටික ඔක්කොම ගිනි තියලා විනාශ කරලා බොහොම අමාරුවෙන් තමයි ඊට පස්සේ ගිය රජය කාලයේ අපි බස් ටික ගෙනල්ලා, අපි ඒ දුෂ්කර මාර්ගවලට ආලා ජනතාවට සේවය සැලසුවේ. ඒ සේවය සලසලා ඉන්නකොට අපි ඩිපෝවලට හොඳ ඩිපෝ අධිකාරිවරුන් පත් කළා. විශේෂයෙන්ම දැන් උදාහරණයකට ගත්තාම පානදුර ඩිපෝව වැටිලා තිබෙන අවස්ථාවකදී, එතුමාට ගරුත්වයක් හැටියට අපි මතක් කරන්න ඕනෑ. ප්‍රදීප් ප්‍රනාන්දු කියන ඩිපෝ අධිකාරීතුමා 2013 ජූලි මාසයේ 10 වැනිදා තමයි පානදුර ඩිපෝවේ වැඩ භාර ගත්තේ. ඒ වැඩ භාරගන්නකොට මෙහි තිබුණේ බස් 65 යි. නමුත් බස් 113 ක් අවශ්‍ය වෙලා තිබුණා. සේවකයන්ගේ වේතනය මාස තුනකින් ගෙවලා තිබුණේ නැහැ. ඒ කියන්නේ මේ වේතනය ගෙවන්න විතරක් එක්කෝටි විසි ලක්ෂයකට සමාන මුදලක් සොයන්න වෙලා තිබුණා. හැබැයි, මේ ඩිපෝ අධිකාරීතුමා 2010 අප්‍රේල් මාසය වන විට ඒ සේවකයින්ගේ සියලු හිඟ වැටුප් ගෙව්වා. හිඟ වැටුප් ගෙවලා ඒ මාසයේ පඩිය 08 වැනිදා දෙන්න තිබෙනවා නම් 06 වැනිදා දෙන තත්ත්වයට හැදුවා. ඒ විධියට සේවකයන්ට උපරිම සහන සැලැස්සුවා.

ඒ වාගේම ධාවනයට බස් 65 ක් තිබුණු එක බස් 92 දක්වා වැඩි කළා. පරණ බස් ටික හදලා, ඒ ගිනි තියපු බස් හදලා බස් ප්‍රමාණය 92 දක්වා වැඩි කළා. වැඩි කළා විතරක් නොවෙයි. අපි අධිවේගී මාර්ගයට CTB ආයතනයෙන්ම බස් දෙකක් අරන් දැම්මා. ඒ ආයතනයේ මුදල්වලින්ම. අපි දැක්කා, පැත්තකට කරලා තිබෙන සමහර බස් - එක බස් එකක් තිබුණා. ඒ බස් එකට ලක්ෂ 7 ½ යි වියදම් කළේ. ලක්ෂ 7 ½ ක් වියදම් කරලා අද අධිවේගී මාර්ගයේ ඒ බස් එක දුවනවා. අද බස් එකේ වර්තමාන වටිනාකම ලක්ෂ 80 ක්, 90 ක් විතර වෙනවා. පානදුර ඩිපෝව මේ තත්ත්වයට ගෙනාපු අධිකාරිවරයා, කෝටි ගණනක් ණය වෙලා තිබුණු ආයතනය, පඩි ගෙවන්න බැරිව තිබුණු ආයතනය මෙතුමා 2014 අප්‍රියෙල් වෙනකොට අංක 148200161993207 ඒ ඩිපෝවට අයිති ගිණුමේ

ලක්ෂ 43 කුත් මේ වනකොට ඉතිරි කරලා තිබෙනවා. එහෙම ඉතිරි කරලා තිබෙන ඩිපෝ අධිකාරිවරයාව ඒ සේවකයොත් විරුද්ධ වෙද්දී, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ සේවකයොත් විරුද්ධ වෙද්දී, මේ ඩිපෝ අධිකාරිවරයාව කිසිම හේතුවක් නැතිව - ඩිපෝ අධිකාරිවරයා දේශපාලනයට පත් වුණු කෙනෙක් නොවෙයි. මේ ඩිපෝ එක දියුණු කරන්නම පත් කරපු කෙනෙක්. ඒ ඩිපෝ අධිකාරිවරයාව අයින් කරනවා. අද අපේ දුෂ්කර ප්‍රදේශවල බස් රථ නවත්වලා. අද පාසල් යන දරුවන්ට, රැකියාවට යන දරුවන්ට, ගම්බද ඉන්න දරුවන්ට අද පාසලට යන්න විධියක් නැහැ. විශාල බස් ප්‍රමාණයක් අද නවත්තලා. ඩිපෝ එක නැවත පාඩු වෙන තත්ත්වයට ඇද වැටිලා. ඉතින් මම කියන්නේ, දේශපාලන අධිකාරිය හැටියට - විශේෂයෙන්ම මේ ආයතන විනාශ වුණේ දේශපාලනය නිසා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි පැහැදිලිව කියනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් ආවාම, හොඳ නිලධාරියෙක් හිටියත් ඒ නිලධාරියාව අයින් කරලා අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක් දානවා. යූ.ඇන්.පී. ආණ්ඩුවක් ආවම හොඳ නිලධාරියෙක් හිටියත්, ඒ විධියටම ඒ හොඳ නිලධාරිවරයාව අයින් කරලා යූ.ඇන්.පී. කෙනෙක් දානවා.

මම කියන්නේ පැහැදිලිව මෙන්න මේක වෙනස් වෙන්න ඕනෑ. යහපාලනය කියලයි මේ අය ආවේ. යහපාලනය කියලා ආපු නිසා මම පැහැදිලිව ඉල්ලා සිටින්නේ මේ යහපාලනය ජනතාවට පේන්න ඕනෑ. අද යහපාලනය කියන එක ජනතාවට පේන්න නැහැ. අද ජනතාව මේ යහපාලනය නිසා අන්ත අසරණ වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා මම පැහැදිලිව කියන්නේ, මේ වාගේ ආයතන විනාශ කරන විධියයේ වැඩ පිළිවෙළවල් කරන්න එපා. එක්සත් ජාතික පක්ෂ රජයෙන් අපි ඉල්ලා සිටින්නේ, ඒ ප්‍රවාහන ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ, මේ වාගේ දියුණු කරන අය - අද ඒ නිලධාරියා Head Office එකට වෙලා පැත්තකට වෙලා නිකන් බලාගෙන ඉන්නවා. මේක සත්‍යයද කියලා තමුන්නාන්සේලා සොයලා බලන්න. මේ ඩිපෝවේ කථාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බිල් ටික ගෙවන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බිල් ටික ගෙවන්න නොවෙයි ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ පාලනය කාලයේ අපේ පැතිවලට ගිහිල්ලා බලන්න. අහිංසක රබර් කපන මිනිස්සුන්ට අද අවුරුද්දේ කන්න විධියක් නැහැ. අද රබර් කපන මිනිස්සුන්ට කන්න විධියක් නැහැ. අද රබර් ගන්නේ නැහැ. අද තේ දළු ටික කඩන මිනිස්සුන්ට තේ දළු ටික විකුණ ගන්න විධියක් නැහැ. (බාධා කිරීමක්) අද තේ දළු ටික ගන්නේ නැති තත්ත්වයට පත් වෙලා. අද වී ටික විකුණ ගන්න විධියක් නැහැ. මේ යහපාලනය කියලා කථා කරලා - දැන් මේකේ පැහැදිලිව දෙයක් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ මොන්ටිසෝරි ළමයෙකුගේ චරිතය රඟපාන්න හදනවා. එවලේ කිව්වා, මේක පත් කරන්න කියලා. පත් කරන්න කියලා අද කියනවා, අපි එහෙම කිව්වේ නැහැ. අද මේක වැරැදියි කියලා. මේක වැරැදියි කියලා හරි යන්නේ නැහැ. අපි හිතුවා ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ, බුද්ධිමත් ජනතාවගේ පක්ෂයක් කියලා. අද ඒ මොන්ටිසෝරි කථා කියන්න එපා. මොන්ටිසෝරි කථා කියන්නේ නැතිව මේ ජනතාවට වෙලා තිබෙන විපත බලන්න. විපත බලලා මේකට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ. මේ ජනතාවට අඩු ගණනේ අවුරුද්දටවත් කන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*කාර්යපටිපාටි රීති අංක 57 හි කෙසේ සඳහන් වුවද 2015.03.18 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී කිනම් තීරණයකට එළැඹියද ඒ කිසිත් නොතකා අද දින සභා රැස්වීම විසිර යෑමෙන් අනතුරුව එළැඹෙන මීළඟ සභා රැස්වීම රැස්වන දිනය තීරණය කිරීම සඳහා මතු දැක්වෙන යෝජනාව ඉදිරිපත් කිරීමට මෙම පළාත් සභාව අවසර අපේක්ෂා කරනු ලබයි.*" යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද ඒ කිසිත් නොතකා කල් දැමිය නොහැකි ඉක්මණින් කළ යුතු කාර්යයක් ලෙස සැලකෙන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ ඉදිරි වැඩ කටයුතු නිම කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇති හෙයින්ද ඊට ගරු මන්ත්‍රීතුමන්ලාට ප්‍රමාණවත් කාලයක් ලබා දීමේ අටියෙන්ද ඉදිරියේදී එළැඹෙන උත්සව සමයේදී විය හැකි සන්නිවේදන සහ සමාජ කටයුතු අවම කර ගැනීමේ අපේක්ෂාවෙන්ද අද දින 2015.04.07 වන දින විසිර යැමෙන් අනතුරුව මෙම සභාව 2015 අප්‍රේල් මස 28 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2015 අප්‍රේල් මස 21 වන දින සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතු යැයි"* මා මෙම යෝජනාව ඉදිරිපත් කර සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

28 රැස් වෙන්න කියලා. අවුරුද්දත් එක්ක එළැඹෙන කාර්ය බහුලතාවය සහ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ වැඩ කටයුතු ටිකක් ඉතිරි වෙලා තිබෙන නිසා ඒ සම්බන්ධවත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාව එකඟයි නේද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභා කටයුතු ඇමැතිතුමා, ඒ ගමන්ම තව අදහසක්. මගෙන් කිහිප දෙනෙක්ම ඉල්ලීම් කරලා තිබෙනවා. මැයි 05 තිබෙන සභා රැස්වීමත් තියන්න පුළුවන් හැකියාව තිබේද? මොකද හේතුව, වෙසක් පෝයත් එක්ක කිට්ටුවෙන් නිසා. ඒකත් මේ ගමන්ම කථා කළා නම් ලෙහෙසියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු විපක්ෂ නායකතුමනි, මැයි 05 නියමිත සභා රැස්වීම නොපවත්වා සිටින්නට මන්ත්‍රීවරුන්ගේ - සභාපතිතුමා තමයි මේ අදහස ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඉල්ලීම් කිහිපයක් ඇවිල්ලා තිබෙනවා. වෙසක් දවසට පසු දින -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ආසන්න දිනයක් නිසාවෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙසක් එකට ගොඩක් කට්ටිය ඒවාට සහභාගි වෙලා, නිදි මරලා - මට ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා එකඟ නම් මට ප්‍රශ්නයක් නැහැ. ඒ සම්බන්ධව - ගරු සභා කටයුතු අමාත්‍යතුමා ගෙනාපු ඊළඟ යෝජනාවට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ. සභාව තියන්න ඕනෑ. පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, සභා රීති අංක 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඔබතුමා වෙත යොමු කරනවා. ගරු සභාපතිතුමනි, මේ හැන්සාඩ් වාර්තා සකස් කිරීම් සම්බන්ධව. 2015 මාර්තු 17 හැන්සාඩ් වාර්තාව. මේ හැන්සාඩ් වාර්තාවේ මා විසින් කරන ලද ප්‍රකාශයේ සමහර තැන්වල ඉතාමත් විකෘතිභාවයට පත් වෙලා තිබෙනවා. සමහර විට මේ සභාව තුළ සිදුවන බාධාවීම් තුළ හැන්සාඩ් වාර්තාකරුවන්ට නිවැරැදිව මේ කටයුතු කිරීමට

අපහසුතාවයක් වෙන්න ඇති. එවැනි අවස්ථාවක මම හිතන්නේ ඒ කථා කරන ලද මන්ත්‍රීවරයා සමඟ යම් විධියක කථිකාවක් ඇති කරගෙන මෙය නිවැරැදි කර ගැනීමට උත්සාහයක් දරනවා නම් මේ හැන්සාඩ් වාර්තාව මේ විකෘතිභාවයෙන් මුදා ගන්න පුළුවන්. කෙසේ වෙතත් සමහර තැන්වල මේ හැන්සාඩ් වාර්තාව පරිශීලනය කරන අයට මෙහි කියැවෙන්නේ කුමක්ද කියා අවබෝධ කර ගැනීමට බැරි තරම් වචනවල පරස්පරභාවයන් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, 2015 මාර්තු මාසයේ 17 වැනි දින මා විසින් කරන ලද ප්‍රකාශයේ හඬ පටිය මට ශ්‍රවණය කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියලා. මෙහි යම්කිසි වැරැද්දක් තිබෙනවා නම් එය නිවැරැදි කර ගැනීම සඳහා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔබතුමාට ඒක ලබා දෙන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මට ආරංචි වුණා. යම්කිසි සිද්ධියක් සම්බන්ධව. මම දැනට මාස 01 ½ කට විතර පෙර සෞඛ්‍ය සේවා පළාත් භාර අධ්‍යක්ෂකතුමියට ලිපියක් ඉදිරිපත් කළා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමිය අද වනතුරු ඒ ලිපියට, මට ඒ ලිපිය ලැබුණයි කියලාවත් පිළිතුරක් එව්වේ නැහැ. ඒ නිසා මම විතරක් නොවෙයි. මේ පළාත් සභාවේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයෙක් තමන් යම් කාරණයක් පිළිබඳව විමසීමක් කළාම, මේ පළාත් සභාවේ අදාළ නිලධාරීන් ඒ වෙනුවෙන් පිළිතුරු දෙන්න බැඳී නැත්නම් අපේ වරප්‍රසාද තමයි අහිමි වී යන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම මන්ත්‍රීවරු හැටියට පළාත් සභාව තුළ නිලධාරීන්ට යම් ලිපි නිකුත් කළාම, යැව්වාම - මේ පිළිබඳව මම විශේෂයෙන්ම ඔබතුමා හරහා ගරු සෞඛ්‍ය ඇමැතිවරයාගෙන් ඉල්ලීමක් කරනවා. අපට සමහර වේලාවට දැනෙනවා මේ නිලධාරීන් ප්‍රධාන අමැතිවරයාටත් වැඩිය ඉහළින් ඉන්නවා කියලා. එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. මේ නිලධාරීන් සියලු දෙනාම ප්‍රධාන අමාත්‍යවරයා, කැබිනට් මණ්ඩලය, සභාපතිවරයා, මන්ත්‍රීවරු ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා තමයි කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මේ තත්ත්වය දිගින් දිගට ගියොත් එහෙම මේ පාලනය අවිධිමත් පාලනයක් බවට පරිවර්තනය වෙනවා. ඒ නිසා අදාළ තත්ත්වය අපට පැහැදිලි කරලා, අපි යවන ලිපිවලට වහාම පිළිතුරු සපයන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මමත් ඒ කාරණාව පිළිබඳව - මම මේ පළාත් සභාව 1993 සිට නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මට අතීතය මතකයි. හැම සභාවකටම ප්‍රධාන ලේකම්තුමා සහභාගි වෙනවා. අමාත්‍යාංශ ලේකම්වරු, නිලධාරීන් සහභාගි වෙනවා. ඒ වාගේම මන්ත්‍රීවරයෙකුගේ ලියුමකට, කාරණාවකට ඒ අය ඍජුව මැදිහත් වෙලා අවශ්‍ය පහසුකම්, උපදෙස් ලබා දෙනවා. මෙතුමාගේ කාරණාව සම්බන්ධයෙන් එය බොහොම කනගාටුදායක සිද්ධියක්. විපක්ෂ නායකතුමා, මන්ත්‍රීවරයෙක්. එතුමාගේ ලිපියට තවම පිළිතුරක් නැහැයි කිව්වාම ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව මම විශේෂයෙන්ම ගරු විෂයය භාර අමාත්‍යතුමාට එය ඉදිරිපත් කරනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න. සොයා බලන්න.

අනික් එක මම විශේෂයෙන් අපේ අනිකුත් නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා, අඩුම වශයෙන් සභාව පැවැත්වෙන්නේ මාසයකට දවස් දෙකයි. ඒ දවස් දෙක තුළවත් මේ නිලධාරීන්ගේ කාමරයට ඇවිල්ලා ඉන්නවා නම් මම හිතන්නේ, මේ තිබෙන ප්‍රශ්න ගොඩක් අවම කරන්න පුළුවන් හැකියාව අපට තිබෙනවා. දැන් ප්‍රධාන ලේකම්තුමිය කාලයකින් මේ සභාවට ඇවිල්ලා ඉන්නවා මම දැක්කේ නැහැ. අමාත්‍යාංශ ලේකම්වරු එන්නේ නැහැ. නිලධාරීන් එනවා අඩුයි. කරුණාදාස මහත්මයා හැමදාම ඇවිල්ලා ඉන්නවා. එතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අනික් අමාත්‍යාංශවල නිලධාරීන් එන්නේම නැහැ. ඒ දවස්වල නිලධාරින්ගේ කාමරය පිරිලා තිබෙනවා. අපේ අනික් මන්ත්‍රීතුමන්ලාට මතක ඇති. වරදින්නේම නැහැ, ප්‍රධාන ලේකම්තුමා ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මම ලේකම්තුමාට දැනුම් දෙනවා මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නය කියලා. ඊළඟ සභාවටත් අඩුම වශයෙන් ඒ නිලධාරීන්ට සහභාගි වෙන්න කියලා අපි විශේෂ ඉල්ලීමක් කරනවා. මේ කාරණා සම්බන්ධයෙන් ඔබතුමා කඩිනම්ව සොයා බලා එතුමාට උත්තරයක් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට විනාඩියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඒ මුහුණ දීලා තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් මම ඉතාම කනගාටු වෙනවා. මොකද, එතුමා බොහොම කැමැත්තෙන් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට පැමිණියේ. මම ඒ ගැන බලවත් සේ සතුට පළ කළා. මොකද, ඒ සම්බන්ධව මැදිහත්වීම පිළිබඳව. මේ කාරණාව සම්බන්ධයෙන් සිදු වුණු අපහසුතාවය ගැන කනගාටු වෙනවා. මම ඉතාම කාරුණික වෙනවා, එතුමා වෙනුවෙන් හැකි ඉක්මණින් මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, ඔබතුමා ඒකට ඍජුව මැදිහත් වෙන්න.

න්‍යාය පත්‍රය අනුව මීළඟට තිබෙන්නේ පොදු කටයුතු. නමුත් මා වෙත කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ යෝජනා දෙකක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එක යෝජනාවක් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. අනික් යෝජනාව ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. මම විශ්වාස කරනවා, කාලය ඉතිරි වෙනවා නම් මට යෝජනා දෙකම ගන්න පුළුවන්. ඒ නිසා මම පළමුවෙන්ම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා එතුමාගේ රීති අංක 107 යටතේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

*ගරු සභාපතිතුමනි, "පොදු වැදගත් කමකින් යුක්ත වූද හදිසි වූද මතු ඉදිරිපත් වන මන්ත්‍රී යෝජනාවන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට අනුෂාංගිකව රීති අංක 8(5), 8(6), 15(1), 15(2), 15(3), 15(5), 53(2), 53(3), 57(1), 57(2), 57(5) යන රීතීන් අත්හිටු විය යුතු යැයි" යෝජනා කරනවා.*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION : I

## බස්නාහිර පළාත් සභාවේ සහකාර හැන්සාඩ් සංස්කාරක තනතුරට හා හැන්සාඩ් වාර්තාකරු/ලඝු ලේඛක තනතුරට 06/2006 චක්‍රලේඛයෙන් සිදු වූ අසාධාරණය වෙනුවෙන් සහනයක් ඉල්ලීම
REQUESTING A RELIEF FOR THE INJUSTICE CAUSED BY CIRCULAR NO. 06/2006 TO THE POSTS OF WESTERN PROVINCIAL COUNCIL ASSISTANT HANZARD EDITOR AND HANZARD REPORTER/ STENOGRAPHER

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

*ගරු සභාපතිතුමනි, "බස්නාහිර පළාත් සභාවේ හැන්සාඩ් වාර්තාව සකස් කරන්නේ සභා ලේකම් කාර්යාලයේ හැන්සාඩ් අංශයයි. පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූලව එකී වාර්තාව සකස් කරන නිලධාරීන් හතර දෙනාගේ තනතුරු සම්බන්ධයෙන් බලවත් අසාධාරණයක් 06/2006 චක්‍රලේඛය නිසා සිදු වී ඇත.*

*දීමනා රහිතව වසර 13 ක කාලයක් තිස්සේ හැන්සාඩ් සංස්කාරකගේ රාජකාරී කටයුතු ආවරණය කරමින් රාජකාරී කරන සහකාර හැන්සාඩ් සංස්කාරක තනතුරට විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් තිබියදී මෙතෙක් උසස්වීම් නොදී කළමනාකරණ සහකාර සේවයේ වැටුප් තලවල පිහිටුවා ඇත.*

*වසර 10 කට අධික කාලයක් තිස්සේ සේවයේ නියුතු ස්ථිර හැන්සාඩ් වාර්තාකාරිණියන් තිදෙනාගේ තනතුරුද නිසි පරිදි*

*06/2006 චක්‍රලේඛය ප්‍රකාරව අන්තර්ග්‍රහණය නොකොට කම්කරු ශ්‍රේණියේ වැටුප් තලයක පිහිටුවා ඇති අතර මෙතෙක් කිසිදු උසස්වීමක් ලබා දී නැත.*

*මේ නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලත් බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව පත්වීම් ලැබූ සහකාර හැන්සාඩ් සංස්කාරක නිලධාරියාටත් හැන්සාඩ් වාර්තාකාරිනියන් තිදෙනාටත් 06/2006 චක්‍රලේඛය අනුව සිදු වූ අසාධාරණය ඉවත් කොට සාධාරණයක් ඉටු කරන මෙන් ගරු ආණ්ඩුකාරතුමාගෙන්ද, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්ද මධ්‍යම රජයේ ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාගෙන්ද හා ගරු පළාත් සභා අමාත්‍යතුමාගෙන්ද මෙම ගරු සභාව ඉල්ලා සිටින්නීය."*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා මේකට පොඩි සංශෝධනයක් ගේන්න. මේක අදාළ වෙන්නේ නැහැ. මම ඒකයි මේ ලේකම්තුමාත් එක්ක කථා කළේ. මෙතැන අපේ බාධාවක් නොවෙයි තිබෙන්නේ. මේක අපි යෝජනා කරමු, ගරු ආණ්ඩුකාරතුමා හරහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් - එහෙම නැත්නම් මුදල් ඇමැතිතුමා කළමනාකරණ සේවා එකෙන් අනුමැතිය ලබා දෙන්නය කියලා රජයෙන් ඉල්ලීමක් කරනවා කියලා යෝජනාවක් විධියට ගේමු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් ගරු මහ ඇමැතිතුමා ගරු සභාපතිතුමා, කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවක් තිබෙනවා නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක යටතේ ඇයි මේකට පියවරක් ගත්තේ නැත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තීන්දුවක් ක්‍රියාත්මක කරන්න බැහැ. ඒකෙන් කරන්නත් බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක වෙලා තිබෙන්නේ, කාඩර් එකට මේක ඇතුළත් කරලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතකොට කළමනාකරණ සේවා එකෙන් අනුමැතිය ගන්න ඕනෑ. කළමනාකරණ සේවා එකෙන් ඒකට අනුමැතිය දීලා නැහැ. ඒක නිසා තමයි අපි යෝජනා කරන්නේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි කියන්නේ, මේ කටයුත්ත අවුරුදු 15 ක් තිස්සේ නොකෙරුණු නිසා. ඒක නිසා මේක ඉක්මණට කරන්න කියලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපි අතරේ ප්‍රතිවිරෝධයක් නැහැ. අපි හැමෝම එකඟයි. ඉතාම සංවේදී ප්‍රශ්නයක්. මෙහි තිබෙන අඩුපාඩුකම් සංශෝධනය කරගෙන ඉදිරි කටයුතු කරන්න තියෙන්නේ. ඒ නිසා මහ ඇමැතිතුමාට හැඟෙන විධියට මේ තිබෙන යෝජනාවේ කුමක් හෝ සංශෝධනයක් තිබෙනවා නම්, මෙය ක්‍රියාත්මක කරන ආකාරයට සංශෝධනයක් ගේන්න ඕනෑ. අපි හැමදෙනාම එකඟ ඒකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම මේ කාරණාව බස්නාහිර පළාත් සභාවේ අපට අයිති කාරණාවක් නොවෙයි. මධ්‍යම රජයේ වැටුප් හා

[ ගරු සභාපතිතුමා ]

සේවක කළමනාකරණ කමිටුවෙන් අනුමත වෙන්නත් ඕනෑ. මට මතකයි මේ පිළිබඳව පෙත්සම් කාරක සභාවටත් පෙත්සමක් ඉදිරිපත් කරලා තිබුණා. ඊළඟ පෙත්සම් කාරක සභාවේදී අපි සාකච්ඡාවට ගන්නවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව මම රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා හමු වුණා, මේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙක් එක්ක. ඒ වේලාවේ එතුමා මේ පිළිබඳව ගරු ආණ්ඩුකාරවරයා දැනුවත් කරලා ආණ්ඩුකාරතුමා මගින් අදාළ වැටුප් සංශෝධනයට කටයුතු කරන්න කළමනාකරණ කමිටුවට යොමු කරන්න එතුමා අවශ්‍ය කටයුතු කරනවයි කියන එක මතක් කළා. ඒ නිසා එක පැත්තකින් මම හිතන්නේ විධිමත්ව කිරීම සඳහා තමයි ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා කිව්වේ ගරු ආණ්ඩුකාරතුමාගේ නිර්දේශ මත මේ කටයුත්ත කරමුයි කියලා. දීර්ඝ කාලයක් තිස්සේ මේ ගැටලුව අදාළ නිලධාරීන්ට තිබෙනවා. ඒ නිසා මෙය ඉටු කරලා දෙන එක සාධාරණයි. යුක්ති සහගතයි. ඒ නිසා මේ පිළිබඳව පළාත් සභාව විධියට අපේ පැත්තෙන් කරන්න පුළුවන් උපරිම මැදිහත්වීම කරලා, ඉටු කරලා දෙන්න අවශ්‍ය කටයුතු කරමු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, මීට කලින් මේ සභා ලේකම් කාර්යාලයේ හුඟාක් අය කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටියේ. ඊට පස්සේ අපේ පනතේ තිබෙන බලතල අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඔබතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, මේ සභාවේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න සභා ලේකම් කාර්යාලයට කී දෙනෙක් අනුයුක්ත කරලා තිබෙනවාද කියලා. ඒක අපි දැනගත්තොත් අපට පුළුවන් මොකක්ද මේ හැන්සාඞ් අංශයේ රාජකාරී කරන අයව නිවැරැදි වැටුප් තලයේ තියාගෙන සේවාව ලබා ගන්නේ කොයි ආකාරයෙන්ද කියන එක අපට නිවැරැදිව තේරුම් කරගන්න පුළුවන්. අරකේ අනුමත වෙලා තිබෙනවා නම් මේ හැන්සාඞ් වාර්තාකරන අය වෙනුවෙන් ඒ වැටුප ගෙවීම අවශ්‍යයි. එහෙමනම් කොහෙටවත් දාන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද සභාව ගෙනි යන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි. මේ සභාව ගෙනි යන්න සභා ලේකම් කාර්යාලයට කොපමණ නිලධාරීන් ප්‍රමාණයක් අනුයුක්ත කරගෙන තිබෙනවාද? ඒක පොඩ්ඩක් ඔබතුමන්ලා අපට දැනුම් දෙන්න. එතකොට අපි කියන්නම් ඊළඟට මොකක්ද කරන්න ඕනෑ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ, තිබෙනවා නේ. ඉස්සර කොන්ත්‍රාත් පදනම මත තමයි හුඟක් අය හිටියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉස්සර එහෙම කළා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි. දැනට 48 ක් ද කොහෙද මම දන්න විධියට - මට මතකයි 48 ක් ඉන්නවා. ඒ ඉන්න අය රියැදුරන් මේ ගොල්ලෝ. අනික් අය මේ ගොල්ලෝ. එහෙම නම් කරලා තිබෙනවා. මට මතකයි එදා ඒ විධියට ඇවිදින් වැටුප් තල හා සේවාවන් ස්ථිර කිරීම සභා ලේකම් කාර්යාලයේ කොපමණ ඉන්නවාද කියන එක එදා අපි සම්මත කර ගත්තා. ඒක තිබෙනවා නම් වෙන කොහෙටවත් යන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාඩර් එකේ සංඛ්‍යාව අනුව 48 ක් අනුමත කරලා තිබෙනවා. නමුත් වැටුප් තලය අනුමත කරලා නැහැ, මේකේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කාඩර් එක තිබෙනවා නම්, වැටුප් තල තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාඩර් එක තිබෙනවා. වැටුප් සම්බන්ධව අනුමත කිරීමක් කරලා නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

තනතුර තිබෙනවා නම් තනතුරට හැන්සාඩ් කියලා දෙන්න ඕනෑ. දැන් අපි කියමුකෝ නියෝජ්‍ය සභාපති කියලා තිබෙනවා නම් නියෝජ්‍ය සභාපතිට ඒ වැටුප දෙන්න ඕනෑ. සභාපති අර පනතෙන් සම්මතයි නම් ඔබතුමා නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හරියි කියලා ඒක දෙන්න ඕනෑ. ඒක අහ අහා කෙහෙන්වත් ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේකේ කොපමණ සංඛ්‍යාවක් ඉන්නවාද? ඒ සංඛ්‍යාව මොන මොන තනතුරුවටලද ඉන්නේ කියන එක පොඩ්ඩක් ප්‍රකාශ කරන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා, අපේ ධූරධාරීන්ගේ තනතුරු වාගේ නොවෙයි රජයේ සේවකයින්ගේ බඳවා ගැනීම් පටිපාටියට අනුව කෙරෙන්නේ. ඒ නිසා ඒ තුළ තමයි අපට යන්න සිද්ධ වෙන්නේ. සභාවට තීරණය කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔය වාගේ ගැටලුවක් ඉස්සෙල්ලා ආවා, ගරු සභාපතිතුමා. ඇවිදින් ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රාජ්‍ය සේවකයින් බඳවා ගැනීමේ පටිපාටියක් තිබෙනවා. ඒ අනුව තමයි බඳවාගෙන තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ ක්‍රමවේදය තුළ තමයි මේ සංඛ්‍යාව දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අභිබවා අපට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. අපට පුළුවන් ධූරධාරීන්ගේ මේ මේ -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ ප්‍රශ්නය ඒ තනතුරුවල ඉන්න අය කොයි කොයි තනතුරුවලද ඉන්නේ කියලා ප්‍රකාශ කරන්න කෝ. මන්ත්‍රීවරුන්ට දැනගන්න. එතකොට ඉවරයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනුමත කාර්ය මණ්ඩලය 48 ක් ඉන්නවා.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය දැන ගැනීම සඳහා අහන්නේ. දැන් මේ හැන්සාඩ් සංස්කාරක තනතුර අවුරුදු කීයක් තිස්සේ ඉඳන් හිස්ව තිබෙනවාද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අවුරුදු 13 ක් මේ ගොල්ලෝ වැටුප නැතිව වැඩ කරනවා. ඒක සම්මත වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි කැමැතියි. අපේ කිසිම අකැමැත්තක් නැහැ. අපේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

වැටුප නොදී ඉන්න එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ. තනතුර තිබෙනවා නම් වැටුප් ගෙවන එක ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන් වැටුප් දෙන්න ලැහැස්තියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

විපක්ෂ නායක ධුරයටත් ඕකම ආවා. ඒවාත් එක්ක තමයි ඕක සම්බන්ධ වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මධ්‍යම රජයෙන් කළ යුතු කාරණාවක් මේක. ලබා දෙන එක.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, දැන් මම මේ සභාවේ සභාපතිවරයෙක් හැටියට කාලයක් කටයුතු කළා. හැන්සාඩ් වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා සහකාර හැන්සාඩ් සංස්කාරක හා හැන්සාඩ් වාර්තාකරුවන් සෑහෙන කාලයක් තිස්සේ, ඒ අය කළමනාකරණ සේවයේ පත්වීම්. ඒ වැටුප් තලයේ තියාගෙන තමයි සේවය ගත්තේ. ඉතින් විවිධ අවස්ථාවලදී යෝජනා වෙනවා, මේ කාඩර් එකට හැන්සාඩ් වාර්තාකරු කියන නාමය යෝජනා කරලා ඒ තනතුර අනුමත කරගෙන වැටුප් තලයක පිහිටුවන්න කියලා. වැටුප් තලයක පිහිටුවන්න යෝජනා කළාම මේ පිහිටුවන්නේ MN - 4 වැටුප් තලයේ. එතකොට ඒ වැටුප් තලය තුළ මේ තනතුර ස්ථාපනය කිරීමේදී විශාල අසාධාරණයක්. මේක පැහැදිලි කිරීමක් කරලා, නිවැරැදි කිරීමක් කරගන්න අදාළ වැටුප් කොමිසමත් එක්ක කථා කරන්න ඕනෑ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මේ තනතුර ස්ථාපනය කිරීම සම්බන්ධව බද්ධ වෙලා මේ කාරණාව ඉෂ්ට කරන්න. ඒ නිසා මේක අපේ මට්ටමෙන් කරන්න පුළුවන් වැඩක් නොවෙයි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා වගේ. හැබැයි, සභා ලේකම්තුමා මේ වාර්තාව හරිගස්සලා ඉදිරිපත් කරනවා නම්, අපේ කැබිනට් මණ්ඩලයේත් නිර්දේශයත් ඇතිව යොමු කළා නම් වඩාත් ගැලපෙනවා. මොකද හේතුව, මේක ඉක්මණින් කරන්න ඕනෑ වැඩක්. මේ අය කරන සේවය අපට හෑල්ලු කරන්න බැහැ. මොකද පාර්ලිමේන්තුවේ මේ වැඩේ කරන්න හැටක් හැත්තෑවක් සෙනඟ ඉන්නවා. මේ තුන්දෙනෙක් එක්ක ඉඳගෙන මේ බජට් එකක් කවර් කරනවා කියන්නේ, ලොකු වැඩක්. මෙච්චර විශාල කටයුත්තක යෙදිලා ඉන්න නිලධාරීන් පිරිසක් හැටියට අපෙන් වෙන්න ඕනෑ යුතුකම් ඉෂ්ට වෙන්න ඕනෑ නිසා සභා ලේකම්තුමා මගින් ඉක්මණින් මීට අදාළ ලියවිලි සකස් කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා කැබිනට් නිර්දේශයත් සමඟම යොමු කරනවා නම් මම හිතනවා ඉතාමත් වැදගත් වෙයි කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අවුරුදු 13 ක් කියන්නේ සුළුපටු කාලයක් නොවෙයි. එකී මෙකී කාලය තුළ කොයිතරම් සභා ලේකම්වරු පත් වෙන්න ඇත්ද? මම කියන්නේ, මේ කාරණය නිලධාරිවාදයට යට වෙලා තිබෙන්නේ. මේක තමයි Bureaucracy. මොකද අපි දන්නවා, පාර්ලිමේන්තුවේ 225 ක් මන්ත්‍රිවරුන්වරුන්ට හැට ගණනක් හැන්සාඩ් නිලධාරීන් ඉන්නවා. මේ හැන්සාඩ් එක රජයේ මුද්‍රණාලයට ගියාම ඒකේ සෝදුපත් ටික බලන්න, කියවන්න, ටයිප් කරන්න වෙනම පිරිසක් ඉන්නවා. දැන් මේ කාර්ය මණ්ඩලය තනියෙන් ඒ සියල්ල කරන්නේ. 104 දෙනෙක්ගේ වැඩ. මම කියන්නේ, අවුරුදු 13 ක් මේ ප්‍රශ්නය විසඳගන්න බැහැයි කිව්වා නම්, අපේ මේ සභාවේ ඒ සඳහා වගකීමක් නැත්නම්, එහෙමනම් මේක නිලධාරිවාදය නොවෙයිද? මම කියන්නේ, මේවා නිලධාරිවාදයට යට වෙන්න දෙන්න එපා. කරුණාකර 2002 අනුමත කළ ගරු ආණ්ඩුකාරතුමාගේ පටිපාටියට අනුව නේ මේක කරලා තිබෙන්නේ. දැන් ඒකත් මේ නිසා උල්ලංඝණය වෙලා නේ තිබෙන්නේ. ඒ නිසා මේ වැටුප් නියම තලයේ නොපිහිටුවීම, ඔවුන්ට නියමිත - සේවයක් ගන්නවා නම් ඒ සේවකයාට අවශ්‍ය නියමිත තනතුර දෙන්න එපැයි. ඔවුන් කරන රාජකාරියට නියමිත තනතුර දෙන්න එපැයි. ඒ නිසා මම හිතන්නේ මේ කාරණය ඉතාම බරපතළ කාරණයක්. හැකි ඉක්මණින් - මේකට වග කියන්න ඕනෑ නිලධාරින්. මම කියන්නේ නැහැ, ප්‍රධාන ලේකම්ද කවුද කියලා. හැබැයි මේක නිලධාරී වාදයට යට වෙලා තිබෙන්නේ. මෙය හැකි ඉක්මණින් නිවැරැදි කරන්න කියලා සියලු දෙනාගේම සහාය ලබා දෙන්න කියලා මම ගරු සභාපතිතුමනි, ඉල්ලා සිටිනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය තිබෙනවා. 2002 ජූනි මාසයේ 09 වැනි දින අසෝක අතුරුගිරිය මහත්මයා, ආණ්ඩුකාරතුමාගේ ලේකම්තුමා. එතුමා අපේ සභා ලේකම් කාර්යාලයට 74 දෙනෙකුගෙන් යුක්ත වුණු කාර්ය මණ්ඩලයක් සඳහා අනුමැතිය දීලා තිබෙනවා. ඒකේ හැන්සාඩ් සංස්කාරක, සහකාර හැන්සාඩ් සංස්කාරක කියලා

තනතුරු දෙකක්. මේක ක්‍රියාත්මකද? එහෙම නැත්නම් අක්‍රියද කියන එක තමයි අපට දැනගන්න ඕනෑ. මේකේ නම් පේන්න තිබෙන්නේ මකලා තිබෙනවා. මොකක්ද එතකොට මේකේ වාර්තාව. ඊට පස්සේ තව එකක් තිබෙනවා, හැන්සාඩ් වාර්තාකරු/ලඝු ලේඛක සිංහල, ඉංග්‍රීසි කියලා. ඊට පස්සේ තව එකක් තිබෙනවා, සිංහල ලඝු ලේඛක. දෙමළ, ඉංග්‍රීසි. දැන් මේ විධියට තිබෙනවා. දැන් මේක ක්‍රියාත්මකද? අක්‍රියද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඕක ගොඩාක් වෙනස් වෙලා තිබෙන්නේ. අඩු වෙලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් හැත්තෑ ගණනක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේක ඉස්සෙල්ලා අනුමත කරගත්තා නම් ඉවරයි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමා ප්‍රකාශ කරනවා, සභාවට ඉදිරිපත් කරන්නය කියලා. දැන් තනතුරු නාම වෙනස් වෙලා තිබෙන්නේ. 2006 චක්‍රලේඛයක් අනුව තනතුරු නාම ඔක්කොම වෙනස් වෙලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි කියන්නේ ගරු සභාපතිතුමනි, ඇයි මේ අයට මේක ගෙවන්නේ නැතිව මෙපමණකල් මේ විධියට ක්‍රියාත්මක කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුරුත් විරුද්ධ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකට කවුරුත් විරුද්ධ නැහැ. කිසි කෙනෙක් විරුද්ධ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සභා සම්මතයක් අනුව ගෙවන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා සම්මතයක් අනුව මේක ගෙවන්න අමාරුයි මම හිතන්නේ. සභා සම්මත කරලා ගෙවන්න පුළුවන් නම් අපි මෙලහකට ගෙවනවා. එහෙමනම් ගෙවලා ඉවරයි. සභාවේ කවුරුත් විරුද්ධ නැහැ. මහ ඇමැතිතුමා එකඟයි. විපක්ෂ නායකතුමා එකඟයි. මන්ත්‍රීවරු එකඟ නම් කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒක එහෙම ගෙවන්න පුළුවන් නම් මෙලහකට අපි ඒක ගෙවනවා. අපේ විරුද්ධත්වයක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි එකඟයි. සභාවේ සම්මත කරලා කැබිනට් එකට දමන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ අය කරන සේවය දිහා බැලුවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලොකු සේවයක් කරනවා. විශාල සේවයක් කරනවා. අපි ඒක අගය කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලික අයිතිවාසිකමක් කඩ වෙලා තිබෙනවා. ඊට වැඩිය බරපතළයි අධිකරණයට ගියොත් එහෙම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දන්නවා ඒක. කවුරුවත් මේකට විරුද්ධ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට හිතෙන්නේ, දැන් ප්‍රශ්නය අපට මෙතැන විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේක හරි පැහැදිලිව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මඟින් විසඳාගත යුතු ප්‍රශ්නයක්. නමුත් මේකට දැන් මැදිහත් විය යුතුයි, සභා ලේකම්තුමා. සභා ලේකම්තුමා මැදිහත් වෙලා විසඳගන්න ඕනෑ, වැටුප් හා සේවක කොමිෂන් සභාවෙන්. ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කළොත් හොඳයි කියලා තමයි මම කියන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ප්‍රශ්නය පැහැදිලියි. සභාවක් විධියට මේ සභාවේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යන්න අපි හැමෝම මැදිහත් වෙනවා. මම හිතන්නේ සභා ලේකම්වරයාත් මේකට මැදිහත්වීමක් කරලා තිබෙනවා, සියලු නිලධාරීන්. ඒ නිසා මෙහි කොහේ හරි ගැටලුවක් තිබෙනවා නම් - අපට ගැටලුව පෙනෙනවා. අපි මහ ඇමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් සියලු පක්ෂ නියෝජනය වන ආකාරයේ මොකක්ද මේ සිද්ධ වුණේ? කොතැනද අපට මේක පන්නගන්න පුළුවන්. මොකක්ද බාධාව කියලා ඔබතුමාත් මැදිහත් වෙලා ඉක්මන් විසඳුමක් දෙන ආකාරයේ, කමිටුවක් දාලා මේක ඉස්සරහාට අරගෙන යමු කියන යෝජනාව කරන්නේ. නැත්නම් මේ කාට කාටවත් චෝදනා එල්ල කරමින් ඉන්න නොවෙයි. මේ අයට සාධාරණයක් වෙන්න ඕනෑ. ඒකට අපි මැදිහත් වීමක් කරමුයි කියන යෝජනාව අපි කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධයෙන් දැන් යෝජනාවක් ඉදිරිපත් වුණා. කිසි කෙනෙක් ඒකට විරුද්ධ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත් සහයෝගය තිබෙනවා. විපක්ෂ නායකතුමාගේත් සහයෝගය තිබෙනවා. මන්ත්‍රීවරු ඔක්කෝම එකඟයි. නමුත් මේ සම්බන්ධයෙන් සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමා තුන් වතාවක් ඔය සේවක හා වැටුප් කළමනාකරණ කමිටුවට තුන් වතාවක් ලියලා තිබෙනවා, මේවා වැඩි කර දෙන්නය කියලා. නමුත් කිසිම වැඩි කිරීමකට ඒ අය එකඟ නැහැ. ඒ නිසා මේ යෝජනාව, මේ එකඟතාවයත් එක්ක අපි එතැනට යවමු. ආණ්ඩුකාරතුමාගේ අනුමැතියත් අරගෙන අපි එතැනට අරිමු. ප්‍රශ්නයක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සභා යෝජනාව ආණ්ඩුකාරතුමාට යැව්වාම රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා මඟිනුත් ආණ්ඩුකාරතුමාට එනවා. එතකොට අපි ඒකමතිකව මේක තීන්දු තීරණ ගත්තාම එතුමාටත් මේ කටයුත්ත කරගන්න අමාරු නැහැ. ඊට එහා දේ අපට ආණ්ඩුකාරතුමාත් හමු වෙලා නැවත වරක් කථා කරන්න පුළුවන්කම තිබෙනවා. කොහොම නමුත් මේකේ දිගින් දිගටම - මම දන්නේ නැහැ. මට කියලා නැහැ. නමුත් හිතෙනවා, මේකේ ඇතුළේ සමහර අයගේ තිබෙන අකැමැත්ත තමයි හැන්සාඩ් සංස්කාරකවරුන්ට තිබෙන වැටුප් වැඩිවීමේ හේතුව කියලා චෝදනාවකුත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න නහන්න එපා, සභා ලේකම් කාර්යාලයට.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. නැහැ. අනවශ්‍ය ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් නැහැ. සභා ලේකම් කාර්යාලයේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැරැදි ප්‍රකාශයක් කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා ගැන නොවෙයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම් කාර්යාලයේ මම සභාපතිවරයා වශයෙන් කියන්නේ, ටීම් එකක් වශයෙන් වැඩ කරන ආයතනයක් සභා ලේකම් කාර්යාලය කියන්නේ. සභාවේ ප්‍රකාශ කිරීමෙන් පොඩි පොඩි -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි ගරු සභාපතිතුමනි, යමෙකුට වරප්‍රසාද නැතිවෙනකොට, ඒ තමන් අරමුණු කරන තනතුරට එන්න බැරි වෙනකොට ඒ අයට හිතෙනවා - මෙතුමා නොවෙයි. මෙතුමා බොහොම සද්භාවයෙන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමෝම සද්භාවයෙන් තමයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තවත් ලේකම්වරු ඉන්න ඇති නේ. ඒ ගැනත් පොඩි කසු කුසුවක් තිබෙනවා. ඒක තමයි මම මේ කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් නැහැ. දැන් එහෙම ප්‍රශ්නයක් නැහැ. බොහොම සහයෝගයෙන් කටයුතු කරනවා. එහෙමනම් දැන් අපි මේ යෝජනාව අපි සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත වූ යෝජනාවක් වශයෙන් මම ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාට යොමු කරලා ආණ්ඩුකාරතුමාගේ සහයෝගය ලබාගෙන ඔබතුමා කිව්වා වාගේ රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමාගේ සහයෝගය, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්තුමියගේ සහයෝගය ලබාගෙන අපි ඒ ටික කරලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

තැපැලෙන් යවන්න එපා. තව අවුරුදු ගණනක් යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි උපරිම උත්සාහ කරවා. මේ කණ්ඩායම විශාල සේවයක් කරනවා, අපේ සභාවට. අපි ඒක ඉතාම අගය කරනවා.

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Accordingly,Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. රීති අත්හිටුවීමේ යෝජනාව කරලා නේ තිබෙන්නේ. ඒකත් එක්කම යන්න පුළුවන්.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION : II

## 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවේදී හැකි ඉක්මණින් සම්මත කර ගන්නා මෙන් රජයට යෝජනා කිරීම
PROPOSING TO THE GOVERNMENT TO ADOPT THE 19TH CONSTITUTIONAL AMENDMENT AT THE PARLIAMENT IMMEDIATELY

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*ගරු සභාපතිතුමනි, "ජනතාවට ඉදිරිපත් කළ දින සියයේ වැඩ සටහන ප්‍රකාර, දැනට පවත්නා අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ස්ථාපිත කිරීම හා 18 වන ආණ්ඩුක්‍රම*

*ව්‍යවස්ථා සංශෝධන අහෝසි කර, සියලු කොමිෂන් සභා නැවත බලාත්මක කර ඉදිරිපත් කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවේදී හැකි ඉක්මණින් සම්මත කර ගත යුතු යැයි මෙම පළාත් සභාව රජයට යෝජනා කර සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

[අ.භා.12.32]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපි කවුරුත් දන්නවා පසුගිය ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාව මම හිතන්නේ 80% කට අධික ප්‍රතිශතයකින් ජනතාව ඡන්දය ලබා දුන්නේ මෙන්න මේ දින සියයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ගරු සභාපතිතුමනි, මේකේ ප්‍රධානම කාරණය වන්නේ, මේ රටේ ජනතාවට තිබුණු ආර්ථික ප්‍රශ්න පමණක් නොවෙයි. ඊට වඩා භයානක වූ මේ ජනාධිපති ක්‍රමයත්, එහි තිබුණු දූෂණ, වංචා හොරකම් ගැන සොයා බැලීමත්ය. ඒ පැවැති රජයේ සමහර ඇමැතිවරු ඒ රජයෙන් එළියට ඇවිල්ලා මෛත්‍රීපාල සිරිසේන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමාව ජනාධිපති කරන්න එක්සත් ජාතික පක්ෂයේ බහුතරයත් එක්ක එකතු වෙලා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ මේ සියලුම බලවේග එකතු වෙලා එතුමාව මේ රටට ඉදිරිපත් කළේ, ජනතාවට ඉදිරිපත් කළේ මෙන්න මේ දින සියයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ගරු සභාපතිතුමනි, අපි ඉතාමත් කනගාටු වෙනවා. අද හෙළ උරුමය, ඒ වාගේම සමහර ඇමැතිවරුන් කිහිපදෙනෙක් එදා ඒ රජයේ හිටපු අය අද මේ රජයට ඇවිල්ලා මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කෙරෙව්වේ ඒ ගොල්ලොයි කියන බවට අද පත් වෙලා තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

නම් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ඉතාමත් කනගාටු වෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජනාධිපති වෙලා එතුමාම ප්‍රකාශ කළා, එක්සත් ජාතික පක්ෂයේ බහුතර බලයත් එක්ක තමයි 80% ක් පමණ එතුමාව ජනාධිපති කරවලා ඒ පුටුවේ ඉන්දෙව්වේ කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අනික් අය වෙන එකක් කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක එක කාලයට වෙන වෙන අය එක එක කථා කියනවා. ඒක ප්‍රශ්නයක් නැහැ . අපි කියන්නේ මේ ජනතාවගේ මතය. ඒක නිසා අපි ඉතාමත් අවධානයෙන් මතක් කරලා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම අද ඔය එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරන හෙළ උරුමයත්, රාජිත සේනාරත්න වැනි ඇමැතිවරුන්ටත් මතක් කරලා දෙන්න ඕනෑ, පුළුවන් නම් තනියම ඇවිල්ලා ඡන්දයට ඉදිරිපත් වෙලා පෙන්වන්න. බලයක් තිබෙනවාද කියලා. හෙළ උරුමයට පුළුවන් නම් මහ මැතිවරණයට තනියම එන්න. එතුමන්ලාගේ පක්ෂයෙන් ඇවිල්ලා පෙන්වන්න. තමන්ට ඔය කියන විදියේ ජනතා බලයක් තිබෙනවාද කියලා. හැමදාම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයේත් ජැක් එක ගහලා තමයි ඒ අය ආවේ. මෙවරත් හදන්නේ එක්සත් ජාතික පක්ෂයට පහර දීලා - ඡන්දයක් ළඟදී එනවා කියලා දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජැක් එක ගහලා නැවත වරක් තමන්ගේ කණ්ඩායම පාර්ලිමේන්තුවට යවා ගන්න හදන්නේ. මේ දින 100 වැඩ පිළිවෙළ ගැන කථා කරන්නේ නැතිව අද එක එක්කෙනාගේ වැරැදි සොයාගෙන, අඩුපාඩුකම් සොයාගෙන අද ඒ අය මාධ්‍ය සංදර්ශන පවත්වනවා. එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනාධිපතිවරණයේදී මහජන රැළියක් තියාගන්න බැරිව හිටිය කට්ටිය එදා එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම්වලට ඇවිල්ලා, වේදිකාවලට ඇවිල්ලා මේ අය කථා කළා විතරයි. මේ සටන මෙහෙය වූයේ, ප්‍රධාන වශයෙන් එක්සත් ජාතික පක්ෂය. මේ අය වේදිකාවේ කථා කළ විතරයි. ඒ අයට කථා කරන්න අපි වේදිකාවකුත් හදලා දුන්නා. නැත්නම් ඒ අයට ඒ වේදිකාවත් නැහැ. අන්න ඒකත් ඒ අයට මතක් කරලා දෙන්න ඕනෑ. යහපාලනය ගැන කථා කරනවා. යහපාලනය ගැන අද යහපාලන ආණ්ඩුවේ ඉන්න සමහර ඇමැතිවරු කථා කරනවා. අපි ඒ අයට කියන්න කැමැතියි. ඒ අය එදා හිටපු රජයේ තිබුණු හොරකම් දූෂණ වංචා, ඒ අය

හිටපු අමාත්‍යාංශවල තිබුණු හොරකම් දූෂණ වංචා අද ඉදිරිපත් කරන්න. එළියට ගේන්න. ඒ අය ගාව තමයි මේවායේ විස්තර තිබෙන්නේ. ඕනෑ නම් අපිත් දෙන්නම්. අපි ගාවත් තිබෙනවා. අපි මාසයක් විතර සිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එකට කාපුවාම ඕක තමයි වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අමාත්‍යාංශවල. ඒ ටිකත් අපි දෙන්නම්. අද කොළඹින් කුළියට ගෙයක් ගන්න ගියොත් කොහොම හරි ලක්ෂයකට එහා පනිනවා නේ? නේද? රුපියල් ලක්ෂයකට එහා පනිනවා. හැබැයි, මීට පෙර හිටපු ධීවර අමාත්‍යවරයෙක් මෝදර සම්පූර්ණ වරායම එක් ලක්ෂ විසි පන්දහකට අවුරුදු 30 කට බදු දීලා තිබෙනවා. මෙන්න මෙවැනි දූෂණ වංචා ඕනෑ තරම් තිබෙනවා. මේවා සොයා බලන්න. මේ යහපාලන ආණ්ඩුවක් ජනතාව පත් කරගත්තේ මේවාවලට. යහපාලන ආණ්ඩුවකින් ජනතාව බලාපොරොත්තු වෙන්නේ මේවා. මේ බඩු මිල ටිකක් අඩු කරන එකෙන් ජනතාවට සහනයක් ලැබුණා. නමුත් ඊට වැඩිය බලාපොරොත්තුවක් ජනතාව තියාගෙන තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාව ජනාධිපති පුටුවේ ඉන්දෙව්වේ. අන්න ඒක වෙන්නේ නැත්නම් වැඩි කල් යන්න ඉස්සෙල්ලා නැවත වරක් ජනතාවට තීන්දුවක් ගන්න සිදු වෙනවා. අපේ එක්සත් ජාතික පාක්ෂිකයන් බලන් ඉන්නේ නැහැ. විශාල අසාධාරණයක් එක්සත් ජාතික පාක්ෂිකයන්ට අද වෙලා තිබෙනවා. බහුතරයක් එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්දයෙන් තමයි මේ ජනාධිපතිවරයා පත් කර ගත්තේ. අද හෙළ උරුමයේ මන්ත්‍රීවරු ආණ්ඩුවේ ඇමැතිවරු හැටියට ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් ඡන්දවලින් කියන එකත් මම තමුන්නාන්සේලාට මතක් කර දෙනවා. තමුන්නාන්සේලාට කියලා ජනමතයක් තිබුණේ නැහැ. ජනමතයක් තිබෙන්න තමුන්නාන්සේලා කවදාවත් තනියම තරග කරලත් නැහැ. ඒක නිසා තමුන්නාන්සේලාට අපි අභියෝග කරනවා. එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දික් කරන්න ඉස්සෙල්ලා මහ මැතිවරණයකට තනියම එන්න. හෙළ උරුමයෙන් තනියම එන්න. ඇවිල්ලා පෙන්වන්න, ජනතාවගේ බලයක් තිබෙනවා කියලා. අන්න එහෙම වුණොත් අපට පිළිගන්න පුළුවන් තමුන්නාන්සේලාටත් එහෙමනම් අපට ඇඟිල්ල දික් කරන්න හේතුවක් තිබෙනවා කියලා. මම හිතන්නේ එහෙම හේතුවක් තමුන්නාන්සේලාට නැහැ.

අද කථා කරනවා, මේ ආණ්ඩුව දින 100 න් එහාට කොහෙම හරි ඇද ගෙන යන්න. දින 100 න් එහාට මාසයක් දෙකක් තුනක් බැරි නම් හයක් හරි පුළුවන් නම් දිගටම ඇදන් යන්න තමයි අද හෙළ උරුමය දඟලන්නේ. මේ තිබෙන ආණ්ඩුව, අද පත් වෙලා තිබෙන ආණ්ඩුව ජනතාව පත් කළේ ජනතාවගේ මේ දින 100 වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න විතරයි. ඊට වඩා බලයක් ජනතාව දුන්නේ නැහැ. මේකේ ප්‍රධාන වශයෙන් තිබෙන්නේ ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න. ඒකට 2/3 ක් අවශ්‍ය නැහැ. ඒකට ජනතා වරමක් දීලා තිබෙනවා. මේ ජනතාවගෙන් ඉල්ලුවේ ඒ වරම. මේ රටේ ව්‍යවස්ථාව අනුව ඉහළින්ම ඉන්නේ පාර්ලිමේන්තුව නොවෙයි. මේ රටේ ජනතාව. ජනතාවගේ ඡන්ද බලය. අන්න ඒ ඡන්ද බලය අනුව තමයි ජනතාව ඒ වරම දුන්නේ. මේකේ ඉතාමත් පැහැදිලිව තිබෙනවා. *ජනවාරි 21. දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ විධායක සහිත ආණ්ඩු ක්‍රම ව්‍යුහයක්.* ලක්ෂ 62 ක් ජනතාව එළියට බැහැලා ඡන්දය දුන්නේ මෙය ක්‍රියාත්මක කරන්න. මේ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න. ප්‍රධාන වශයෙන් ජනතාවට වෙලා තිබුණු කොඩි විනය තමයි මේ ජනාධිපති ක්‍රමය. මේක ප්‍රධාන කරගෙන තමයි අනික් ඒවා සියලු දේම ඉදිරිපත් කළේ. අපේ සෝභිත හාමුදුරුවෝ මැදිහත් වෙලා ඉදිරිපත් කළේ, මේ ජනාධිපති ක්‍රමය අහෝසි කරන එක. සියලුම පක්ෂ එකඟ වුණේ, ජනාධිපති ක්‍රමය ආපු ගමන් ආහෝසි කරන්න කියලා. අන්න ඒක නිසා ගරු සභාපතිතුමනි, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා, දිනේ කවදාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය අද කථා කරන, මාධ්‍ය සංදර්ශන තියන අයට අපි ඉතාමත් පැහැදිලිව කියනවා. ජනතාව දුන්නු වරම ක්‍රියාත්මක කරන්න කෑ ගහන්න. වෙන වෙන දේවල්වලට බොරුවට මාධ්‍ය සංදර්ශන තියන්න එපා. ජනතාව බලාපොරොත්තු වෙන්නේ අන්න ඒකයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒක තමයි අවුරුදු 20 ක් බලාගෙන හිටියේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවුරුදු 20 ක් බලාගෙන සිටියා - ඔයගොල්ලෝ පුළුවන් නම් කියන්න තමුන්නාන්සේලා සංවිධානය කරලා එක රැස්වීමක් තිබ්බද කියලා. හෙළ උරුමය සංවිධානය කරලා එක රැස්වීමක් තිබ්බද? එක රැස්වීමක් තිබ්බේ නැහැ. අපේ වේදිකාවට ඇවිල්ලා කථා කරලා ගියා විතරයි. අපේ එක්සත් ජාතික පක්ෂයේ වේදිකාවේ ඇවිල්ලා කථා කරලා ගියා විතරයි. වෙන කරපු දෙයක් නැහැ, ඔබතුමන්ලා. අන්න ඒක නිසා අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාවත්, අර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාව නොමඟ ඇරියා වාගේ නොමඟ අරින්න ලැහැස්ති වෙන්න එපා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් නොමඟ ඇරියේ බෞද්ධ බලවේගයක් කියලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා එක රැස්වීමක්වත් තිබ්බේ නැහැයිලු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා තමයි එතුමාවත් නොමඟ යවලා, එතුමාවත් මේ පුටුවෙන් පල්හෙලාට දැම්මේ. ඒක නිසා තමුන්නාන්සේලාට බලවේගයක් තිබෙනවා නම් අපි කියනවා. ඇවිල්ලා බලවේගය පෙන්වන්න. අපි හෙළ උරුමයට අභියෝග කරනවා. පුළුවන් නම් ඇවිල්ලා ඊළඟ මහ මැතිවරණයේදී තනියම ඉල්ලලා පෙන්වන්න. එක්කෙනෙක්ව පාර්ලිමේන්තුවට යවලා පෙන්වන්න පුළුවන් නම්. එක්කෙනෙක්ව යවලා පෙන්වන්න. අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කරපු ඒ කොඩි විනය කරන්න ලැහැස්ති වෙන්න එපාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ කථික ලැයිස්තුව තවම මට ලැබුණේ නැහැ. ඔබතුමා කථා කරනවාද? මට තවම කථික ලැයිස්තුව ලැබුණේ නැහැ. සංවිධායකතුමා කථික ලැයිස්තුව මට දෙන්න. විපක්ෂයෙන් මට කථික ලැයිස්තුවක් ලැබිලා තිබෙනවා. එහෙම වුණාට පස්සේ මට සභාව මෙහෙයවන්න අමාරුයි. කථා කරන්නේ නැද්ද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්නේ යෝජනාවටද? එතුමාට කාලය කොපමණ දෙනවද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කාලය වෙන් කරලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා.12.44]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ගරු ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා, එතකොට හිටපු අගමැතිතුමා විසින් මේ රටට හඳුන්වලා දීපු ආණ්ඩු ක්‍රමය තමයි අද මේ විවිධ, විවේචනාත්මක තැන්වලට යොමු වෙලා තිබෙන්නේ. එතකොට දැන් මේ ආණ්ඩු ක්‍රමය තුළම තමයි, පසුගිය දවස්වල අපට තිස් වසරක් තිස්සේ තිබුණු මහා සාපරාධී යුද්ධය අවසන් කරන්න අවශ්‍යව තිබුණු නායකත්වය සැපයුවේ. අපට මේක අමතක කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ, 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මේ රටට එදා -

[සභාවේ ඝෝෂා]

මහා විශාල ආන්දෝලාත්මක ප්‍රශ්නයක් බවට පත් වුණා. නිදහස් ආර්ථිකය පිළිබඳ කථාව තමයි එදා කථා කළේ.

78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් නිදහස් ආර්ථිකය මේ රටට ගෙනැල්ලා මේක නිදහස් වෙළඳ කලාපයක් බවට පත් කරන්න හදනවා කියලා තමයි එදා කෑ ගැහුවේ. එදා මේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල ගැන නොවෙයි අපි වැඩිපුර කථා කළේ. අද වන විට මේ ඊයේ පෙරෙයිදා ඇති වුණු ජාතික ආණ්ඩුවේ සාමාජිකයන් අතර අලුත් අර්බුදයක්, අරගලයක්, සටනක් මේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ඇති වෙලා තිබෙනවා කියන එක අපට දැන් පැහැදිලිව දකින්න ලැබෙනවා. පසුගිය දවස්වල එක්සත් ජාතික පක්ෂය, හෙළ උරුමය, සිහල උරුමය අපේ සහෝදර කණ්ඩායම් එක වේදිකාවේ නැඟලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පරද්දලා රටේ අලුත් මහා විශාල යහපාලනයක් නිර්මාණය කිරීම සඳහා ගත්ත දැවැන්ත පියවරක් උපන් ගෙයිම මැරෙන්න යන මහ කනගාටුදායක ප්‍රවෘත්තිය තමයි මේ තුළ කියැවෙන්නේ. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා 19 බලගන්වන්නයි කියන කාරණාව තුළ කියැවෙන්නේ, අද පාර්ලිමේන්තුවට, විධායකයට නායකත්වය දෙන විධායක ජනාධිපතිවරයාව 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් පත් වුණු නාමික අග්‍රාණ්ඩුකාරවරයාගේ තැනට මේ ජනාධිපතිවරයාවත් ගෙන්නලා තියන්නයි මේ ලෑස්ති වෙන්නේ. ඒක වෙන්න ඇති මම හිතන්නේ, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන්නේ. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. අපට තිබෙන ගැටලුව ඒක නොවෙයි.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

පක්ෂ මතයේ නොවෙයිද ඔබතුමා ඉන්නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

පක්ෂය මතය නොවෙයි මම මේ කියන්නේ. වෙලා තිබෙන කාරණාව. පක්ෂ මතය පස්සේ කථා කරනවා. මේ වෙලා තිබෙන කාරණාව පිළිබඳවයි පැහැදිලි කරන්නේ. ගරු සභාපතිතුමනි, අපි හරි කැමැතියි මේ රටේ බොහොම හොඳ යහපාලනයක් ඇති වෙලා ඒ යහපාලනය තුළින් මේ රටේ සමස්ත පුරවැසියාට ඉතාමත් යහපත් ආකාරයෙන් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය වෙනවා නම්, අපට 13 ත් එකයි. 18 වුණත් එකයි. 32 වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. දැන් අපි අපි ගහ ගන්නේ නැහැ නේ? දැන් ගහ ගන්නේ මේ යහපාලනය ඇතුලේ ඉන්න කණ්ඩායම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කාල්ටන් මතයද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අපේ ගරු සංවිධායකතුමා බොහොම හොඳ මනුස්සයා. එතුමා කවදාවත් ගහගන්න යන්නේ නැහැ. දැන් මේ වචන හුවමාරුව සිද්ධ වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එහෙම නැත්නම් අද මේ සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ එක්කවත් නොවෙයි. අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පැහැදිලිව කරුණු පැහැදිලි කළා. අද වම්පික රණවක -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කිව්වේ යහපාලන ආණ්ඩුවක් හදනවා කියලා. ගොම් බෙටි දාගන්නවා කිව්වේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒක තමයි මම කියන්නේ. ඒකට දැන් කරදරයක් වෙලා තිබෙනවා. මේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කරන විධියට ගරු සභාපතිතුමනි, මේ යහපාලනයට අභ්‍යන්තරව මහ දරුණු ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෙළ උරුමයෙන්

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මොන උරුමෙන්ද කියලා මම දන්නේ නැහැ. මොකක් හරි උරුමයකින් ප්‍රශ්නයක් මතු වෙලා. ඉතින් ඒ නිසා දැන් යහපාලනය කරන්න විධියක් නැහැ. හෙළ උරුමය කරුමයක් වෙලා යහපාලනය අරුමයක් වෙලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක මේ රටට එපමණ යහපත් ක්‍රියාවක් නොවෙයි.

ගරු සභාපතිතුමනි, අපට එකක් අමතක කරන්න බැහැ. මේ රටේ දහස් ගණනක් අම්මාවරු තමන්ගේ ලෙයින් මසින් ජනිත කරපු දරුවන් මේ පොළව යට තිස් දහසකට වැඩිය

[ ගරු ජගත් අංගගේ ]

ප්‍රමාණයක් මිහිදන් වෙලා තිබෙනවා. එහෙම අත්පත් කරලා දීපු නිදහස කරුමයක් බවට පත් කරන්න නොවෙයි - ඒ අම්මලා සාප කරනවා, තමන්ගේ මව් කුසින් බිහි කරපු දරුවන් මේ රට වෙනුවෙන් පූජා කළාට. ඒ තත්ත්වයට යන්න බැහැ. ඒක නිසා මේ කරන්නේ මොකක්ද කියන කාරණාව පැහැදිලිවම පැහැදිලි කරගන්න ඕනෑ. මේකට රණ්ඩු කරලා හරි යන්නේ නැහැ. රටේ ජනතාවගෙන්, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවෙන්, එහෙම නැත්නම් වෙනත් ව්‍යවස්ථා සභාවක නියෝජිතයින්ගෙන් බහුතර ඡන්ද බලය අරගෙන මේ පිළිබඳව කථා කරන්න. මේවාට රණ්ඩු කරලා හරියන කාරණා නොවෙයි. මේවා විහිළුත් නොවෙයි. සෙල්ලනුත් නොවෙයි. ඒ නිසා මගේ සහෝදර ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එතුමා අභ්‍යන්තරයේ, හදවතේ කැකෑරෙන වේදනාව ප්‍රකාශ කරන්න තමයි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ගරු සභාපතිතුමනි, තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාට බොහොම දේශමාමක, දේශානුරාගය වැනි හැඟීම් තිබෙන කෙනෙක්. එතුමා හදවතේ කැකෑරෙන වේදනාව ඔබතුමාට ඉතාමත් බයාදු ලෙස ඉදිරිපත් කරනවා. මේකට විසඳුමක් සොයලා දෙන්න කියලා, ගරු සභාපතිතුමනි. පව් නේ. බලන්න කෝ. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා 19 දිනවලා දෙන්න කියලා කියනවා. නේද? සෝභිත හාමුදුරුවන්ටත් පොරොන්දු වුණා නේ දෙයියනේ. මේක නොකර පුළුවන්ද? නේද? මේක කරලා ඉවර වෙන තුරු සෝභිත හාමුදුරුවෝ බලාගෙන ඉන්නවා. මේ ගොල්ලෝ සෙල්ලම් කරනවා. එහෙම බැහැ නේ අපේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. එහෙම බැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේක අපි කරලා දෙන්න ඕනෑ. කොහොම හරි. අමාරුවෙන් හරි. ගරු සභාපතිතුමනි, හැබැයි ලෙහෙසියන් කරන්න බැහැ. මේ සහයෝගය දෙන්න කියලා ඇවිල්ලා අම්බලන් ඇතුළේ රිංගගෙන අද මෙහෙම ගහනකොට කොහොමද ඉවසන්නේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක හරි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ තරුණ හිත්වල තිබෙන වේදනාවා ගැන අපි දකින්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමා හීනියට තියලා හෙළ උරුමයට කපනවා නේද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම එහෙම හෙළ උරුමයට කපන්නේ නැහැ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අපි දන්නවා, කරන්නේ මොකක්ද කියලා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, කොහොම වුණත් මේ රටට යහපත් දෙයක් වෙනවා නම් - ගරු සභාපතිතුමනි, විධායක ජනාධිපතිවරයා වෙනුවට රූකඩ ජනාධිපතිවරයෙක් ලෙස තනතුර නිර්මාණය කිරීම මේ රටේ අනාගතයට මහා විශාල වාසනාවක් නම්, යහපතක් නම් ඒ පිළිබඳව අපි සිතා බලන්න අවශ්‍යයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

94 ඉඳන් හිතනවාද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මගේ යහළුවා ඔච්චර කේන්ති ගන්න එපා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ වෙනුවට රීරි යකෙක්ද ඉල්ලන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, කරුණු කාරණා කොහොම වුණත් ජනාධිපතිතුමාගේ ගලවලා තිබෙන ආයිත්තම් ටික කොහොමද කියලා පසුගිය දවස්වල අපි බැලුවා. බලාගෙන යනකොට මේ පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමැතිවරයෙකුගේ සයිස් එකක්වත් ජනාධිපතිතුමාට නැහැ. ඒ තරමට ජනාධිපතිවරයාව පල්ලෙහාට දාන්න තමයි Try කරන්නේ. මම දන්නේ නැහැ, මේක කරන්න උත්සාහ කරන්නේ ඇයි කියලා. තමුන්නාන්සේලාගෙන් දැනගන්න අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඇයි මේ රටේ බහුතර ජනතාව පත් කරපු ජනාධිපතිවරයා මේ තරම් හැල්ලුවට ලක් කරන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් එතුමා නේ කරන්නේ. අපි නොවෙයි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මට තේරෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. මොකද, මේවා යුගයෙන් යුගයට රටට වැදගත් වන කාරණා නිසා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්තවාදී බලවේග.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මොන බලවේගද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්තවාදී බලවේග.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ සභාවේත් ඒ බලවේග තියෙනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇති. ඇති.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කොහොම හරි ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව දන්න එක කාරණාවක් තිබෙනවා. අපි තිස් වසරකට අධික කාලයක් දරුණු යුද්ධයකින් පීඩා විඳපු ජාතියක්. මේ යුද්ධය සඳහා මේ රටේ ආදරණීය අම්මාවරු තමන්ගේ කුසින් බිහි කරපු දරුවන් දහස් ගණනක් පූජා කළා. ඒ පූජා කරපු දරුවන්ගේ වීරත්වය නිසා, එඩිතරභාවය නිසා, සටන්කාමීත්වය නිසා, ශ්‍රී ලංකා ඉතිහාසයෙන්ම උරුම වුණු රණකාමී ජාතියක් නිසා අපි මේ යුද්ධය ජය ගත්තා. නමුත් ඒ ජයග්‍රහණ ලත් ගෙයි පාවා දීලා, නැවත මොන සංශෝධන කළත් රට පාවා දීමේ ක්‍රියාවලියකට අප එකඟ නොවන බව ප්‍රකාශ කරනවා. විශේෂයෙන් මේ සංශෝධන තුළ කියන කාරණාවන් තව තවත් හොඳින් පරිශීලනය කොට, අධ්‍යයනය කොට නාමික වශයෙන් කාගේ කාගේවත් තමන්ට අවශ්‍ය කරන පෞද්ගලික බලය වැපිරවීම සඳහා, තමන්ට අවශ්‍ය කරන පෞද්ගලික බලයන් පෝෂණය කර ගැනීම සඳහා, බලලෝභීත්වයට මුක්කු ගැසීම සඳහා වූ කරුණු කාරණාවන්ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපේ හදවතේ එකඟතාවයක් නොමැති බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.55]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ දේශපාලනයේ ඉතාම තීරණාත්මක දින කිහිපයක් තමයි ගත වෙමින් තිබෙන්නේ. විශේෂයෙන් මේ 7, 8, 9, 10 කියලා කියන්නේ, එක්කෝ මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් ජනවරමට අනුව හැසිරෙනවාද? එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි එහා මෙහා කරලා game ගහලා ජනතාවගේ බලය හැල්ලු කරනවාද? ජනවරමට පිටුපානවාද? කියලා තීන්දු කරන දවස් කිහිපයක් තමයි එන්නේ. ඔබතුමා දන්නවා ජනවාරි 08 වැනිදා මේ රටේ වෙනසක් වුණා. ඒ වෙනස කියලා කියන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා වෙනුවට ඒ පුටුවේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඉඳගත්තු එක විතරක් නොවෙයි. මොකද, මේ වෙනස කළේ ජනතාව. දැන් එක එක පක්ෂ ඇවිල්ලා තම තමන්ගේ කොටස ගැන කියන්න පුළුවන්. අපි ඒ පක්ෂවල කරපු කාර්ය භාරය අගය කරනවා. විශේෂයෙන් මේ වැඩේ සිදු කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය කාර්ය භාරයක් කළා. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් ඡන්ද ව්‍යාපාරයක යෙදුණා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා බොහෝ දිස්ත්‍රික්කවල එක්සත් ජාතික පක්ෂය පසුගිය බස්නාහිර හෝ දකුණු පළාත් සභා ඡන්දයේදී කරපු තරම් මහා පරිමාණ ඡන්ද ව්‍යාපාරයක් කළේ නැහැ. මහින්ද රාජපක්ෂ තරම් මහා බලයක්, එවැනි විධායක බලයක්, එවැනි රාජ්‍ය බලයක්, එවැනි පවුල් බලයක්, එවැනි ධන බලයක්, එවැනි මාධ්‍ය බලයක් පරාජය කරන්න තරම් එක්සත් ජාතික පක්ෂය තනියම කරපු වැඩක් නොවෙයි. ඔබතුමන්ලා කරපු වැඩත් තිබෙනවා. ලක්ෂ 62 න් ලක්ෂ 35 කට වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ඡන්ද. ඒ පිළිබඳව රටේ ජනතාවගේ ගරුත්වයක් තිබෙනවා.

ඒ වාගේම තමයි ආණ්ඩුවෙන් ඉවත් වුණු සමහර කණ්ඩායම්, ආණ්ඩුවෙන් ඉවත් වුණු පුද්ගලයන් ඒ අයත් කරපු කාර්ය භාරයක් තිබෙනවා. නමුත් ඒ කවුරුවත් තනියම මහින්ද රාජපක්ෂ මහත්මයා පැරැද්දුවේ නැහැ. ඒ අය තනියම ඒ බලය පැරැද්දුවා නොවෙයි. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ලෝකය පුරා සංචාරය කරමින් ඉඳලා අවසන් මොහොතේ ලංකාවට ඇවිල්ලා කරපු දෙයක් තිබෙනවා. ඒක අපි අගය කරනවා. හැබැයි, එතුමියට විතරක් ඒ ගරුත්වය යන්නේ නැහැ. රාජිත සේනාරත්න ඇමැතිතුමාට ඒ ගරුත්වය යන්නේ නැහැ. හෙළ උරුමයට විතරක් ඒ ගරුත්වය ගන්න බැහැ. මේ රටේ ජනතාව කවුරු හරි හිතනවා නම්, අන්තිම මාසේ දෙසැම්බර් 08 වැනිදා නාම යෝජනා දුන්නාට පස්සේ, ඒ මාසේ විතරක් ඡන්ද ව්‍යාපාරයක් කරලා, රැස්වීම් කරලා මහින්ද රාජපක්ෂ වාගේ කෙනෙක් පරද්දන්න පුළුවන් කියලා, ඒක මිත්‍යාවක්. ඒක හීනයක්. ඊට කලින්, අවුරුදු 04 ක් 05 ක් තිස්සේ විශේෂයෙන් 2010 මහ මැතිවරණයෙන් පස්සේ, ජනාධිපතිවරණයෙන් පස්සේ මේ රටේ ජනතාව අතර ලොකු සටනක් තිබුණා. දේශපාලන පක්ෂ සම්බන්ධ වෙන්නේ නැතුව, ඒ කාලේ විශ්ව විද්‍යාල ආචාර්යවරු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවට විරුද්ධව දින 100 ක අරගලයක් කරමින්, ගාල්ලේ ඉඳලා කොළඹට පාගමනක් කරලා ඔවුන්ගේ මහින්ද රාජපක්ෂ විරෝධය කුළු ගැන්නුවා. අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කරපු වෙලාවේ ඒ වෙනුවෙන් විනිශ්චයකාරවරු විතරක් නොවෙයි, නීතිඥ මහත්වරු තමන්ගේ විරෝධය ප්‍රකාශ කළා. කටුනායක ආදී තැන්වල කම්කරුවෝ සටන් කළා. එතැනින් විශ්වාසයක් හැදුවා, ඡන්දයෙන් නොවෙයි මහින්ද රාජපක්ෂ ආණ්ඩුව දණගස්සන්න පුළුවන් කියලා. ඒකේදී අපිත් කරපු කාර්ය භාරයක් තිබුණා. මේ සම්පූර්ණ ගරුත්වය අපට එපා. නමුත් අපිත් කරපු කාර්ය භාරයක් තිබුණා. අපි හැමදෙනාම. ඒ නිසා මේ තනි තනි පුද්ගලයන් කරපු කාර්ය භාරයට වඩා, හැම දෙනාම කරපු කාර්ය භාරයෙන් තමයි මහින්ද රාජපක්ෂ පරාජය කරන්න පුළුවන්කම ලැබුණේ.

ඒ විතරක් නොවෙයි. මේක මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ජයග්‍රහණයක් විතරක් නොවෙයි. අපි දන්නවා, 94 චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපතිවරණයට ඉදිරිපත් වනකොට එතුමිය බලන්න ගම්වල සෙනඟ ගියා. එතුමිය බලන්න බස් අරගෙන රැස්වීම්වලට සෙනඟ ගියා අපි දැකලා තිබෙනවා. 2005 මහින්ද රාජපක්ෂ මහත්මයා එනකොටත් සමහර තැන්වල එහෙම තිබුණා. හැබැයි, අපි දන්නවා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා බලන්න බස් අරගෙන කවුරුවත් ගියේ නැහැ. බලන්න ගියේ නැහැ. ඒක අරුමයක් නොවෙයි. එතුමා නොවෙයි මේක කළේ. මේ රටේ ජනතාව. ඒක නිසා මේ ලක්ෂ 62 ක ජනවරම අයිති ජනතාවට. විශේෂයෙන් පක්ෂවලට සම්බන්ධ නොවුණු, මැද පන්තියේ

විශාල පිරිසක් මේ ඡන්ද ව්‍යාපාරයට ස්වෙච්ඡාවෙන් දායක වුණා. ගම්වල ජනතාව සමෘද්ධිය කැපෙයි කියලා බය නැතුව, තමන්ගේ දරුවට ඉස්කෝලය නැති වෙයි කියලා බය නැතුව, තමන්ගේ රස්සාව නැති වෙයි කියලා බය නැතුව, ඒ බය පැත්තක දාලා මේ ඡන්දයේදී හෙමින් හෙමින් කණට කොඳුරලා SMS එක ගහලා, ටෙලිෆෝන් එකෙන් කථා කරලා මහා ඡන්ද ව්‍යාපාරයක් වුණා. රජයේ නිලධාරීන් ඒක කළා. හමුදාව, පොලීසිය ඇතුළේ ඒක කළා. ඒ ගරුත්වය අපි දෙන්න ඕනෑ. වුණේ මොකක්ද කියලා හරියට තේරුම් ගත්තෙ නැත්නම් එහෙම මේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ. දැන් මොකක්ද ඇවිල්ලා තියෙන්නේ? අපි පොරොන්දු වුණු ආකාරයට ජනවරම ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ රටේ දේශපාලන ඉතිහාසයේ 47 ඉඳලා මැතිවරණවලදී තමුන්නාන්සේ දන්නවා, දේශපාලඥයෝ ඡන්ද පොරොන්දු දෙනවා. පොරොන්දු දෙනවා ඉෂ්ට කරන්නේ නැහැ. ඒවා බොරු පොරොන්දු. ඒ නිසාම තමයි මේ මැතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ප්‍රමුඛ කණ්ඩායමට සිද්ධ වුණේ, පොරොන්දු ඉදිරිපත් කරනවාට අමතරව, ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරනවාට අමතරව - මහින්ද චින්තනයේ මේවා තිබුණේ නැහැ. දින දාලා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. දින 100 දී කොහොමද වැඩ කරන්නේ කියලා. ජනවාරි 10 සෙනසුරාදා පටන් අරගෙන අප්‍රේල් 23 බ්‍රහස්පතින්දා ඉවර වනකල් දින දාලා ජනතාවට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. ඇයි මේ? සමහර අය කියනවා, මේ දින 100 වැඩක් නැහැ. වැඩ 100 තමයි ඕනෑ කියලා. නැහැ දින 100 වැදගත්. විශ්වාසය බිඳිලා හිටපු ජනතාව, දේශපාලනය පිළිබඳ කලකිරිලා හිටපු ජනතාවට මේ දින 100 වැදගත්. මේ දින පොතෙන් තමයි විශ්වාසය හැදුවේ. ඒකේ තියෙන්නේ මොකක්ද? ඒකේ තියෙන්නේ,

*"දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින් කොමිෂන් සභා පිහිටුවීම ඇතුළු 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම."*

මේකේ බොහොම පැහැදිලියි. සිංහල දන්න ඕනෑම කෙනෙකුට - මේකේ දෙමළ ඉංග්‍රීසි පරිවර්තන තියෙනවා. මේකේ තියෙන්නේ මොකක්ද? අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට - ඒ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විධායකයේ අත්තනෝමතික බලය කප්පාදු කරන්න නොවෙයි පොරොන්දු වෙලා තියෙන්නේ. අත්තනෝමතික විධායක බලය කපනවා වෙනුවට ඒ විධායක බලය පවරනවා කාටද? අගමැතිතුමාටද? රනිල් වික්‍රමසිංහ මහත්තයාටද? මේ දැන් බය කරන්න යන්නේ මොකක්ද? මහින්ද රාජපක්ෂ මහත්තයා අතේ තිබුණු බලයක් ගලවලා දෙනවා රනිල් වික්‍රමසිංහ මහත්තයාට. එහෙම ව්‍යවස්ථා හදන්න බැහැ. මේ මොකක්ද හදන්නේ? තනි කෙනෙක් අතේ තිබුණු බලය, තනි විධායක ජනාධිපතිතුමාට තිබුණු බලය ගලවලා දෙනවා කැබිනට් මණ්ඩලයට. හොඳ නැද්ද? ඇමැති මණ්ඩලයට දෙන්නේ. ඇමැති මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයා. ඔහුට සාමාන්‍ය ඇමැතිවරයෙකුට වඩා බලයක් ලෝකයේ හැම තැනම තිබෙනවා. ඒක තමයි අගමැති තනතුර කියලා කියන්නේ. හැබැයි මේ මහින්ද රාජපක්ෂ වෙනුවට රනිල් වික්‍රමසිංහ විස්ථාපනය කරන ව්‍යාවස්ථාවක් නොවෙයි. අනෙක් එක අපි හිතමු යම් බලයක් දුන්නා කියලා. විධායක ජනාධිපති අයින් කරන්න පාර්ලිමේන්තුවට 2/3 ක් ඕනෑ. අගමැති අයින් කරන්න එහෙම ඕනෑද? එහෙම ඕනෑ නැහැ. පාර්ලිමේන්තුවේ සරල බහුතරයෙන් අයින් කරන්න පුළුවන්. දැන් බොරු බියක් හදනවා. අපි දන්නේ නැහැ ඊළඟ මහ මැතිවරණයෙන් පස්සේ - අපි මේ කොමිෂන් සභා තියාගෙන මහා මැතිවරණය තියමු. තිබ්බාට පස්සේ කවුරු අගමැති වෙයිද කියලා අපි දන්නේ නැහැ. ශ්‍රී ලංකා එක ඉල්ලයි. එක්සත් ජාතික පක්ෂය අගමැතිකමට ඉල්ලයි. අපිත් අගමැතිකමට ඉල්ලනවා. ඒක මේ රටේ ජනතාව තීන්දු කරයි. නමුත් හැබැයි -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමන්ලා -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කලබල වෙන්න එපා. නමුත් මේ බොරු බියක් හදලා කඩාකප්පල් කරන්න දෙන්න බැහැ. අපි අහන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතයද? ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා දැන් කියනවා - මම

[ ගරු නලින්ද ජයතිස්ස ]

දන්නේ නැහැ හීනෙන් ඇහැරිලාද කියලා. මේ විධායක ජනාධිපති පඹයෙක් කරන්න අපි එකඟ නැහැයි කියලා. පඹයෙක් කරන්න අපි එකඟ නැහැයිලු. එතකොට විධායක ජනාධිපති ධූරය පටන් ගත්තාට පස්සේ ඔබතුමන්ලාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක නායිකාවෝ වෙලා හිටියේ කවුද? සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 78 විධායකය ඉදිරිපත් කරන වෙලාවේ එතුමිය හිටපු ස්ථාවරය මොකක්ද? විධායක ජනාධිපති ධූරය සම්පූර්ණයෙන් අහෝසි කරන්න. එතුමිය හිටියේ නැහැ මේකේ බලය කප්පාදු කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔය තර්කය වලංගු නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

පැහැදිලිව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැතිවරණයේදී අපි දෙපාර්ශවයේම කරුණු ඉදිරිපත් කරමින් තරග කළේ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම අපට ඉඩ දෙන්න බැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

දවල් මිගෙන් රෑ ඩැනියෙල් කතන්දර නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මේකනේ රීතිය. සම්ප්‍රදාය. එහෙම කොහොමද කරන්නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒකයි කතන්දරේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඔබතුමා කාට හරි කියන්න ඔබතුමා වෙනුවෙන් උත්තර දෙන්න කියලා. ඔහොම උත්තර දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 78 ව්‍යවස්ථාව ගෙනාවාට පස්සේ ආපු පළමුවැනි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාපතිතුමිය. එතුමිය මේකට විරුද්ධ වුණා. ඊට පස්සේ ආපු (බාධා කිරීමක්) චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය සභාපති වෙලා හිටියා. 1994 ජනාධිපතිවරණයට ඉදිරිපත් වනකොට අපට දීපු පොරොන්දුව මොකක්ද? ලියලා පොරොන්දු වුණා, 1995 ජූලි 15 වනකොට විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවා කියලා. අහෝසි නොකිරීම එතුමියගේ වැඩක්. ඒක එතුමියගේ සදාචාරය. නමුත් ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමියගේ ස්ථාවරය මොකක්ද? විධායකය අහෝසි කිරීම. ඊළඟට ආවා මහින්ද රාජපක්ෂ මහත්මයා. 2005 ඡන්දය ඉල්ලලා. මොකක්ද පොරොන්දුව? විධායකය අහෝසි කිරීම. 2010 පොරොන්දුව ඒකයි. අපි දැක්කේ නැති වුණාට මේ සැරේත් තිබ්බාලු විධායක අහෝසි කරන්න සලකා බලනවා කියලා. දැන් ඇවිල්ලා ඉන්න සභාපතිවරයා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා, එතුමා දීපු පොරොන්දුවත් මොකක්ද? විධායකය අහෝසි කිරීම. 1978 ඉඳලා පත් වුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරු හතර දෙනාම රටට කිව්වේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා මිසක් විධායකයේ බලය කප්පාදු කරනවා කියලා නොවෙයි. මේක පඹයෙක් කරනවා කියලා බය කළා නොවෙයි. ඔය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය නොවෙයි. රටට හොඳක් වෙන්න යන වෙලාවේ අපි කරුණාකරලා කියන්නේ මම ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වංචා දූෂණ මේ වෙලාවේ කියන්න යන්නේ නැහැ. කරුණාකරලා -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අනේ කියන්න කෝ? අහගෙන ඉන්න ආසයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අයියෝ. කරුණාකරලා මේ වැඩේට කකුලෙන් අදින්න එපා. මේ වැඩේට බාධා කරන්න එපා. ඇයි මේ බාධා කිරීම? ඇයි මේ කකුලෙන් අදින්න යන්නේ? මේ රටේ ජනතාවගේ අභිලාසය. 19 වැනි සංශෝධනයෙන් අපි මොකක්ද කරන්න හදන්නේ? කාටවත් පක්ෂවලට බලය ගන්න නොවෙයි. මේ රටට සුගතියක්, රටේ ප්‍රගතිශීලී ක්‍රියාවලියක් ඉෂ්ට කර ගන්න හදන වැඩක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ජනතා විමුක්ති පෙරමුණට ඕනෑ නම් මේකට පයින් ගහලා ඉන්න තිබුණා. මේ මොනවාද? අපට ඕනෑ තරම් දේශපාලන විග්‍රහ හදා ගන්න පුළුවන්. අපි මාක්ස් ලෙනින්වාදී ව්‍යාපාරයක්. අපි වාමාංශික ව්‍යාපාරයක්. අපට ඕනෑ නම් කියන්න තිබුණා, මේ ධනේෂ්වර ආණ්ඩුවක ව්‍යවස්ථාවක්. ධනේෂ්වරයේ මූලික නීතිය. අපි මොකටද මේකට උදව් කරන්නේ? මේ ධනේෂ්වර පාර්ලිමේන්තුවට අපි උදව් කරන්න ඕනෑ නැහැයි කියලා, අපට එහෙම ඕනෑ නම් හදාගෙන ඉන්න තිබුණා. හැබැයි, අපි හිතනවා, ඊට වඩා වැදගත් මේ වෙලාවේ රටට මොකක් හරි කරලා දෙන එක. ඒක කරලා දෙන්න ඕනෑ. ඒකට තමුන්නාන්සේලාගේ පක්ෂය එකඟ වෙලා හිටියේ. තමුන්නාන්සේලාගේ සභාපතිවරයා රටේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරලා තිබුණේ. එහෙම නැත්නම් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේක ඉදිරිපත් කරන්නේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට කියන්න මේ 19 වැනි සංශෝධනයේ නරක මොනවාද තියෙන්නේ? මේකේ විධායක බලතල කප්පාදු කරනවා. මේකේ තියෙනවා ඇමැති මණ්ඩලය 30 ට අඩු කරන එක. ඒක හොඳ නැද්ද? දැන් මේ පළාත් සභාවල ඇමැතිවරු පහක් ඉන්න එක රටේ ජනතාවට හොඳ නැද්ද? පළාත් සභාවේ ඇමැතිවරු 05 ක් ඉන්න ඕනෑ කියලා ව්‍යවස්ථාවේ දාලා තිබුණේ නැත්නම් එහෙම, මගේ අම්මෝ 68 ක් හිටියා ඒ කාලේ. 50 කට විතර දෙනවා ඇමැතිකම්. 30 ක් දාන එක හොඳ නැද්ද? 30 ක් දාන එක හොඳයි. පාර්ලිමේන්තු ධූර කාලය අවුරුදු 05 ට අඩු කරන එක හොඳ නැද්ද? ඒක හොඳයි. පාර්ලිමේන්තුව විසුරුවන්න ජනාධිපතිවරයාට තිබෙන බලය අන්තිම මාස 06 දක්වා - ඒ කියන්නේ අවුරුදු 4 ½ ක් යනකල් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැ. ඒක හොඳ නැද්ද? ඒවා හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මේක කරගෙන යමු. රීති අත්හිටුවලා නේ තියෙන්නේ. ආයිත් මේවා ගැන කථා කරන්න අවස්ථාවක් දෙන්නෙත් නැහැ. සමහර විට මේ සභාව ඊට පස්සේ තියෙන එකකුත් නැහැ. ඒ නිසා කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

කථා කරන්න, අපි අහගෙන ඉන්නම්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අහගෙන ඉන්න ඕනෑ. නැත්නම් යන්න. අහගෙන ඉන්න බැරි නම් යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාවට වෙලාවක් වෙන් කරලා තියෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේකේ තියෙන ස්වාධීන කොමිෂන් සභා ගැන අපි අහන්නේ, මේ ස්වාධීන කොමිෂන් සභාවට විරුද්ධ වෙන්න තමුන්නාන්සේලාට තිබෙන අයිතිය මොකක්ද? 2000 අවුරුද්දේ ස්වාධීන කොමිෂන් සභාවලට මුළු පාර්ලිමේන්තුවම අත ඉස්සුවා. පාර්ලිමේන්තුවේ 225 න් එක්කෙනෙක් ඇර. ජාතික හෙළ උරුමය ඒ වෙලාවේ සිහළ උරුමය, ඒ අය ඇර 223 ක් අත උස්සපු සංශෝධනයක්

[ ගරු නලින්ද ජයතිස්ස ]

17 වැනි සංශෝධනය කියලා කියන්නේ. කොමිෂන් සභාවලට එකඟයි. ඒ නිසා අපි අහන්නේ මොකක්ද මේ ප්‍රශ්නය? මේකෙන් විධායකයේ බලය සම්පූර්ණයෙන් අහෝසි වෙන්නේ නැහැ නේ? මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට විශේෂ ප්‍රතිපාදන අවුරුදු 05 ක් යටතේ දෙනවා නේ? එතුමාට ඇමැතිකම් තුනක් දෙනවා. කැබිනට් එකේ ප්‍රධානියා වෙලා ඉන්න පුළුවන්. ඒ ඔක්කෝම දීලාත් ඇයි මේ කකුලෙන් අදින්නේ. තමුන්නාන්සේලා මේ ගේම ගහන්න එපා. තමුන්නාන්සේලා හිතනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ජනාධිපති වෙලා ඉන්නවා. තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 124 ක බලයක් තිබෙනවා. තව අවුරුද්දක් පාර්ලිමේන්තු ධූර කාලය තියාගන්න පුළුවන්. මේ වෙලාවේ කල්පනා කරනවා ගේමක් ගහන්න. තමුන්නාන්සේලා බලය වෙනුවෙන් ගේම් ගහන්න. හැබැයි, රට වෙනුවෙන් ගේම් ගහන්න එපා. රටට වැදගත් වැඩක් යන වෙලාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ යම් කොටසක් රට දිනා දෙන්න යන වෙලාවේ ඒකට තමුන්නාන්සේලාගේ පාර්ලිමේන්තුවේ බලය පාවිච්චි කරලා මේ විධියට වැඩ කරන්න එපා. ඔහොම වැඩ කළා නම්, ඇයි තමුන්නාන්සේලා 2001 අවුරුද්දේ 17 වැනි සංශෝධනයට එකඟ වුණේ? එතකොට අපට හිතාගන්න වෙන්නේ - අපි හිතුවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදයට කැමැති නිසා අත ඉස්සුවා කියලා. බලනකොට ඒක නොවෙයි. තමුන්ගේ ආණ්ඩුව කඩාගෙන වැටෙනවා. JVP එක අපි විපක්ෂයේ ඉඳලා පරිවාස වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. ඒකේ තිබෙනවා 17 වැනි සංශෝධනයේ ස්වාධීන කොමිෂන් සභා කියලා. තමුන්ගේ ආණ්ඩුව රැක ගන්න, ඇමැතිකම් රැක ගන්නද එදා අත ඉස්සුවේ? ඒවාද මේ පෙන්නුම් කරන්නේ? එහෙම කරන්න එපා. මේක රටේ ජනතාව, ලක්ෂ 62 ක් අනුමත කරලා තිබෙනවා. 62 ට වඩා වැඩියෙන්. දැන් ඊට වඩා ජනතාව මේකට කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ඉදිරිපත් කරනවා ප්‍රධාන තර්ක දෙකක්. මොකක්ද? දැන් කියනවා, මේකට කාලය මදී කියලා. සාකච්ඡා කරන්න කාලය මදී කියලා. මේ සංශෝධනයේ කාලය මදිකම මොකක්ද? විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා 78 ඉඳලා මේ රටේ සාකච්ඡාවක් තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා සඳහා 2000 ඉඳලා සාකච්ඡාවක් තිබෙනවා. අපි අවුරුදු 15 ක් කොමිෂන් සභා ගැන සාකච්ඡා කරලා තිබෙනවා. අවුරුදු 37 ක් සාකච්ඡා කරලා තිබෙනවා විධායක ජනාධිපති ධූරය ගැන. ඒ පිළිබඳව ඇති පදම් සාකච්ඡා කළා. ඇති පදම් සාකච්ඡා කළා. තව මොනවාද සාකච්ඡා? තමුන්නාන්සේලා 18 වැනි සංශෝධනය කළේ, මොන සාකච්ඡා කරලාද? පාර්ලිමේන්තුවට හදිසි පනතක් හැටියට ගෙනාවා. ගේනකොට උසාවිය දන්නේ නැහැ මොනවාද සංශෝධන කියලා. ඉදිරිපත් කරපු පෙත්සම් අරගෙන ගිය කට්ටිය දන්නේ නැහැ සංශෝධනය මොකක්ද කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දන්නේ නැහැ සංශෝධනය මොකක්ද කියලා. එහෙම කරලාත් විධායකයේ බලය වැඩි කරන සංශෝධනවලට තමුන්නාන්සේලාගේ පක්ෂවල අය ලැජ්ජා නැතුව අත ඉස්සුවා. එහෙම අයද දැන් කියන්නේ. ඒ පව් ඔක්කෝම හෝදලා යවන්න පුළුවන්, දෙයියනේ කියලා මේකට අත ඉස්සුවොත්. ඒකයි අපි මේ කියන්නේ. ඒ විතරක් නොවෙයි. ආයිත් කියනවා. මේක ගැට ගහන්න හදනවා මැතිවරණ ක්‍රමයට. මතක තියාගන්න මෛත්‍රීපාල සිරිසේන මහත්මයා පොදු අපේක්ෂකයා වුණේ, මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ පොදු අපේක්ෂකයා නොවෙයි. ඔහු ඖෂධ පනත ගෙන ඒමේ පොදු අපේක්ෂකයා විධියට නොවෙයි. ඔහු විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ පොදු අපේක්ෂකයා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ සාධාරණ සමාජයක් සඳහා ජාතික ව්‍යාපාරය හදලා සමාජගත කළේ, මොකක්ද? විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට. ඒකට මැතිවරණ ක්‍රමය පිළිබඳ සාකච්ඡාවක් ආවා. හැබැයි ඒක ද්විතීයිකයි. දැන් හදන්නේ මොකක්ද? රටට ආදරේටද මැතිවරණ ක්‍රමය ගේන්න හදන්නේ? නැහැ. මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න තමුන්නාන්සේලා පසුගිය අවුරුදුවල එක සාකච්ඡාවක් කළේ නැහැ. පාර්ලිමේන්තුවේ 2/3 බලයක් තිබුණා. විධායක බලය තිබුණා. එතකොට සාකච්ඡාවක් කළාද මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න? නැහැ. දිනේෂ් ගුණවර්ධන කමිටුව අවුරුදු 12 ක් 13 ක් තිස්සේ සාකච්ඡා කරනවා. කර ගන්න බැරි වුණා. දැන් මේ හදිසියේ මතක් වෙලා තියෙන්නේ මොකක්ද? දැන් මේක ගේනවා නම් ඡන්ද ක්‍රමයත් වෙනස් කරන්න ඕනෑ.

ඕක දැන් කරන්න හදන්නේ. අපි එකඟයි ඒකට. මැතිවරණ ක්‍රමය වෙනස් කරමු. ඒක සම්මත කර ගමු. මතක තියා ගන්න, ඔය එළියේ කථා කරනවා නේද -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හරි. අවසන් කරනවා. මැතිවරණ ක්‍රමය සංශෝධනය ගැන එළියේ කථා කරනවා නේ? හැබැයි, පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේ සාකච්ඡා තිබුණා. පක්ෂ නායක රැස්වීම්. මැතිවරණ කොමසාරිස්තුමා ඒකට ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේවත්, එහෙම නැත්නම් ජාතික හෙළ උරුමයේ කවුරුවත් ඒකට ආවේ නැහැ. ඇවිල්ලා ඒවාට යෝජනා දුන්නේ නැහැ. අද එළියේ ගිහිල්ලා කියනවා, මැතිවරණ ක්‍රමය සංශෝධනය නැතුව මේකට අත උස්සන්නේ නැහැයි කියලා. මොකක්ද මේක? මේ කකුලෙන් ඇදීමක් නොවෙයිද? ඒ නිසා අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි - මේ කරුණ ගැන නම් ගොඩක් වෙලා කථා කරන්න ඕනෑ. කොහොම වුණත් අපි මේ වැඩි කලබලයක් නැතුව මේ කරගෙන යන්නේ වෙන මොකක්වත් නොවෙයි. කොහොම හරි කරලා 10 වැනිදාට තමුන්නාන්සේලාගේ සහාය ඕනෑ නේ? ඒක නිසා මේ රටට හතුරු වෙන්න එපා. මේ විධායකය නැතුව මොකක්වත් කරන්න බැහැ කියලා ඕවා කියන්න එපා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරණ ස්ථාවරයට එන්න. ඒ අනුව කටයුතු කරන්න. අපි හැම දෙනාම එකතු වෙලා මේ 19 වැනි සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත කර ගමු. රට ඉස්සරහාට අරගෙන යමු කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.01.12]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හිතමිත්‍ර පළාත් සභා මන්ත්‍රී ශ්‍රීනාත් පෙරේරා මැතිතුමාගේ මේ යෝජනාවට කථා කරන්න ලැබීම පිළිබඳව විශේෂයෙන්ම මම සන්තෝෂ වෙනවා. ඒ වාගේම මේ වෙලාවේ තමයි මම නිතර මතක් කරන මල්වත්තේ සර්පයා ගැන මතක් කරන්න වෙන්නේ. දැන් තමයි මල්වත්තෙන් සර්පයින් එක්කෙනා දෙන්නා නැඟිටින්න පටන් ගන්නේ. දැන් තමයි සර්පයෝ මතු වන අවස්ථාව බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අද වනකොට මම හිතන්නේ, සමහර උදවියට දිට්ඨ ධම්මවේදනීය කර්මය පඩිසන් දීගෙන යන්නේ. දිට්ට ධම්ම වේදනීය කර්මය.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කාටද? මහින්ද මහත්තයාටද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

නැහැ, මහින්ද මහත්තයාට නොවේ ඔය අල්ලපු කට්ටියට දැන් මේ දිට්ටධම්මවේදනීය කර්මය පඩිසන් දීගෙන යන්නේ. ඒ නිසා අපි දැනගත්තා. අපි වෙලාසනින්ම කිව්වා ජනාධිපති මැතිවරණයට ඉස්සෙල්ලා අපි මේ රටේ ජනතාවට උගුරේ ලේ රහ වෙනකල් කිව්වා, මේ තත්ත්වය ඇති වෙනවා කියලා. මේ රටේ දේශපාලනය විතරක් නොවෙයි. රටේ සියලුම තැන්වල අස්ථාවරභාවයක් ඇති වෙනවා කියලා. දැන් ඒ තත්ත්වය පටන් අරගෙන තිබෙන්නේ. ඒකට අවශ්‍ය කරන සියලු කුමන්ත්‍රණ ක්‍රියාත්මක කරලා ලබා ගත්තු බලය රැක ගන්න බැරුව ඉන්න අවස්ථාවක තමයි එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ අද කථා කරන්නේ. මම දන්නේ නැහැ මේ අවස්ථාවේදී අපේ සහෝදර නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා නිරුවතින් කථා කරනවාද කියලා. පොඩි සැකයක් තිබෙනවා. මොකද, සමහර දේවල් අපට දැනෙන්නේ, ගේම් ගැහුවා නම් ගේම් ගැහුවේ වෙන කවුරුවත් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණ. ඒ ගේම හරි ලස්සනට ගැහුවා. එහෙම ගහලා මේ මැතිවරණයෙන් මහින්ද රාජපක්ෂ පරාජයට පත් කරන්න විතරක් නොවෙයි. ඊළඟට මේ දිනන මෛත්‍රීපාලගේ ආණ්ඩුවත් අස්ථාවර මට්ටමට පත් කරලා, එක්සත් ජාතික පක්ෂයේ රනිල් මහත්මයාටත් විදලා ඡන්ද ටික පොඩ්ඩක් වැඩි කරගෙන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තව දෙන්නෙක් තුන්දෙනෙක් වැඩි කර ගන්න ගත්තු කුමන්ත්‍රණය ඔන්න දැන් එළි වෙන්න පටන් අරගෙන. ඒ නිසා මට දැනෙන්නේ, නිරුවතින් කථා කරන්නේ මෙන්න මේ අය. මේ අය තමයි ගේම් දුන්නේ.

[ ගරු පියල් නිශාන්ත ]

ඊළඟ කාරණය තමයි අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්ව දින 100 සම්බන්ධව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තත්ත්වය භයානකයි. මොකද, දින 100 ත් ඇදගන්න බැරුව ඉන්න එක්සත් ජාතික පක්ෂය, අද ඒ නිසා ඉතා ඉක්මණින් මැතිවරණයක් ඉල්ලනවා. මොකද, මේ දින 100 පහු වෙලා තව දින කිහිපයක් ගෙනියන්න ගියොත් දන්නවා, ඒ අයට මොකද වෙන්නේ කියලා. දින 100 තුළ අපි පැහැදිලිවම දන්නවා නේ මේ රජය මොනතරම් දුරට පල්ලෙහා මට්ටමට වැටිලාද කියලා. ජනතාවගේ අප්‍රසාදයට ලක් වෙලාද කියලා. අපි ගත්තොත් අද මේ දින 100 තුළ සිදු වුණු දේවලුත් එක්ක අද වෙලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂයේ කුමන්ත්‍රණකාරී අගමැතිවරයෙක් බිහි කිරීම තමයි පළමුවැනි දේ. ඒක තමයි ඒගොල්ලෝ ලබපු ලොකුම ජයග්‍රහණය. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු 127 ක් ඉඳිද්දී 45 ක වාගේ සංඛ්‍යාවක් ඉන්න එක්සත් ජාතික පක්ෂයට අගමැතිකම හම්බ වුණා. හම්බ වුණා නොවෙයි, මේක බලහත්කාරයෙන් ලබා ගත්තා. ඒක නිසා අපි දන්නවා, මේකට සහයෝගය දුන්න අපේ ජනතා වරමට එරෙහිව වැඩ කරපු අපේ නායකයෝ ඉන්නවා. හැබැයි, ඒ නායකයින්ට ඊළඟ මැතිවරණයේදී අපේ ජනතාව, අපේ පාක්ෂිකයෝ තීන්දුවක් දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දින 100 ඇතුළත ඇමැති මණ්ඩලය 30 කට සීමා කරනවා කියපු මේ අය, දැන් ඇමැති මණ්ඩලය 79 දක්වා වැඩි කරගෙන තිබෙනවා. මේ ජනතාවට සේවය කරන්න ආපු කට්ටිය. 79 දක්වා වැඩි කරලා දැන් බොරුවට පම්පෝරි ගහනවා. සමහර ඇමැතිවරුන්ට කරන්න දෙයක් නැහැ. මම හිතන්නේ ඇමැතිකම් ගත්තු අයට තමන්ගේ විෂයය පථයවත් තවම ලබා දීලා නැහැ. ඒ අය නිකම් ඔහේ පුටුවේ වාඩි වෙලා ඉන්නවා. මේ රටේ ධීවර ඇමැතිවරු තුන්දෙනයි. ඒ තුන්දෙනාම දන්නේ නැහැ මොකක්ද කරන්න ඕනෑ කියලා. ධීවර ජනතාව අද අසරණ වෙලා. අසරණ වුණා විතරක් නොවෙයි, අපේ ධීවර ජනතාවගේ සම්පත් ටික මංකොල්ල කන්න ඉන්දියාවට අවස්ථාව ලබා දීලා තිබෙනවා. අවුරුදු තුනකට අපේ ධීවර සම්පත කොල්ල කන්න මේ දින 100 ඇතුළත වැඩ පටන් ගත්තේ අන්න එහෙම.

ඊළඟට අපි අපේ කළුතර දිස්ත්‍රික්කය ගත්තාට පස්සේ, මේ දින 100 නිසා අපේ රබර් ගොවියා, ඒ වාගේම තේ ගොවියා වහ බොන මට්ටමට පත් වෙලා තිබෙනවා. ඉතාමත්ම අසරණ මට්ටමට පත් වෙලා තිබෙනවා. ඊළඟට දැන් බලන්න කෝ, ආයේ බටලන්ද වධකාගාර,- 88 – 89 භීෂණය ඇති වෙන්න පටන් අරගෙන නැද්ද කියලා. බලන්න, බොහොම ලස්සනට මේගොල්ලෝ කථා කළේ. ඒ දවස්වල, විශ්ව විද්‍යාලයේ උද්ඝෝෂණයක් යනකොට, ඒ ශිෂ්‍යයින්ගේ අයිතිවාසිකම් දිනා ගන්න යනකොට මොනවා හරි පුංචි සිද්ධියක් වුණාම ඒක මහා ලොකුවට කෑගැහුවා. ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය කෑගැහුවා. කොහොමද දුන්න පාර. ඇට්ටි හැලෙන්න බඩු. අර අහිංසක තරුණ තරුණියන්ට එළව එළවා වෙඩි තිබ්බා. ඊට පස්සේ කඳුළු ගෑස් ගැහුවා. එතැනින් නොනැවතී බැටන් පොළු පහරවලුත් ගහලා ඒ තරුණයින් අසරණ තත්ත්වයකට පත් කළා. මෙන්න අයිතිවාසිකම් ඉල්ලන -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොරු කියන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ නිසා අපි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය බොහොම සුද්ධවන්තයෝ වාගේ කථා කළාට නැවත 88 - 89 භීෂණය ඇති කරන මට්ටම නිර්මාණය කරන්න අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කරලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා මේ යෝජනාව සම්බන්ධව අපේ යම් එකඟතාවයක් තිබෙනවා වාගේම අපි මේකට යම්කිසි කොන්දේසි ටිකක් දාලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් හැටියට, අපි ඒ පක්ෂයේ කොන්දේසිත් එක්ක තමයි යන්නේ. ඒ නිසා ඔයගොල්ලෝ අපි කැමැතියි. මේ වෙලාවේ ඡන්දය ඉක්මණින් තිබ්බත් එකයි. පහු වෙලා තිබ්බත් එකයි. ඒ ගැන කිසි ගැටළුවක් නැහැ. අපි දන්නවා අනිවාර්යයෙන්ම මේ පාර අග්‍රාමාත්‍යවරයා බවට පත් වෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා. දැන් ඒකට බය වෙලා.

[සභාවේ ඝෝෂා]

ඒ බය වීම කොහොමද කිව්වොත් අපේ හිටපු නායිකාව කියනවා, මේ මිනිස්සු බලන්න යන්නේ, බත් පාර්සලයටයි, අරක්කු බෝතලයටයි කියලා. අපි පැහැදිලිව කියනවා වැරදුණු තැන එතැන නායකතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ නිසා රටේ ජනතාව එක තීන්දුවක ඉන්නවා. රටේ ජනතාවට පුංචි වැරදීමක් සිද්ධ වුණා. ඒ වැරදීම හදා ගන්න -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

රටේ ජනතාව තීන්දුව දීලා ඉවරයි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

කටයුතු සූදානම් කරලා තියෙන්නේ. ඒ නිසා මේ වෙලාවේ -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

රටේ ජනතාව 08 වැනිදා තීන්දුව දුන්නා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ව්‍යවස්ථා සංශෝධනය -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

දැන් ගෙදර යන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය සිදු වෙන්නේ, වෙන මොනවාටවත් නොවෙයි. මේ අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ තටු ටික කපලා, ඒ බලතල ටික කපලා රනිල් වික්‍රමසිංහට බලයෙන් වැජඹිලා ඉන්න. ඒකට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කර ගන්න. ඒ නිසා මම කියනවා, ඒවා දවල් දකින හීන. මේ හීන සැබෑ වෙන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ පාක්ෂික සහ බුද්ධිමත් ජනතාව අපි එකා වාගේ එකතු වෙලා සමස්ත රටේම සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ අනෙකුත් සියලු ජාතීන් එක්ක එකතු වෙලා, අපි මේ රට නැවතත් ගොඩ නැඟීමට, ගලවා ගැනීමට අවශ්‍ය කරන පියවර ගන්නවා. ඒ පිළිබඳව මතක් කරමින් ඔබ සියලු දෙනාටම ජය වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[ඇ.භා.01.20]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බොහොමත්ම ස්තුතිය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ රටේ ව්‍යවස්ථාව මේ වනකොට 18 වතාවක් වෙනස් වෙලා. විශේෂයෙන්ම 2000 වර්ෂයේ ඉඳලා 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ අපි කවුරුත් දන්නවා 1978 විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ විශාල චෝදනා තිබියදී 17 වැනි සංශෝධනයෙන් ඒ බලතල යම්තාක් දුරට අඩු කරන්න කොමිෂන් සභා ටික පත් කර ගත්තා. නමුත් අපේ රටේ අවාසනාවට පසුගිය කාල වකවානුවේදී 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන්, 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු බලතල අඩු වීම නැවතත් එක පුද්ගලයෙකුට කේන්ද්‍රගත වීමක් සිදු වුණා. ඒ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් එදා හිටපු නායකතුමාගේ අදහසක් අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරපු, පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරුන් එය සම්මත කළා විතරක් නොවෙයි. ඊට පස්සේ ගමට ඇවිල්ලා කිරි බතුත් කාලා, රතිඤ්ඤාත් පත්තු කළා. පසුගිය ජනාධිපතිවරණයේදී ඒ සම්මත කරපු මැති ඇමැතිවරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වේදිකාවට ඇවිල්ලත් කිව්වේ මොකක්ද? ජාතියෙන් සමාව ඉල්ලුවා. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අත ඉස්සුවාට. ජාතියෙන් සමාව ඉල්ලුවා. ඒ ජාතියෙන් සමාව ඉල්ලලා ඒ වැරද්ද නිවැරදි කරන්න තමයි එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව මේ රටේ ජනාධිපති කළේ. මෛත්රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති කරන කොට ඒ පොරොන්දු පත්‍රිකාවේ මේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීම, විශේෂ ස්ථානයක් ගන්නවා. ඒ වාගේම තමයි සමහර අය කථා කරනවා, දැන් 40 දෙනාගෙන් අගමැති

රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියලා. ඒක හොඳට කියවලා බලන්න. එදා ජනාධිපති වනකොට එතුමාගේ ඒ පත්‍රිකාවේ පැහැදිලිව කියලා තිබෙනවා, ඊළඟ අග්‍රාමාත්‍ය වෙන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියලා. එතකොට ඡන්ද ලක්ෂ 62 ක් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දෙන කොට මෙන්න මේ කොන්දේසිවලට එකඟතාවය අනුවයි ඡන්දය දුන්නේ. ඒ වාගේම තමයි එතැනදී පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, මේ ආණ්ඩුව තිබෙන්නේ තාවකාලිකවයි. දින 100 කට පමණයි කියන එක. එතකොට දැන් අපි මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියේදී පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කරනවා. එතකොට මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇති වැරැද්ද මොකක්ද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. ඒකට විරුද්ධව කවුරු හරි කථා කරනවා නම්, අපි නැවතත් මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන දේවල් ගැන කථා කරන්න ඕනෑ. මේකට අපි බොරුවට විරුද්ධ වෙන්නේ නැතුව, දේශපාලන ගේම් ගහන්න, එහෙම නැත්නම් දේශපාලන අයුතු ප්‍රයෝජන ගන්න මේවාට විරුද්ධ වෙනවාද? එහෙම නැත්නම් මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන කාරණා මොනවාද කියන එක අපි දැනගෙන කථා කරන්න ඕනෑ. ඒකේ තිබෙනවා, නැවතත් අපේ කොමිෂන් සභා ටික පිහිටුවන එක. ඒකට ඇයි අපි විරුද්ධ වෙන්න ඕනෑ. ඒකට හැමෝම ඉල්ලීමක් කරන්නේ මොනවාටත් නොවෙයි. ස්වාධීනව මේ කොමිෂන් සභා ටික පවත්වන්න කියන එක. ඒ කොමිෂන් සභා ටික මේ 19 වැනි සංශෝධනය - අපි 17 වැනි ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කරපු කොමිෂන් සභාවලට අමතරව තවත් කොමිෂන් සභා කිහිපයක් දාලා තිබෙනවා. ඒක සාධාරණයි. එතකොට අපි මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීමක් කරලා තිබෙන්නේ. නැත්නම් විධායක ජනාධිපති ක්‍රමයේ පඹයෙක් හැටියට දාන එකක් කිසිසේත්ම කරලා නැහැ. මේ විධායක ජනාධිපති ක්‍රමයේ, විධායක බලතල යම් ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩලයට, කැබිනට් අමාත්‍ය මණ්ඩලයට, යම් ප්‍රමාණයක් කොමිෂන් සභාවලට - අනිවාර්යයෙන්ම කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ ප්‍රධානියා හැටියට අග්‍රාමාත්‍යවරයාටත් ලැබෙනවා. එතකොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පසුගිය ජනාධිපතිවරණයේදී පොරොන්දු වුණු දෙයක් තමයි මේක. මේක පොරොන්දු වුණු දෙයක්. එතකොට 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට තවත් අපි ඇතුළත් කරලා තිබෙනවා Information Bill එක. අපේ තොරතුරු දැන ගැනීමේ පනතත් ඒ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් වෙලා තිබෙනවා. මේ රටේ ඉදිරියට, දියුණුවට, මේ රටේ දූෂණය අවම කරන්න ලෝකයම පිළිගන්නා ක්‍රමවේදයක් තමයි මේ තොරතුරු දැන ගැනීමේ අයිතිය. එතකොට මෙන්න මේවායි 19වැනි ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් වෙන්නේ. එතකොට මේ මොනවාද කියන්නේ? මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අවුල් කර ගන්න, ජාතිවාදයක් ගාව ගන්න කිසිම හේතුවක් නැහැ. මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මේ රටේ ජීවත් වන හැම දෙනාගේම යහපත වෙනුවෙන් ගෙනාපු ව්‍යවස්ථා සංශෝධනයක්. එහෙම නැත්නම් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ ද්‍රවිඩ ජනතාවටවත්, එහෙම නැත්නම් මුස්ලිම් ජනතාවටවත් කියන කථාව නැවතත් ජාතිවාදය අවුස්සන කථා. අපි අවුරුදු 30 ක් දුක් විඳලා ඉවර වෙලා අවුරුදු 30 ක් පැවැති යුද්ධය අවසන් කළාට පස්සේ නැවතත් අපි ඒ මට්ටමටම යන්න අවශ්‍යතාවයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේක පැහැදිලියි. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තව කට්ටියක් පරාජිත අපේක්ෂකයින්ගේ පස්සේ යනවා. එතකොට ඒ පරාජිත අපේක්ෂකයාගේ පස්සේ යන්න ජනතාව එකතු කරන්න කරන කුමන්ත්‍රණයක් තමයි නැවතත් ජාතිවාදය ගේන එක. අද ද්‍රවිඩ ජනතාවට උතුරේ ඔප්පු ලබා දෙන කොට මොනවාද කියන්නේ? මේ ජාතිවාදයක් අවුස්සනවා. එතකොට එදා යුද්ධය අවසන් වුණාට පස්සේ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද ඇවිස්සුවේ?

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අහගන්න. ඒක හොඳයි. මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවෙයි, කවුරු හරි ඒ කටයුත්ත කළා නම් ඒක හොඳයි. ඒක අපි අගය කරනවා. එදා යුද්ධය අවසන් වෙලා යුද්ධ හමුදා මූලස්ථානය කොටස් කඩලා හෝටල්වලට දෙන්න හොඳයි. එතකොට ප්‍රශ්නයක් නැහැ. එතකොට උතුරේ යුද්ධ හමුදාවට අයිති කරගෙන තිබෙන යම් ඉඩමක් තිබෙනවා නම්, ඒක ද්‍රවිඩ ජනතාවට දුන්නොත් ඒක

ගැටළුවක්. අපේ මතය මේ රටේ ආරක්ෂාවට යම් ආකාරයකින් තර්ජනයක් නොවන ආකාරයෙන් - දැන් යුද්ධය අවසන් වෙලා තිබෙන නිසා මේ රටේ ආරක්ෂාවට තර්ජනයක් නොවෙන ආකාරයෙන් ද්‍රවිඩ ජනතාවට යම් ඉඩම් බෙදා දෙන්න පුළුවන් නම් ඒක ලබා දෙන්න ඕනෑ. ඒක තමයි මම හිතන්නේ, නියම සිංහල බෞද්ධකම. ඒක තමයි බුදු රජාණන් වහන්සේ දේශනා කරලා තිබෙන දේ. ඒක තමයි ජේසුස් වහන්සේ දේශනා කරලා තිබෙන දේ. එහෙම නම් අපි සියලු දෙනාම එකතු වෙලා - 19 වැනි සංශෝධනය ඉදිරිපත් කරන කොට තමයි මේ හැම දෙයක්ම කථා කරන්නේ. මේක නැති කරන්න, මේ සියලු දෙනාට මෙතැන ජාතිවාදයක් අවුස්ස ගන්නේ නැතුව, මෙතැන ආගම්වාදයක් අවුස්ස ගන්නේ නැතුව, 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට දේශපාලන ගේම් ගහන්නේ නැතුව රට වෙනුවෙන් කැමැති වෙන්න. එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර පුද්ගලයින් පන්සල් ගාණේ යනවා. සමහර අය කියනවා, අපි අතෙන් ඉල්ලන්නේ කියලා. මහර එහෙම. එක්කෙනෙක් අතෙන් ඉල්ලනවාලු. අනෙක් එක්කෙනා ඇඳෙන් ඉල්ලන්න යන්නේ. මොකද, ඊළඟ ඡන්දේ බුදි කරවනවා. ඊළඟ ඡන්දයෙන් බුදි කරවන හින්දා ඇඳෙන් තමයි ඉල්ලන්න වෙන්නේ. සමහර අය ඇඳෙන් ඉල්ලනවා. අපි අලියාගෙන් ඉල්ලන්නේ. අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් හදන්න කිසි ගැටළුවක් නැහැ. (බාධා කිරීම්) එක්කෙනෙක් අතෙන්. අනෙක් එක්කෙනා ඇඳෙන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙපමණ කල් අලියාගෙන්ද ඉල්ලුවේ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

විශේෂයෙන්ම මම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරන්නේ මේ 19 වැනි සංශෝධනයට දේශපාලන ගේම් ගහන්නේ නැතුව මේ රට වෙනුවෙන්,ජීවිත පුද කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරපු සියලු දෙනා වෙනුවෙන් 19 වැනි සංශෝධනය සම්මත කරලා මේ රට ඉදිරියට ගෙන යන්න කියන එක ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.01.29]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. 19 වැනි සංශෝධනය ගැන කථා කළොත් මෙතැන පළමුවෙන්ම කියන්න ඕනෑ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට, කිසිම ජාතිභේද ප්‍රශ්නයක් මේකේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජාතිභේදී කිසිම ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. ක්‍රමය ගැන සහ ප්‍රතිපත්ති ගැනයි අපට තිබෙන ගැටළුව. 19 වැනි සංශෝධනය ගෙනාපු විධිය ගැන කිව්වොත් එහෙම රනිල් වික්‍රමසිංහ මැතිතුමා කමිටු රැස්වීමේදී හවස කථා කරපු කෙටුම්පත නොවෙයි උදේ වනකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. (බාධා කිරීමක්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොහේද හිටියේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

කටවහගෙන ඉන්න. ඔබතුමා දන්නේ නැති වුණාට මම දන්න නිසයි කියන්නේ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවට කෙටුම්පතක් ඉදිරිපත් කරන කොට සතියක කාලයක් අවශ්‍යයි. කෙටුම්පත සාමාන්‍යයෙන් ජනතාවට කියවන්න ඉඩ සැලසිය යුතුයි. සාමාන්‍යයෙන් කෙටුම්පතක් ඉදිරිපත් කරන කොට සතියක කාලයක් අවශ්‍යයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඒ කිසිම දෙයක් නැතුව උදේ වනකොට ඒ කෙටුම්පත ඉදිරිපත් කරලා ඉවරයි. එතකොට එතැනම එතුමා වංචාව කරලා ඉවරයි. පළමුවැනි වංචාව එතැන සිද්ධ වෙලා ඉවරයි. ඊට අමතරව 19 වැනි සංශෝධනය ගැන කථා කළොත් අපට සම්පූර්ණයෙන්ම 19 එක්ක ගැටළුවක් නැහැ. අපට විවිධ තැන්වල ගැටළු තිබෙන්නේ මොකද, ඒකට හේතුව එකක්. අපි කියන්නේ, 19 ගේනවා නම් විධායක ජනාධිපතිකම අහෝසි කරනවාට අපට ගැටළුවක් නැහැ. නමුත් මැතිවරණ ක්‍රමය ගෙන එන්න ඕනෑ. රටක පාර්ලිමේන්තුව, මැතිවරණ ක්‍රමයයි, විධායක ක්‍රමයයි නැති

වුණොත් එහෙම අස්ථාවර වෙනවා. එතකොට පාර්ලිමේන්තුවට ආණ්ඩු බලය ගේනවා නම් අනිවාර්යයෙන්ම සංශෝධනය වෙන්න ඕනෑ මැතිවරණ ක්‍රමය. එහෙම නැතුව විධායකය විතරක් නැති කරන්න බැහැ. ඒක අනිවාර්යයෙන් සිදු විය යුතුයි. අනෙක් එක 19 වැනි සංශෝධනයේ තිබෙන දේවල් තමයි විධායකයේ නායකයා, ආණ්ඩුවේ නායකයා, රජයේ නායකයා සහ සේනාධිපති නායකයා. මේක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

අටවැනි වගන්තියෙන් අයින් කරනවා ආණ්ඩුවේ නායකයා නැහැ. ආණ්ඩුවේ නායකයා අගමැති. ජනාධිපති විධායක බලතල තිබ්බාට රට ගියාම වැඩ බලන්නේ කථානායක. ඇයි කථානායකට වැඩ බැලීම පවරන්නේ? මෙවැනි ගැටළු කිහිපයක් මේක ඇතුළේ තිබෙනවා. මොකද,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කුමන්ත්‍රණශීලීව 19 වැනි සංශෝධනය ගෙන එන්නේ. මේගොල්ලෝ කථා කරන්නේ 19 මුළු සමස්ත ජනතාව කැමති දේ ගැන විතරයි. සමස්ත ජනතාවට ප්‍රශ්නයක් තිබෙන දේ ගැන මේගොල්ලන් කථා කරන්නේ නැහැ. මේගොල්ලන් ඒ කෙටුම්පත කියවලා නැහැ. මම හරි කෙටුම්පතත් කියෙව්වා. දෙවැනි කෙටුම්පතත් කියවලා තියෙන නිසා කථා කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තුන්වැනි එක.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

තුන්වැනි එක ඔබතුමන්ලා ලියා ගන්න. තුනක් නැහැ නේ? දෙක ගැන කියන්නේ. මේ කෙටුම්පත් දෙකම -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ලියපු එක කියවලා නැහැ. ඒකයි වැඩේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

නිරෝෂා මන්ත්‍රීතුමියට අද තරහා ගිහිල්ලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

(බාධා කිරීමක්) මේ පොතේ කිසිම තැනක කියලා නැහැ විධායකය සම්පූර්ණයෙන්ම නැති කරනවා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ලියපු එක මොකක්ද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

අනේ, අනේ ඔබතුමා බයිලා කියන්නේ නැතුව කට වහගෙන ඉන්න. (බාධා කිරීම්) 19 වැනි එකත් එක්ක අපට ගැටළු නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

හිතන දේවල් මේ 19 වැනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමියන්ලාගේ ඡන්ද ව්‍යාපාරය අපට ඒකෙන්ම පේනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමන්ලාගේ එක ඔය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමියන්ලාගේ ඡන්ද ව්‍යාපාරය අපට ඒකෙන්ම පේනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඕක තියාගන්න කෝ? මේක ගැන අපි කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක නොවෙයි ජනතාවට දුන්නේ. මේක.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමන්ලා ලියපු ඒවා. අපට 19 ත් එක්ක ගැටළු නැහැ. මේ තිබෙන ප්‍රශ්න ටිකයි අපට විසඳගන්න ඕනෑ. මේ UNP එකේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

රටට වෙන දෙයක් පෙන්වන්නේ. එතුමා කුමන්ත්‍රණශීලීව වෙන එකක් යටින් ගෙනියන්නේ. මේක මෙතුමන්ලා දන්නේ නැති වුණාට UNP කැබිනට් එකේ ඇමැතිවරුත් මේකට විරුද්ධයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

නමුත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

මේ පාර තමයි පාඩම ඉගෙන ගන්නේ. මොකක්ද? එයාට වෙන්නේ කියන එක.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

2005 වුණ දේ තමයි මේ පාර වෙන්නෙත්. එතුමා හිතාගෙන ඇති ආණ්ඩුවේ අගමැතිට පාර්ලිමේන්තුවේ සරල බහුතරය අවශ්‍යයි. දැන් අපි බලමු එතුමා ගෙනාපු එක සම්මත කරලා පෙන්නයිද කියලා. එතුමා සම්මත කරලා පෙන්නුවේ නැති වුණොත් ඔතැන අගමැතිකමෙන් එතුමාට අයින් වෙන්න වෙනවා. සරල බහුතරය එතුමාට පාර්ලිමේන්තුවේ පෙන්වන්න බැරි නම්. ඒක තමයි ක්‍රමය. එතකොට අපි බලමු ඔබතුමන්ලාට මොකද? වෙන්නේ කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

වෙන දේ බලාගන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ගහපු ගේම් ඔක්කෝම ඉදිරියේදී ඉවර වෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ඔය ගේම් හැමදාම ගහන්න බැරි බව අපි කවුරුත් දන්නවා. (බාධා කිරීම්) මොකද, අපට කිසිම ගැටළුවක් නැහැ. 19 තිබෙන ගැටළු ටික තමයි ඔය කියන්නේ. ඒ ටික සංශෝධනය වෙනවා නම් අපට කිසිම ගැටළුවක් නැහැ. අපි 19 ට එකහයි. නැත්නම් මේ බොරු මත UNP එකෙන් ඉදිරිපත් කළාට වැඩක් නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ගෙනාවේ සම්මත කරන්න නොවෙයි. ජනතාවට කියන්න ඕක සම්මත කළේ නැහැ. මේගොල්ලන් විරුද්ධ වුණා කියලා ඡන්දය ගන්න. ඔය ඡන්ද ගුණ්ඩුවක්. ඕක හරියට හවස කථා වුණු එක උදේ පෙන්නුවේ නැහැ. උදේ ගෙනාවේ වෙන කෙටුම්පතක්. හවස කථා කළේ වෙන කෙටුම්පතක්. එතුමාගේ කුමන්ත්‍රණය ඕක සම්මත කරන්න නොවෙයි. මේක නොකර පෙන්වන්න. හැබැයි, කනගාටුවෙන් කියන්න කැමැතියි JVP එකත් ඒ උගුලේ තමයි වැටිලා ඉන්නේ. ඒක කනගාටුවෙන් කියන්න කැමැතියි. මොකද, අපට කියන්න ඕනෑ රටේ අපරාධ ගැන සුළු අපරාධ පරීක්ෂණ කරන්න පත් කරලා තිබෙනවා අනුර දිසානායක මැතිතුමා. අද මොනවාද ඒවාට වෙන්නේ?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

තමයි ප්‍රධාන පරීක්ෂණ කරන්නේ. අනෙක් පරීක්ෂණ කරන්න අනුර කුමාර මැතිතුමා තමයි පත් කරලා තිබෙන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

එක්ක එකතු වෙලා JVP එකේ අනුර කුමාරත් ගහන්නේ එකම ගැටයක් බව අපට පැහැදිලිව දැන් පෙනීගෙන යනවා. මොකද, මේගොල්ලෝ බබ්බු නොවෙයි නේ? ඒක දැක්කාම කියන්න -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක ලියලා දීලා නිශාන්ත වර්ණසිංහ මන්ත්‍රීතුමා හොඳට බලාගෙන ඉන්නවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමන්ලාට වාගේ අපට නිශාන්ත ලියන්න අවශ්‍ය නැහැ. අපි බබ්බු වෙලා නොවෙයි දේශපාලනේට ආවේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමියට කාලය දෙනවා. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍ර ශ්නය කියන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමාගේ නම ප්‍රකාශ කරන්න දීලා ඔබතුමා බලාගෙන හිටියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම ප්‍රකාශ කරමින් එතුමිය කථා කරනවා. ඒ අනුව අනෙක් මන්ත්‍රීවරුන්ටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ප්‍රකාශ කරමින් කථා කිරීමට ඔබතුමා අවසර දෙනවාද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මම ඒකට සමාව ඉල්ලනවා. සමාවෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න පුළුවන්ද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හරි, හරි. වැරැදක් වුණාම සමාව දෙන්න පුළුවන් නේ? ඔබතුමා ඉන්න. සමාවෙන්න. ඒකට සමාව ඉල්ලනවා. ඒකෙන් අයින් කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

යම් දෙයක් හිතනවා නම් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අයින් කරන්න කියලා සමාව ඉල්ලනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හරි, හරි. අපි එහෙමවත් කරනවා. ඔබතුමන්ලාට එහෙමවත් කරන්න බැහැ නේ? සමහර පක්ෂ හිතාගෙන ඉන්නවා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන දින්නේ තමන්ගේ වෙන වෙන පක්ෂවල ඡන්දෙන් කියලා. නමුත් මේ රටේ ජනතාවගේ (බාධා කිරීම්) ජයග්‍රහණයක් තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජයග්‍රහණය කියන්නේ. ඔය කියන පක්ෂවලට තිබුණා, ඒ අයගෙන් කෙනෙක් ඉදිරිපත් කරන්න. එහෙම නම් ඔය තියෙන ඇමැතිකම් ටිකවත් ලැබෙන්නේ නැති බව දැනගත යුතුයි. මොකද, දුන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මිසක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් හදන්න නොවෙයි. මේ රටේ මිනිස්සු දුන්නේ පොදු අපේක්ෂකයාට. නැත්නම් එක්සත් ජාතික පක්ෂයට තිබුණා නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

අගමැතිතුමාව දාන්න. ඒ නිසා හැම කෙනෙක්ම තමන්ගේ මට්ටම හරියට දැනගෙන කථා කළොත් බොහොම හොඳයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි රතන නායක හාමුදුරුවෝ කථා කරන්නේ නැත්තේ?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

රතන හාමුදුරුවෝ කථා කළ යුතු වෙලාවට කථා කරනවා. ඉතින් ඒ නිසා මේ රටේ පොදු ජනතාව දැනගත යුතුයි මේ 19 වැනි සංශෝධනයට අපි අකමැති හේතු මොනවාද කියලා. අපි ඉදිරියේදී ඒක දැනුවත් කරනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැවතත් නම ප්‍රකාශ කළා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා මේක සංශෝධනය කරන්න. ඒකට අපි කවදාවත් ඉඩ දෙන්නේ නැති බව වගකීමෙන් කියනවා. අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි.

[අ.භා.01.39]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුලින්ම මම කනගාටු වෙනවා එතුමියගේ රනිල් වික්‍රමසිංහ චරිතය පිළිබඳව හදවතේ තියෙන කුහකකම සම්බන්ධව. කොපමණ සමාවෙන්න කිව්වත් ආයිත් නම එනවා. ඕකම තමයි ඒ පක්ෂයේ නායකයාටත් තිබෙන ප්‍රශ්නය. අගමැති ධූරය වනාහී ඔහු සිතා සිටින්නේ, රනිල් වික්‍රමසිංහය කියලා. ඒ මානසික රෝගය, ඒ මේනියාව ඒ පක්ෂයේ නායකයාට තිබෙන තුරු ඔහු 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ කකුලෙන් අදිනු ඇත. ඒ මානසික රෝගය සුව කර ගැනීමට අලුතෙන් ප්‍රස්තුථයක් අවශ්‍යද මා නොදනිමි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම පැහැදිලිව කියනවා, 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ 1978 ඉඳලා

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

මේ රටේ බහුතර ජනතාවගේ උවමනාව මත ආපු යෝජනාවක් ලෙසිනි. මේ ගිය මැතිවරණයේදී මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අර ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු පොතේ කියන්නේ?

*"මා ජනාධිපති වූ විට අත්තනෝමතික බලතල ඇති විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සහ 19 වැනි සංශෝධනය සහ ස්වාධීන කොමිෂන් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ ආශිර්වාදය මට ලබා ගත හැක. තවද, අත්තනෝමතික විධායක බලතල අහෝසි කිරීමට එක්සත් ජාතික පක්ෂය මෙන්ම ජාතික හෙළ උරුමයද එකඟ වී ඇත. ජනතා විමුක්ති පෙරමුණ 1994 සිට මේ අත්තනෝමතික බලතල ඇති විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට නිරන්තර අරගලයක රැඳී සිටින බැවින් ඔවුන්ගේද මේ සඳහා ප්‍රශ්නයක් නැත."*

මේක තමයි එතුමිය අතේ තිබුණු පොතේ තිබෙන්නේ. ඒක තමයි මුල් ටිකේ තියෙන්නේ. හැබැයි, ඒ ටික එතුමිය කියන්නෙ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ 19 වැනි සංශෝධනය හරහා එනවා, එතුමාගේ නායකයා අපේ වේදිකාවල කථා කරලා මොකක්ද කිව්වේ? කෝටි 120 රේල් පාර කෝටි 1200 කට චීන සමාගමකට දුන්නේ අත්තනෝමතික බලතල ඇති ඒ විධායක ජනාධිපති ධූරය කැබිනට් පත්‍රිකාවක්වත් නොදා කියලා තමයි අපේ මැතිවරණ වේදිකාවේ කිව්වේ. අද අපි එන්නේ මොකටද? අද අපි විධායකයේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා විධායකයට එරෙහිව අධිකරණයට යෑමේ බලතල හදලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හරහා එදා 1978 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, කොල්වින් ආර්. ද සිල්වා, ඇන්.ඇම්. පෙරේරා මැතිතුමන්ලා හයිඩ් පිටියට ආවේ 78 අත්තනෝමතික බලතල තියෙනවා කියපු විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න. කොළඹට ඇවිල්ලා හති වැටුණු මහින්ද පර්සි රාජපක්ෂ මහත්මයා කොළඹ ඉඳලා හම්බන්තොටට පයින් ගියා මේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න. 1994 පාද චාරිකා කියලා හදාගෙන. හැබැයි, මේ ව්‍යවස්ථාවම පැය 24 කින් සංශෝධනය කරලා තුන්වැනි වතාවටත් ඉල්ලන්න පුළුවන් කියනකොට මේ ශ්‍රීලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එදා සන්ධානයේ කණ්ඩායම මේ රටේ මිනිස්සු 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය මොකක්ද කියලාවත් දන්නේ නැතුව 18 වෙනුවෙන් අත ඉස්සුවා. මෙහෙම ඉතිහාසයක් ගෙව්ලා දැන් මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි එන්නේ. අද මොකක්ද අහන්නේ? 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ මොකක්ද කිව්වේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ත්‍රිවිධ හමුදාවේ නායකයා විධායක ජනාධිපති. රාජ්‍ය නායකයා විධායක ජනාධිපති. හැබැයි, අපි ඒකේ පළමුවැනි කොටසේදී ආවා. ආණ්ඩුවේ නායකයා අගමැති කියලා. එතකොට මේ ආණ්ඩුව ඇතුළේම අපේ සන්ධානයේම හිටිය කණ්ඩායමක් එළියට බැහැලා පහුවදා උදේ ඉඳලාම කෑගැහුවා නැහැ, නැහැ මේක හරි යන්නේ නැහැ. හැබැයි, අපේ වේදිකාවල අත්තනෝමතික විධායක බලතල අහෝසි කරන්න කෑගහපු කට්ටිය කිව්වා, ආණ්ඩුවේ නායකකම අගමැතිට දෙන්න බැහැ. ඒ හිතුවේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා සදාකාලික අගමැති වෙලා ඉන්නවා කියලා තෘෂ්ණාවෙන්, තණ්හාවෙන්, කුහකකමෙන්. එහෙම හිතලා මේ ප්‍රකාශන කළා. ඊට පස්සේ ඒ වාක්‍යයත් සංශෝධනය කරලා කිව්වා, ආණ්ඩුවේ නායකයාත් විධායක ජනාධිපති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කියන්නේ? අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යම් යෝජනාවක් ගේනවාද, ඒකට ජනාධිපතිවරයා විරුද්ධද? විධායක ජනාධිපතිවරයා යම් යෝජනාවක් ගේනවාද, අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විරුද්ධද? එය පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවකට යොමු කරනවා. යොමු කරලා ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ විවාද කොට එය අනුමත කරනු ඇත. හරියට තරගයක Umpire ට Out එකක් දෙන්න බැරි වුණාම තරග තීරක තුන්වැනි විනිසුරුට දානවා වාගේ. හැම කෝණයකින්ම බලලා, තරග තීරකත් එක්ක තීන්දු කරලා ඔහු දැවී ගියාද, නොදැවී ගියාද කියලා තීන්දු කරනවා. ඒ වාගේ විධායක ජනාධිපති ධූරය අපි හිතමු කෝටි 20 පාරක් කෝටි 1200 ට ගේනවා. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විරුද්ධ වෙනවා. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යෝජනාවක් ගේනවා. විධායකය විරුද්ධ වෙනවා. එදාට තේරීම් කාරක සභාවට දාලා සමස්ත ජනතා පරමාධිපත්‍ය තිබෙන පාර්ලිමේන්තුව ඒ පිළිබඳව තීන්දුවක් ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකට අකැමැතිද? ඒකට කවුද අකැමැති. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා දැන් මම දන්නවා ශ්‍රී ලංකා නිදහස්

පක්ෂය කණ්ඩායම් දෙකකට බෙදිලා. අපි දන්නවා, ඔලිම්පික් දුවලා ගෝල්ඩ් මෙඩ්ල් ගත්තු මහින්ද රාජපක්ෂ මහත්මයා කැමැති වෙන්නේ නැහැ. මම හිතන මහින්ද රාජපක්ෂ කැමැති වෙන්නේ නැහැ ගමේ බනිස් කෑමේ තරගයට දුවන්න. ඔලිම්පික් දුවලා ගෝල්ඩ් මෙඩ්ල් ගත්තු එක්කෙනෙක් ගමේ බනිස් කෑමේ තරගයට දුවන්න එන්නේ නැහැ. හැබැයි බනිස් කෑමේ තරගයට ප්‍රසන්න රණතුංග මැතිතුමා කියනවා නම්, උදය ගම්මන්පිල මැතිතුමා දුවන්න කියනවා නම්, ඒ බනිස් කෑමේ තරගයට පාර්ලිමේන්තුවේ ඉන්න තනි තනි පක්ෂ දුවන්න කියනවා නම්, අපි දන්නවා මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ බනිස් කෑමේ තරගයට එනවා. ඒ ගැන කිසි ගැටළුවක් නැහැ. ඒ බනිස් කෑමේ තරගයට එන්න ඕනෑ. ඒ තරගයට එනකොට කවුරු හරි අත්දෙක ගැට ගහන්න එකක් නැහැ. ගැට ගහන්න හදයි. නමුත් ඒක එතුමාට ගැටළුවක් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි කියන්නේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

29 පාරක් බනිස් කෑවේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ බනිස් කෑමේ තරගයට මහින්ද රාජපක්ෂ මහත්මයා ගෙන එන්න ඕනෑ නම් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට මහින්ද රාජපක්ෂ මහත්මයාට ආදරය කරන අය අත උස්සන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මහත්මයාට ආදරය කරන මිනිස්සු 19 වැනි සංශෝධනයටත් අත උස්සන්න ඕනෑ. ඒක තමයි ඇත්ත. ඒ බනිස් කෑමේ තරගයට ඔහුව තියන්න ඕනෑ නම් ඒ බනිස් කෑමේ තරගයට ඔහුව ඉදිරිපත් කරන්න ඕනෑ නම් මේ 19 වැනි සංශෝධනයට ඒ මහින්ද රාජපක්ෂ මහත්මයාට ආදරය කරන අය ඉන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේ ඇමැති මණ්ඩලය වැඩි කරන්න වුණේ ඇයි? මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ බහුතර කැමැත්ත මට දෙනවා කියලා. දැන් අත උස්සන් ඇමැතිකම් ඉල්ලනවා. එතකොට එතුමාට ඇමැතිකම් දෙන්න වෙලා. ඒ ඇමැතිකම් දෙන්න වෙලා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ සන්ධානයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන්. එළියෙන් අරගෙන එතුමාට දෙන්න බැහැ. ඒ කට්ටියගෙන් ගන්න කොට දූෂණය නොකරපු එක්කෙනෙක් හොයන්න මැරුණු නැති ගෙදරකින් කිසාගෝතමියට අබ ගේන්න කිව්වා වාගේ වැඩක්. ඒක කරන්න බැහැ. ඒක ඇතුළේ ඉන්නේ ඔක්කෝම එහෙම කට්ටිය. ඒ නිසා ඒකෙන් ඇමැතිකම් දෙනකොට දූෂිතයෝ එනවා. ඒක කරන්න දෙයක් නැහැ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප්‍රේල් මාසේ 10 කියන්නේ ජාතියටම වැදගත් දවසක්. මේ රටේ බහුතර මිනිස්සු අවුරුදු 35 කට අධික කාලයක් ඉල්ලපු 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට එනවා. කවුරු හරි මේකට විරුද්ධ වෙනවා නම්, ඔහු ඔහුගේ හඳහන බලලා නම් ඒකට විරුද්ධ වෙන්නේ ඔහුගේ ග්‍රහචාරය අනුව නම් විරුද්ධ වෙන්නේ, අපට ඉතිහාසයේ ජාතිය පාවා දෙන්නන්ගේ ලැයිස්තුවටත් ඔහුගේ නම ඇතුළත් කරන්න සිද්ධ වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. (බාධා කිරීම්) කවුරු හරි -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කවුරු හරි ඉන්නවාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් සමහරු උදේට නැඟිටපු වෙලාවේ ඉඳලා ඩීල්, ඩීල්, ඩීල්. රට ගිහිල්ලා කුමන්ත්‍රණ, කුමන්ත්‍රණ, කුමන්ත්‍රණ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සන්ධානයක් හැදිලා මැතිවරණයක් ඉල්ලුවේ. අපි කැමැති නැහැ, කාටවත් ඇඟිල්ල දික් කරලා පහත් වෙන්න. තමන්ගේ චර්යාව, ලේවල තිබෙන ගතිය තමයි සමහරු පසුගිය කාලේ රූපවාහිනී චැනල්වලට ඇවිල්ලා පෙන්නුවේ. ඒ බාල කොලිටිය. බාල භාණ්ඩ. නමුත් ඒ බාල භාණ්ඩ ගණයට අපි ඇතුළු වෙන්න කැමැති නැහැ. සාමූහික වගකීමක් තිබෙනවා සන්ධානයක් විධියට අපට. ඒ නිසා අපි ඒක කරන්න කැමැති නැහැ. ඒ නිසා ඩීල් තියෙන්නේ කාටද? කුමන්ත්‍රණ තියෙන්නේ කාටද කියලා අපි දන්නවා. හැබැයි ඉතින් කවුද කිව්වා වාගේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කකුලෙන් ඇඳලා කුමන්ත්‍රණ කරපු අය මේ පැත්තටත් ඇවිල්ලා රනිල්ගේ කකුලෙන් අදින්න කුමන්ත්‍රණ කරන්න හදනවා. හැබැයි මහින්ද රාජපක්ෂ මහත්මායට දාපු වෙට්ටු රනිල් වික්‍රමසිංහට දාන්න ලබන ආත්මයේවත් බැහැ කියලා මම බොහොම සතුටෙන්, ගෞරවයෙන්, අභිමානයෙන් කියනවා. හැබැයි අපි බලාගෙන ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාත් රනිල්ට බැන්නා නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කවුද? ඉතින් කට වහගන්න කෝ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තමුන්නාන්සේට බොහොම පැහැදිලිව කියනවා ඒ නිසා සමහර අයට ප්‍රාර්ථනා තියෙනවා. ඒ අය කියන්නේ මොකක්ද? දැන් හිටපු ජනාධිපතිනිය ඒ අයට කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයෙන් නාම යෝජනා දෙන්නේ නැහැ. ඊට පස්සේ කියනවා එක්සත් ජාතික පක්ෂයෙන්. නැහැ, එහෙනුත් හම්බ වෙන්නේ නැහැ. දැන් අපි දන්නවා දෙපැත්තෙන්ම හම්බ වෙන්නේ නැති සමහරු ඉන්නවා. දැන් ඒගොල්ලෝ ගේම් ගහනවා. ඒගොල්ලෝ ඩීල් කරනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අය හිතාගෙන ඉන්නවා මට නම් නොවෙයි. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන්ට කියන්න. ඒ අය හිතාගෙන ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කඳක් තියෙන්නේ. ඔළුවක් නැහැ කියලා. ඒ ඔළුව බට් කරන්න පුළුවන්ද කියලා ඒගොල්ලන්ගේ පක්ෂයේ නායකයා දාලා. ඒකත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කරන්නත් බැහැ. ඒකේ නායකයෝ රාශියක් පෝළිමේ ඉන්නවා. ඒ නිසා ඒකට බට් කරන්නත් බැහැ. අපේ පැත්තට හීනෙන් එන්නවත් බැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පක්ෂ දෙකෙන් එකකටවත් එහෙම කියන අපට බලපෑම් කරන්න බැහැ. ඡන්ද කළා. ඡන්දවලට කරපු දායකත්වය ගැන කථා කරන්න ගියොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නැවතත් කියනවා ඒ බාල කොලිටියට මට වැටෙන්න බැහැ. ඒ නිසා මම ඒ කොලිටිය කථා කරන්නේ නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දින 100 ට මේ රටේ හැටතුන් ලක්ෂයක් ඡන්දය පාවිච්චි කළේ අත්තනෝමතික බලතල ඇති විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්න මිස වෙනත් කාරණයකට නොවෙයි. (බාධා කිරීමක්) මොකක්ද නෝනා ගිරා පැටියා වාගේ නේ? පොඩ්ඩක් ඉන්න කෝ? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දැනෙන තැනකට රිදෙන්න, වදින තැනකට වදින්න කියන්නේ. දැන් මම ඔබතුමියගේ නායකයාගේ නමක්වත් කියන්නේ නැහැ. පටන් ගත්තු වෙලාවේ ඉඳලා රනිල්, රනිල්. රනිල් නිසා ඔබතුමියගේ නායකයාගේ අනාගතය නිල්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒක ලියාගන්න. රනිල් නිසා ඔබතුමියගේ නායකයාගේ අනාගතය නිල්. ඒක තමයි ඇත්ත කතන්දරේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස් එකක ගෙනියන්න 10 ක් හිටපු නැති පක්ෂ ඉන්නවා. ඒගොල්ලන්ගේ බහුතර බලය තියෙන්නේ කියපු ආසනවල. අපිත් හිටියා. 10 දෙනෙක් ගේන්න බැරි වුණා. ඡන්දයෙන් පස්සේ ස්තූති කරන්න 20 ක් එකතු කර ගන්න බැරි වුණා. මම එකතු කරලා ස්තූති කරන්න හදලා යවපු නායකයෝ ඉන්නවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියන්නේ අපි මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමක් එළියට ඇවිල්ලා, එක්සත් ජාතික පක්ෂයේ අපි ඡන්දය පාවිච්චි කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්ව ජනාධිපති කරන්න. ඔළුවේ අමාරුවක් තිබුණේ නැහැ. තිබුණු එකම අමාරුව තමයි අත්තනෝමතික බලතල තිබෙන විධායක ජනාධිපති ධූරය අහෝසි කරලා, 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන එකයි. අද ජනාධිපති ධූරයට විරුද්ධව උසාවි යන්න පුළුවන් තැනට මේ 19 එනකොට සමහරු අකැමැතියි. දැන් මොකක්ද කියන්නේ? අපේ වේදිකාවේ උදේ ඉඳලා රෑ වෙනකල් ජනාධිපතිවරණයේ විධායකය අහෝසි කරන්න කියපු අය දැන් කියනවා මේ මොකක්ද? පාර්ලිමේන්තුවට බලතල දෙන්නේ කොහොමද ඔය කියන ඔක්කෝම තියලා. විධායකයත් එක්ක. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණා මත -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපි ඔබතුමාට බොහොම පැහැදිලිව කියනවා අපි අද ඉතිහාසයේ වැදගත්ම තැනකට ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා අපි මොන දේශපාලන පක්ෂයට අයිති වෙන්න පුළුවන්. අපේ පක්ෂයේ ඉන්නේ පාර්ලිමේන්තුවේ අඩු ප්‍රමාණයක්.

නමුත් අපි අගමැති ධූරය ගත්තා. නමුත් අපි දැක්කා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විපක්ෂ නායකතුමා කියනවා එක්තරා ඇමැතිවරයෙකුට විශ්වාසභංගයක් ගෙන එනවා කියලා. ඒවා ගෙනාවේ නැහැ. ඒ ගෙනාවේ නැත්තේ ඇයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ගේන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා කාරණා කිහිපයක් තිබෙනවා. දැන් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා පක්ෂයේ නායකයාට විරුද්ධව ප්‍රකාශන කරනවා. පක්ෂයට විරුද්ධව යනවා. නමුත් එතුමාට විනය පරීක්ෂණ කරන්නේ නැහැ. ඒ කරන්නේ නැත්තේ ඇයි? මේ වැදගත්ම කාරණය තියෙන්නේ අප්‍රේල් මාසේ 10 වැනිදා. 10 වැනිදා මේ රටේ සියලු දෙනාම තමන් මොන දේශපාලන පක්ෂයේ හිටියත් අත්තනෝමතික විධායක බලතල අහෝසි කරන්න පාර්ලිමේන්තුවේ අත උස්සන්න ඕනෑ. ඒක කරන්න බැරි කවුරු හරි ඉන්නවා නම්, ඒ කරන්න ඇඹරෙන අය ඉන්නවා නම්, ඒක කරන්නේ නැත්තේ හදහන නිසා නම් සමහර විට කොටු පාළු වෙලා තියෙන්න ඇති. 19 බිල්ලට දීලා හදහනේ පාළු කොටු පුරවා ගන්න හදනවා නම් ඒගොල්ලෝ ඔක්කෝටම අපි කියන්නේ 10 වැනිදාට ඉතිහාසයේ කුණු බක්කියට යනවා. ඒ නිසා ඒ පාපය ඒ කාලකණ්ණි කුමන්ත්‍රණය, කාලකණ්ණි නායකයන් වෙනුවෙන් කරන්න එපාය කියන ඉල්ලීම කරමින් අප්‍රේල් මාසේ 10 වැනිදා ඉතිහාසයේ වැදගත්ම දේශපාලන තීන්දුවක් ගන්න තිබෙන දවසේ තමන්ගේ දරුවා ගැන හිතලා, හෘදය සාක්ෂියට එකඟව හිතලා තමන් වැඩ කරන පක්ෂයේ නායකයාගේ පසුගිය කාලයේ වුණු වේදනා, පළිගැනීම් ඔක්කෝම හිතලා, රටත් ගැන හිතලා තීන්දුවක් ගන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉල්ලා සිටිනවා.

[අ.භා.01.51]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම සන්තෝෂ වෙනවා අපේ සහෝදර මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව. අපි බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ හිටියත් පාර්ලිමේන්තුවේ අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, විපක්ෂය තමයි මම හිතන්නේ නියෝජනය කරන්නේ. ඉතින් අපි ඒ වෙනුවෙන් හඬ නඟන්න ඕනෑ වැඩ පිළිවෙළ තුළ - අද උදේ ඉඳලා මම දැක්කා, අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමන්ලා අද අපි කරන්න ඕනෑ වැඩේ එතුමන්ලා විසින්ම කරනවා. මම හිතන්නේ එදා දෙයියන්ගේ හාල් කැවිලා, පිස්සු හැදිලා දැන් අද යථා තත්ත්වයට ආවාම ආපහු හැරිලා බලනවා කර ගත්තු දේවල්. ඒවා වෙනුවෙන් පව් සමා කරන්න තමයි මම හිතන්නේ ඒ අය උත්සාහ කරන්නේ.

ඒ නිසා ඇත්තටම අද මේ 19 වැනි සංශෝධනය ගැන අපි කියනවා. මහ ලොකුවට හැමෝම කථා කරනවා. කථා කළාට මේ 19 සංශෝධනය කරන්න කියන එක වචනයකින් කියනවා වුණාට ඒ තුළ ගැබ් වෙලා තියෙන්නේ, ඒ තුළ අරමුණ මොකක්ද කියන එක කවුරුවත් වැඩිපුර කථා කරන්නේ නැහැ. දැන් අපි විධායක ක්‍රමය ගැන කථා කළාට ඒ තුළ අග්‍රාමාත්‍ය තනතුර ගැන එන වැඩ පිළිවෙළ තුළ කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒක වහලා තමයි ඇත්තටම කථා කරන්නේ. ජනාධිපතිවරණයේ නංගි පෙන්නලා අක්කා දුන්නා වාගේ වැඩ පිළිවෙළක් තමයි මම හිතන්නේ 19 වැනි සංශෝධනයෙනුත් කරන්නේ. අද ඒ තුළ මේ රජය බිහි කරන්න, මේ ජනාධිපතිතුමා බිහි කරන්න කටයුතු කරපු ඒ වෙනුවෙන් උනන්දු වුණු නොයෙක් පක්ෂ අද ඒ තුළම අර්බුදයක් හට ගෙන, ඒ තුළම මහ අවුල් ගොඩකට පත් වෙලා තිබෙනවා. ඒ තුළ අපි දකින්නේ දින 100 වැඩ පිළිවෙළක් ජනතාවට ඉදිරිපත් කළා. කවදාවත් දිනයි කියලා හිතන්නේ නැතුව මේ දින 100 වැඩ පිළිවෙළ හදලා ඉදිරිපත් කළාම යම්කිසි වාසනාවකට දිනුවා. නමුත් කරගන්න බැහැ. දිනෙන් දින ගිය වැඩ පිළිවෙළවල් තුළ 19 කියන වැඩ පිළිවෙළ විතරක් අරගෙන ඒක ඉස්සරහාට ගෙන යන වැඩ පිළිවෙළක් තමයි කථා කරන්නේ. ඔය තුළ දින 100 ට වැඩ 100 ක් තිබෙනවා. කෝ ඒවා ගැන, වුණු දේවල් ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඉතින් මේ සියලු දේ එකම අරමුණක් කරා තමයි මම හිතන්නේ බිහි වෙලා තිබෙන්නේ. සියලුම පක්ෂවල එකම අරමුණ තිබෙන්නේ, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ නැවත මැතිවරණයට එයි. තරගයට එයි කියන වැඩ පිළිවෙළ, එන එක වළක්වන වැඩ පිළිවෙළ තුළ තමයි හැමදාමත් සියලුම නීති ගෙන එන්නේ.

[ ගරු ලලිත් වර්ණකුමාර ]

සියලු වැඩ පිළිවෙළවල් ගෙන එන්නේ කියන එකයි මම දකින්නේ. ඒ නිසා ඒකට දාන්න පුළුවන් බාධාව, ඒකට දැමිය යුතු සියලු බාධාවල් දාලා ඒක නවත්වන වැඩ පිළිවෙළක තමයි ඉන්නේ. නමුත් ජනතාව බලාපොරොත්තු වුණු ජනතාව ලබා දීපු පොරොන්දු අද කිසිවක් ඉටු වෙන්නේ නැහැ. එදා අපේ ගම්වල බැලුවාම මංවාවත් දිගින් දිගට හදාගෙන ආවා. පාසල් ගොඩනැගිලි හදාගෙන ආවා. අද කියන්න කනගාටුයි. බුලත්සිංහල ආසනයේ අපි කරගෙන ආපු වැඩ පිළිවෙළවල් තුළ අද ළමයින්ට ඉගෙන ගන්න පන්ති කාමරයක් නැහැ. සමහර කාමර තිබෙනවා සිමෙන්ති ටික දාගන්න විධියක් නැහැ. ඉතින් ඒ වැඩ පිළිවෙළයි ජනතාව බලාපොරොත්තු වුණේ. ඒ ගෙනාපු සංවර්ධනය එතැනින් එහාට ගෙන ගියා නම් මේ ආණ්ඩුවේ අපට ඇත්තටම කථා කරන්න දෙයක් නැහැ. නමුත් එහෙම වුණේ නැහැ. ඒ සංවර්ධන වැඩ, ජනතාවගේ බලාපොරොත්තු සියල්ලම සුන් කරලා එකක් දෙකක් ගැන කථා කරමින් ඉස්සරහාට යන්න හදනවා.

ආයිත් මේකේ බලය අරගන්න. ඉතින් මම දකිනවා විශේෂයෙන්ම, අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හර්ෂණ රාජකරුණා මැතිතුමා කිව්වා ජාතිවාදයක් ගැන කිව්වා. මෙතුමිය කිව්වා වාගේ ජාතිවාදයක් මෙහි නැහැ. මම කියන්නේ ජාතිවාදය ඇති කළා නම්, ඔය හංසයාගෙන් තරග කරපු වකවානුව තුළ තමයි මම හිතන්නේ ජාතිවාදය ඇති වුණේ. එක කොටසක් දෙමළ ජනතාව එක පැත්තකට අරගෙන, මුස්ලිම් ජනතාව එක පැත්තකට අරගෙන මේක ජාතිවාදය බවට පත් කරන්න මුලින්ම කටයුතු කළේ එතුමා. ඊට ඉස්සෙල්ලා මේ සභාවල් තුළ, ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ ඔය සියලු දෙනාම නියෝජනය කළා. එල්.ටී.ටී.ඊ. එකේ හිටපු කරුණාඅම්මාන් වැනි නායකයනුත් ඒ පක්ෂයේ උප සභාපති හැටියට අරගෙන ඒ සම අයිතිය සියලු දෙනාට දීපු ඉතිහාසයක් තිබුණා. අද ඒ නිසා ජාතිවාදය පටන් ගත්තේ කොතැනින්ද කියන එකත් අපි සොයා බලන්න ඕනෑ. ඉතින් ඒ නිසා ජනතාවගේ වැඩ පිළිවෙළට උත්තරයක් නැතිව - ජනතාවට එදා වැරැදුණු තැන හදා ගන්න උත්සාහ කරන තැන, වැරැදුණු තැන හදාගන්න උත්සාහ කරන මොහොතේ ඒකට හයේ තමයි මේ රජය හැම වැඩ පිළිවෙළක්ම ක්‍රියාත්මක කරන්නේ. මම අපේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට මතක් කරනවා. ඔබතුමා කිව්වා, ඊළඟ මහ මැතිවරණයේ අලියාගෙන් තරග කරනවා කියලා. මම අභියෝග කරනවා, ඔබතුමන්ලාට අලියාගෙන් තරග කරන්න බැහැ. ඔබතුමන්ලා අලියාගෙන් නොවෙයි තරග කරන්නේ. අලියාගෙන් තරග කරන්න බැරි බවට මම ඔබතුමන්ලාට අභියෝග කරනවා. මොකද, මේ වැඩ පිළිවෙළ කොයි ආකාරයට ද යන්නේ කියලා ජනතාව බලාගෙන ඉන්නවා. අපි කොහොම කථා කළත් මේ ඉහළ තැන්වල ජනතාව අපට වැඩිය ගොඩක් ඉහළට හිතලා ගොඩක් දේවල් තේරුම් අරගෙන වැඩ කරන්නේ. ඉස්සර ඕනෑ නායකයෙකුට ජනතාව රවට්ටන්න පුළුවන්. අද රවට්ටන්න බැහැ. අද ජනතාව රවට්ටන්න වටපිටාවක් ගොඩනැඟිලා නැහැ. අද ජනතාව දියුණුයි. ඒ නිසා තමයි විශේෂයෙන්ම අලුත් ඡන්ද, අලුතෙන් බිහි වුණු සාමාන්‍යයෙන් අවුරුදු 23, 25 දරුවන් වෙනත් ආණ්ඩු දැකලා තිබුණේ නැති නිසා ඒ ළමයි වෙනස කියන වචනයට ඒ සහයෝගය දුන්නා. වෙනසක් දකින්න ඕනෑ නිසා. නමුත් ඒ දකින වෙනස ඒ අය දැන් හොඳට දැකලා තිබෙන්නේ. ඒ වාගේම බලය අඩු කරන්න දීපු ශක්තිය අද සියලු දෙනාට හොඳට තේරිලා තිබෙන්නේ. ඒ නිසා තමයි ඒ වෙනසට වෙනසක් කරන්න සියලු දෙනාම බලාගෙන ඉන්නේ.

අද ව්‍යාපාරික පැත්ත බැලුවත් ඉතාමත්ම පහළ මට්ටමකට වැටිලා රටේ ජනතාව බලාපොරොත්තු නොවුණු තැනකට ඇවිල්ලා තිබෙන්නේ. සිංහල අවුරුදු වකවානුවක් එන්නේ. ඒ තුළ අද අවුරුද්දට ඇඳුම් ටිකක් ගන්නේ කොහොමද කියලා ජනතාව බලාගෙන ඉන්නේ. හුල්ල හුල්ල ඉන්නේ. අද කෙටියෙන් කිව්වොත් ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ හෙරෝයින් ව්‍යාපාරිකයෝ අද ගොඩක් පසුතැවිල්ලට පත් වෙලා තිබෙන්නේ. මොකද හෙරෝයින් එනවා වැඩියි. මිල අඩු වෙලා තිබෙනවා. ලාභ වෙලා තිබෙනවා. අද ඒ තරමටම මේ රට පල්ලෙහාට ගිහිල්ලා තිබෙන්නේ. ව්‍යාපාරිකයන්ට. ඒ තරමට හෙරෝයින් ලංකාවට එනකොට අද ඒකෙත් මිල අඩු වෙලා තිබෙනවා. මම හිතන්නේ මිල අඩු වුණු නිසා ඒ අය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නවත්තලා තිබෙන්නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

නවත්තලා නොවෙයි. වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මිල අඩු වෙලා තිබෙන්නේ. අද අපේ ගම්වල අවුරුදු ගණනක් කසිප්පු බෙදපු නැති අය අද දවසකට ලක්ෂ 1 ½ ක බිස්නස් කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඉතින් ඕක තමයි යහපාලනය හැටියට අපි දකින්නේ. මම ඇත්තට මීට වැඩිය කථා කරන්නේ නැහැ. කෙසේ වෙතත් අපි අපේ අරමුණ කරා, මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය තුළ - නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අයින් කරන්න ඕනෑ දේවල් තිබෙනවා. නමුත් අයින් කරන දේවල් තුළ ඒවා හරියාකාරව බලලා කරන්න ඕනෑ වැඩ තිබෙනවා. ඉදිරියේදී ත්‍රස්තවාදයක්, මේ රටේ අර්බුදයක් ඇති වෙනවා නම් ඒකට විධායකය අවශ්‍ය ආකාරයට කටයුතු කරන්න ඕනෑ කියලා මතක් කරන්න ඕනෑ. ඒ නිසා දවසට විතරක් නොවෙයි. රටේ ඉදිරි අනාගතයට බලපාන විධියට සංශෝධන විය යුතුයි කියන එක මතක් කරමින් ඔබ සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා.01.59]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දවස්වල අපි පාරට බැහැලා ජනතාව අතරට යනකොට අපෙන් ජනතාව අහනවා, කොහොමද මන්ත්‍රීතුමා යහපාලනය කියලා. ඉතින් ඒ නිසා යහපාලනය ගැනම කියලා පොඩ්ඩක් අදහස් දක්වන්න ඕනෑය කියලා මම හිතුවා. ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා හිටියා නම් හොඳයි මේ ටික අහගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යහපාලනය කියන්නේ අපි දන්නා අර්ථයෙන් දේශපාලන ක්‍රියාදාමයේ ක්‍රමානුකූල වෙනස්කම් ඇති වෙලා යහපත් දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත වීම, එහෙම නැත්නම් දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇති වීමයි. දැන් අපි සාමාන්‍යයෙන් සංවර්ධනය මනින්නේ මානව සංවර්ධනය කියලා. මානව සංවර්ධනයට යහපාලනය ඉතාම අවශ්‍යයි. හැබැයි, කනගාටුවට කාරණය අපේ රටේ මේ යහපාලනය කියන එක හුදෙක් සංකල්පයකට විතරක් පසුගිය යුගයේ සීමා වෙලා තිබුණා. අපේ රටේ ක්‍රියාත්මක වුණේ යහපාලනයට ප්‍රතිවිරුද්ධ ක්‍රියාදාමයක්. ඒ මොනවද? වගකීම වෙනුවට වගනොකීම. ඒ වාගේම විනිවිදභාවය වෙනුවට වසන් කිරීම. ප්‍රතිචාරය වෙනුවට ප්‍රතිප්‍රහාරය. ඒ වාගේම සාධාරණය වෙනුවට අසාධාරණය. නීතියේ ආධිපත්‍ය වෙනුවට අපට දකින්න තිබුණේ දේශපාලන ආධිපත්‍යයයි. ඒක නිසා අපේ රටේ ජනතාව පසුගිය ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව මේ රටේ ජනාධිපති කළේ යහපාලනය ඇති කරන්න කියලා. යහපත් දේශපාලන සංස්කෘතියක් හදන්න කියලා. මේ යහපාලනය ප්‍රජාතන්ත්‍රවාදයේ ලෝකය පිළිගත්ත සංකල්ප, වචනයේ අර්ථයෙන්ම හරි ලෙස ක්‍රියාවට නඟන්න කියලා. නමුත් අපේ රට වෙලාගෙන තිබුණු ඒ පාදඩ දේශපාලන ක්‍රියාවලිය තමයි හරි දේ කියලා හිතමින් හිටපු ඒ පරිසරය වෙනස් කිරීමේ අවශ්‍යතාවය සුළුපටු එකක් නොවෙයි. නමුත් ඒ අවශ්‍යතාව යළි යළිත් මතු වෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දැන් මේ රට විකෘතියට ඇදලා දැම්මේ කුමක් විසින්ද? මේ දේශපාලන විකෘතියට ඇදලා දැම්මේ කොහොමද? අපේ රටේ ජනතාව පසුගිය ජනවාරි 08 වැනිදා ඡන්දය දුන්නේ කවර බලාපොරොත්තු ඇතිවද? ගරු නියෝජ්‍ය සභාතිතුමනි, ජනතාව කාරණා දෙකක් බලාපොරොත්තු වුණා. එකක් තමයි, මේ රටේ යහපාලනය ඇති කරන්න වංචාව, දූෂණය, අවනීතිය මේ රටෙන් තුරන් කරන්න ඕනෑය කියන එක. දෙවැනි කාරණාව හැටියට ජනතාව බලාපොරොත්තු වුණා, වසර 20 ක් තිස්සේ කියමින් හිටපු මේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරලා රටට එලදායි වන, රටේ යහපාලනය ඇති කරන්න පුළුවන් නව ව්‍යවස්ථා සංශෝධනයක් සිදු විය යුතුයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යහපාලනයේ පළමුවැනි එක හරී. පොළොවෙන් අයින් කෙරුවා. දූෂණය, නාස්තිය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ හරය හැටියට ජනතාව බලාපොරොත්තු වුණේ, 17 වන ව්‍යවස්ථා සංශෝධනය. මේ රටේ ස්වාධීන කොමිෂන් සභා බිහි කළ යුතුයි. ඒ වාගේම ඒකාධිපති පාලනයට පාර කපපු 18 වන ව්‍යවස්ථා සංශෝධනය වහාම අහෝසි කළ යුතුයි. ඒ නිසා ජනතාවට වග කියන පාර්ලිමේන්තු ක්‍රමයක් ස්ථාපිත කිරීම, ජනතා පරමාධිපත්‍ය නියෝජනය වන තැනින් ජනතාවගේ පාලනය ක්‍රියාත්මක වීම බලාපොරොත්තු වන ව්‍යවස්ථා

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

සංශෝධනයක් සඳහා ක්‍රියාත්මක විය යුතුයි කියන එක. එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ජනතාව අහන්නේ මේ බලාපොරොත්තු ඉෂ්ට වෙන, ඔවුන්ගේ අභිලාෂයන් ඉටු වන ගමන කරා රට යනවාද කියලා. ඒ කියන්නේ, යහපාලනය කරා මේ රට යනවාද කියලා. දැන් සමහරුන් අපෙන් අහන දෙයක් තමයි, දැන් චෝදනා ලැබුවා. වංචා කළයි කිව්වා. දූෂණ කළයි කිව්වා. කෝ ඒ අයට විරුද්ධව පියවර ගත්තාද කියලා. දැන් මෙතැන ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. හිඩසක් තිබෙනවා. ඒ හිඩස පුරවන්න තවමත් අසමත් වෙලා කියලයි ජනතාව චෝදනා කරන්නේ. එහෙමනම් මූලිකව ජනතාව බලාපොරොත්තු වුණු ඒ කාරණය ඉෂ්ට වුණේ නැහැ. (බාධා කිරීමක්) ඇයි? හොරු ටික අල්ලලා ඇතුළට දැම්මේ නැහැයි කියන එක. තේරුණාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කැබිනට් එකට දැම්මා නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි මම ඊළඟට කියන්න යන්නේ ගරු මන්ත්‍රීතුමා. දැන් බලන් ගියාම අපෙන් චෝදනා ලබපු, හොරකම් කළයි කියපු, මිනී මැරුම්වලට පවා සම්බන්ධ වුණු සමහර -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කැබිනට් එකට දැම්මා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා දන්නවා ඒක. ඒක තමයි මේ කැබිනට් එකට කියලා කියන්නේ. එතුමන්ලා පවා ඔන්න දැන් කැබිනට් එක ඇතුළේ ඉන්නවා. අන්න යහපාලනය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔන්න යහපාලනය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි අපිත් අහන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද යළිත් වරක් සමහර දේශපාලඥයන් අර පසුගිය කාලයේ තිබුණා වාගේ නැවත සැරයක් පටන් අරගෙන තිබෙනවා, අර කේවල් කිරීමේ, එහෙම නැත්නම් අර සල්ලිවලට ගැනීමේ දේශපාලනය. මට ඊයේ කෙනෙක් කිව්වා. මේ ආණ්ඩුවේ ඇමැති කෙනෙක් ගෙනැල්ලා තිබෙනවාලු, ගෑස් ලිප් 1000 ක්, ගෑස් සිලින්ඩර් 1000 ක් ඡන්දයට බෙදන්න. ඒ නිසා අද මේ දේශපාලන කතන්දර කියලා ගොඩ වැඩි කරගෙන ආණ්ඩු බලය පැහැරගෙන තවදුරටත් බලයේ රැඳී සිටීමට දරන උත්සාහයන් පරාජය කළ යුතුයි. මා මෙහිදී කියන්න බලාපොරොත්තු වුණු ඒකත් වැදගත් කාරණයක්.

දැන් මේකට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න විවිධ විරෝධතා තිබෙනවා. විවිධ ප්‍රශ්න තිබෙනවා. හැල හැප්පීම් තිබෙනවා. හැබැයි, එකක් තිබෙනවා. මෙතැන අවුලක් තිබෙනවා. පැහැදිලිව අපි පක්ෂයක් හැටියට පිළිගන්නවා. රටේ මේ ප්‍රශ්නයේ අවුලක් තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ලොකු චිත්‍රය බැලුවාම රට අවුලෙන් බේරිලා තිබෙන්නේ. ඒ නිසා මේ අවුල් ටික විසඳගෙන යන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා. ඒකට 2/3 අවශ්‍යද? එහෙම නැත්නම් ඒක ජනමත විචාරණයක් කරා යන්න ඕනෑද? ඒ ප්‍රශ්න අධිකරණය හමුවේ තිබෙන ප්‍රශ්න. ඒ නිසා ඉදිරියේදී හරි තීරණය ගන්න කියලා ජනතාව දැනුවත් කරන්න අපට අවශ්‍යයි. ඒක නිසා මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. විධායක ජනාධිපතිවරයා තමන්ගේ විධායක බලතල පාවිච්චි කරන්නේ නැතිව විධායක ක්‍රමය අහෝසි කළ යුතුයි කියන අතරේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව කියනවා, වහාම ඒක අහෝසි කරලා පාර්ලිමේන්තුවට බලය දෙන්න ඕනෑය කියලා. ඉතාම හොඳයි. රටට අවසානයේ යමක් විය යුතුයි. රට හරි අතට යා යුතුයි. අවුරුදු 20 ක් තිබෙන ප්‍රශ්නයක්. මෙපමණ කල් මේකට යෝජනා ගෙනාවා. ඕනෑ තරම් තර්ක කළා. නීති තර්ක ඉදිරිපත් කළා. අවුරුදු 20 ක්. පොරොන්දු ඕනෑ තරම් දුන්නා. ඒ නිසා මේක ගැන ඕනෑවටත් වැඩිය පරිචයක් තිබෙනවා, අපේ රටේ දේශපාලඥයින්ට. පාලකයින්ට. ඒ නිසා මේක ගැන තීරණයක් ගැනීම ඉතාමත් පහසු කටයුත්තක් හැටියටයි මම විශ්වාස කරන්නේ.

මම උදාහරණයක් කියන්නම්. බැලූ බැල්මට පොඩි බරපතළ අවුල් සහගත තත්ත්වයන් තිබෙනවා කියලා නිකන් පේනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවසන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය මාර්තු 24 වැනිදා 27 හැවිරිදි අන්ඩ්‍රෙස් ලුබිට්ස් කියන සහාය නියමුවා A 320 Air Bus යානයක් මගීන් 150 ක් එක්ක ප්‍රංශයේ ඇල්ෆ්ස් කඳු වැටියේ හප්පලා විනාශ කරනවා. ඒ විනාශ කරන කොට නියමුවා ඉන්නේ දොර ළඟ. ටොප් පිට් එකේ දොර ළඟ ඉන්නේ. නියමු කුටියේ දොර ළඟ එළියේ ඉන්නේ. අර සහාය නියමුවා දොර අරින්නේ නැහැ. දැන් මට හිතනවා සහාය නියමුවයි, නියමුවයි හරියට රනිල් වික්‍රමසිංහයි, මෛත්‍රීපාල සිරිසේනයි වාගේද කියලා. ඒ නිසා මේක හප්පලා විනාශ කරන්න බැහැ. මේක රට පිළිබඳ ප්‍රශ්නයක්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා, දැන් සහාය නියමුවාද රනිල් වික්‍රමසිංහ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා හරි. ඒක හරි නේ. දැන් තිබෙන තත්ත්වයත් එක්ක ඒ විග්‍රහ කරන්නේ. ඒ නිසා මේ යන ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අවුලක් තිබෙනවා. හැබැයි, මම කියන්නේ මේක රට පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මේ රට පිළිබඳ ප්‍රශ්නයේදී අවුල් හදා ගන්නේ නැතිව මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා සියලු දෙනා එකට එකතු වෙලා කටයුතු කරන්න ඕනෑය කියන එක මා මේ සභාවේදී අවධාරණය කරන්න කැමැතියි.

[අ.භා.02.10]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීමක්) මම කාල්ටන් නොවෙයි. මේ රට ජාතිය නැවත බේරගන්න මහින්ද රාජපක්ෂ මහත්මයාව මේ රටේ නැවත නායකත්වයට ගෙනෙන්න කටයුතු කරන කෙනෙක්.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අනේ අම්මෝ. අපේ ජීවිත හානි වෙයි එතකොට.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වැරැදියට තේරුම් ගන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අලුත් මහින්ද. හැඳුණු මහින්ද.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේක තමුන්නාන්සේලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එතකොට මෛත්‍රීපාල මහත්මයාට මොකද වෙන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෛත්‍රීපාල මහත්මයාට මම ඡන්දය දුන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේගොල්ලෝ මෙපමණ උදම් ඇණුවට ලක්ෂ පහකට අඩු සංඛ්‍යාවක් තිබෙන්නේ. ඒ ලක්ෂ පහකට අඩු සංඛ්‍යාව -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

2005 අපට එක් ලක්ෂ අසූ දාහයි අඩු.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ දින 100 ට ඡන්දය දෙන්නේ නැහැ,

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

2005 ලක්ෂයයි අපට අඩු වුණේ. අපි එතකොට මේ පිස්සු බල්ලෝ වාගේ එහේ මෙහේ දිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද දින 100 ට ඡන්දය දෙන්නෙ නැහැ, මේ දින 100 වැඩ පිළිවෙලේ තිබුණා නම් තේ මිල පහත බහිනවා කියලා. තේ කර්මාන්තකරුවාව බිමට වට්ටනවා කියලා තිබුණා නම් ඡන්දය දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන විවාදය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම තමුන්නාන්සේලා කියපු හින්දා කියන්නේ. අද තමුන්නාන්සේලා පිළිගන්න. අපේ පැතිවල රබර් කපන මිනිස්සු ඉන්නේ. රබර් තිබෙන මිනිස්සු ඉන්නේ. අද ඒ මිනිස්සුන්ට අවුරුද්දට ජීවත් වෙන්න විධියක් නැහැ. අවුරුද්දට අහිසංක දරුවෙකුට ඇඳුමක් අඳින්න විධියක් නැහැ. මේ රබර් කර්මාන්තකරුවන්ට මේ තත්ත්වය උදා වෙනවා කියලා කිව්වා නම් මේ දින 100 වැඩ පිළිවෙළට ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා. අධි ආරක්ෂක කලාප ඉවත් කරනවා කියලා මේ දින 100 වැඩ පිළිවෙළේ කිව්වා නම් තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැහැ. ඒ වාගේම හාල් මිල, අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල එදාට වඩා වැඩි වෙනවා කියලා කිව්වා නම් තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැහැ. ඒ වාගේම තමුන්නාන්සේලා කිව්වා, අර රජයේ නිලධාරීන්ට යතුරුපැදි දෙන කොට ලබා ගත්ත පනස්දාහ දෙනවා කියලා. ඒ පනස්දාහ දෙන්නේ නැහැයි කියලා කිව්වා නම් මේකට ඡන්දය දෙන්නේ නැහැ. දූෂණය, වංචාව නැති කරනවා කියලා තමුන්නාන්සේලා කිව්වා. හැබැයි, මේ විධියට දූෂණය, වංචාව වුණු කාලයක් මේ රටේ තවත් තිබුණේ නැහැ. ඒක මේ දින 100 තුළ හොඳටම ඔප්පු වුණා. මහ බැංකු අධිපතිවරයා කරපු දේත් එක්ක. තමුන්නාන්සේලා මේ විධියට දූෂණය, වංචාව කරනවා කිව්වා නම් මේකට ඡන්දය දෙන්නේ නැහැ. ඒ වාගේම විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ඔය විධියට ගහනවා කිව්වා නම් එහෙම තමුන්නාන්සේලාට මේකට ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා මේ වැඩිය උදම් අනන්න එපා. හරිද? ජනතාව තේරුම් අරගෙන තිබෙනවා, තරුණයන් තේරුම් අරගෙන තිබෙනවා,

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලාගේ දින 100 වැඩ පිළිවෙළ කොහොමද කියලා. නැහැ, නැහැ කිය කියා ඉන්න තමයි තමුන්නාන්සේලාට වෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා එක දෙයක් තේරුම් ගන්න. තමුන්නාන්සේලා මෙහෙම හිටියට ගමට ගිහිල්ලා බලන්න. ගමේ මිනිස්සු මොනතරම් දුක් විඳිනවාද කියලා. ඒක තමයි අද මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යන යන තැනට දහස් ගණන්, ලක්ෂ ගණන් සෙනඟ පිරෙන්නේ. හරිද? තමුන්නාන්සේලා ඒක තේරුම් ගන්න. තමුන්නාන්සේලාට ඒ දීපු ලක්ෂ හතර ඉවරයි. තමුන්නාන්සේලා මේක කියවලා බලන්න. මේකේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියලා. මේකේ 50% ක් ක්‍රියාත්මක වුණාද? ලැජ්ජා වෙන්න ඕනෑ. දින 100 තුළ තමුන්නාන්සේලාට මේක ක්‍රියාත්මක කරගන්න බැරි වුණාට.

අද අපිත් කනගාටු වෙනවා. අද හෙළ උරුමය, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ මේ වාගේ පක්ෂ ටික එකතු වෙලා තමයි, මේ අපේ ෆොන්සේකා මහත්මාගේ පක්ෂය, මේ සියලුදෙනා එකතු වෙලා තමයි මේ මහින්ද රාජපක්ෂ මහත්මයාව පරද්දලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කළේ. එතකොට දන්නවා රනිල් වික්‍රමසිංහ මහත්මයා මේකේ අගමැති වෙනවා කියලා. මෙතුමා කිව්වා වාගේ මේකේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්මයාව මෙකේ අගමැති කරනවා කියලා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ඒ දැනගෙන තමයි

මේ අය උදව් කළේ. මේ අය උදව් කරලා තමයි අද කියන්නේ මේක වැරැදියි. මේ වෙන ඒවා වැරැදියි කියලා. අද මේ අයට මොන්ටිසෝරි ළමයින් වාගේ කථා කරන්න බැහැ. මේගොල්ලෝ පැහැදිලිව ගමට ගිහිල්ලා මේවාට උත්තර දෙන්න ඕනෑ. මේ මොන්ටිසෝරි ළමයින් වාගේ ජනතා විමුක්ති පෙරමුණට, හෙළ උරුමයට, මේ ෆොන්සේකා මහත්මයාගේ මන්ත්‍රීවරුන්ට එහෙම කථා කරන්න අයිතියක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාල්ටන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කාල්ටන් කතන්දරයක් නැහැ. අද අපි මේ රටට වෙන දේ දැනගෙන තිබෙන්නේ. රටේ ආරක්ෂාව දැන ගෙන තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කාල්ටන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කාල්ටන් නොවෙයි. පොළොන්නරුවේ එකට යන්න තමුන්නාන්සේලා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමන්ලාගේ සභාපතිතුමා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ජනතාව උත්තර දෙනවා ඒවාට.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමාගේ සභාපති නොවෙයිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා. මූලාසනයට කථා කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා මොන පක්ෂයේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආ.... එහෙමනම් මොකක්ද කියන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාව අගමැති කරන්න හදන්නේ. හරිද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒක වෙනම කථාවක් නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි ඒක කරනවා. පැහැදිලිවම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාපතිතුමා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සභාපතිතුමා - මම පැහැදිලිව පෞද්ගලික මතයේ ඉන්නේ. ඔයිට වැඩිය හොඳයි සභාපතිතුමා ස්වාධීනව පැත්කට වෙලා හිටියා නම් හොඳයි. මම ඒක ඕනෑ තැනක පැහැදිලිව කියනවා. ස්වාධීනව පැත්තකට වෙලා සිටියා නම්. මොකද, එතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකම

ගන්නවාට වඩා එතුමාට අයිතිය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ සභාපතිකම ගන්න එකයි. මොකද, අපි නොවෙයි නේ පත් කළේ. එක්සත් ජාතික පක්ෂයෙන් -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඇයි දුන්නේ? ජනාධිපතිතුමා නේ දුන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එක්සත් ජාතික පක්ෂයේ සභාපතිකම ගන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හිටපු ජනාධිපතිතුමා නේ දුන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුනාන්සේලාගේ පක්ෂයේ. තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් නේ ජනාධිපති කළේ. ඒ නිසා පැහැදිලිව මම මතක් කරන්න ඕනෑ. මේ තමුන්නාන්සේලා වැඩිය උදම් අනන්න එපා. ලක්ෂ 05 කට අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. දින 100 වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා ක්‍රියාත්මක කළේ නැහැ. දින 100 එකක් දෙකක් අල්ලගෙන තමුන්නාන්සේලා කෑ ගහනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දින 100 ට දුන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේවා නොවෙයි. ජනතාවට ජීවත් වෙන්න ක්‍රමවේදයක් හදලා දෙන්න කියලා, මේ සංශෝධන ගේන්න. ඒවායේ ගැටලුවක් නැහැ. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ දින 100 වැඩ පිළිවෙළ තුළ මේ ජනතාවට ජීවත් වෙන්න ක්‍රමයක් හදලා දෙන්න. එහෙම නැති වුණොත් එහෙම තව දින 100 කට වඩා ජනතාවට ජීවත් වෙන්න බැරි වෙනවා. ඒ තැනට රට වැටිලා තිබෙන්නේ. තමුන්නාන්සේලා මෙතැන වාඩි වෙලා හිටියට ගමේ ජනතාවගේ තත්ත්වය මොකක්ද කියලා ගිහිල්ලා බලන්න. හරිද? තමුන්නාන්සේලා අත්‍යවශ්‍ය භාණ්ඩ කියලා මොනවද අඩු කළේ? තමුන්නාන්සේලාට පුළුවන් වුණාද, තමුන්නාන්සේලා කට්ටියම කෑ ගැහුවට අඩු ගණනේ අවුරුද්දට හාල් මිල අඩු කරලා දෙන්න. අවුරුද්දට කිරිබත් ටික -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පෙට්‍රල්අඩු කළා. ඩීසල් අඩු කළා. ලාම්පු තෙල් අඩු කළා.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අවුරුද්දට කිරිබත් ටික කන්න හාල් සේරුවක් ගන්න, ඒක අඩු කරගන්න තමුන්නාන්සේලාට පුළුවන් වුණාද? තමුනාන්සේලා කියන්නේ අවුරුද්දට කහ කන්න කියලාද? අවුරුද්දට කොත්තමල්ලි බොන්න කියලද? තමුන්නාන්සේලාගේ නායකයන්ට කියන්න. දැන් මේ පත් කරලා කෑ ගහන්න එපා. නායකයන්ට ගිහිල්ලා කියන්න. අවුරුද්දට කිරිබත් පොඩ්ඩක් කන්න හාල් මිල අඩු කරන්න කියලා. අද ඒ තැනට රට වැටිලා. ඒ නිසා මම තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා, වැඩිය උදම් අනන්න එපා. (බාධා කිරීම්) අපි පැහැදිලිව කියන්නේ, මේවා මොකුත් ඕනෑ නැහැ. අපි තමුනාන්සේලාට පෙන්වන්නම්. 23 වැනිදාට පාර්ලිමේන්තුව විසුරුවන්න කියන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

විසුරෝනවා. මැයි 05 විසුරෝනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලාට බලාගන්න පුළුවන් ජනතාව ඉන්නේ කොහෙද කියලා. ජනතාව ඉන්නේ කොහෙද කියලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජනතාව අට වැනිදා තීන්දුව දුන්නා. ආයි අඬන්න එපා. කථාව ඉවරයි. අයි කියන්න එපා. අප්පච්චි මළා. අඬන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලාව 29 පාරක් පැරැද්දුවා. පරද්දලා, තමුන්නාන්සේලාට එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් හිටියේ නැහැ, තමුන්නාන්සේලාට ඡන්දයට ගේන්න. මම තමුන්නාන්සේලාට කියනවා,

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එක්ක යන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පිනට ලැබුණු එකක්. ජනතාවගෙන් ලැබුණු එකක් නොවෙයි. (බාධා කිරීම්) පිනට ලැබුණු එකක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙමනම් තමුන්නාන්සේලා 29 පාරක් මළා. එම්බාම් කර කර තියා ගත්තේ. තවමත් එම්බාම් කරලා තිබෙන්නේ. තවමත් ඡන්දයෙන් දිනන්න බැරි වුණා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඒ නිසා මම තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා. ඡන්දයට ගේන්න. 23 වැනිදාට විසුරුවන්න කියන්න. විසුරුවාම අපි පෙන්වන්නම් ජනතාව කොහෙද ඉන්නේ කියලා. අපි මහින්ද රාජපක්ෂ මහත්මයාට නැවත රට භාර දීලා රට ඒකීය රටක් හැටිය හොඳ ආරක්ෂාවක් ඇතිව රට හදනවා කියන එක මතක් කරමින්, ජය වේවා! කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් දෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිංපියා කිව්වේ කාටද දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එක්කෙනෙකුට නොවෙයි. නමක් කිව්වේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කාටද කිව්වේ? අප්පච්චිටද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, නමක් කිව්වේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නමක් කිව්වේ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පිනට තනතුරු ලැබෙන්නේ. ඒ අයට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා කථාව පටන් ගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පිනට නොවෙයි. කටේ පවට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව පටන් ගන්න.

[අ.භා.02.18]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳව ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. නමුත් මම හිතුවා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියලා කිව්වාම ඇත්ත වශයෙන්ම අපි හඳුනාගෙන සිටියේ දැන උගත්, ඒ වාගේම නීති විශාරදයෙක් විධියට කටයුතු කරන අපේ නීතිඥ ශ්‍රීනාත් පෙරේරා මැතිතුමා. මේ මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියලා දැන ගත්තාම මම පොඩ්ඩක් පසුබට වුණා, ඇයි මේ වාගේ ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව එතුමා යෝජනාවක් ගෙනාවේ කියලා. මේ පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයක් කරලා, මම හිතන්නේ මේ යෝජනාව ගෙනාව නම් මේ සභාවට මීට වඩා ඵලදායි සාකච්ඡාවක්, සංවාදයක් අපට ඇති කරගන්න තිබුණා. මම හිතන්නේ එතුමා මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත අධ්‍යයනය කරලා නැහැ. එතුමා අද මේ යෝජනාව ගෙනාවේ මම හිතන්නේ වෙනත් අරමුණක් පෙරදැරි කරගෙන. අප පක්ෂයේ ගරු ලේකම් අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාට ගරහා කිරීමේ, නින්දා අපහාස කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන කියලයි මම හිතන්නේ. නමුත් අපි කිසිසේත් පුද්ගලානුබද්ධව මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ගැන සාකච්ඡා කළ යුතු නැහැ. මොකද, පසුගිය ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය වාගේම ජනතා විමුක්ති පෙරමුණ, ජාතික හෙළ උරුමය, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඇතුළු මේ රටේ සිවිල් සංවිධාන, බහුජන සංවිධාන සියලු දෙනාම එකතු වෙලා තමයි මේ ජයග්‍රහණයට උර දුන්නේ. ඉතින් ඒ නිසා අපි කියන්න ඕනෑ, මේ ජයග්‍රහණය අපි සියලුදෙනාගේ ජයග්‍රහණයක්. හැබැයි, ඒ ජයග්‍රහණයෙන් පසුව අපි කොහොමද ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, පොරොන්දු ප්‍රකාශනයේ සඳහන් වුණු ජනතාවට දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්නේ. ඒ සඳහා අපි කෙසේද කටයුතු කළ යුත්තේ. ඒකයි අප ඉදිරියේ තිබෙන වගකීම. ඒ නිසා පංගු බේරුවට කථා කරන්න අවශ්‍යතාවයක් නැහැ. අපි පැහැදිලිව දන්නවා. එක්සත් ජාතික පක්ෂයේත් පසුගිය ජනාධිපතිවරණයේදී ඒ ජනතා ජයග්‍රහණය වෙනුවෙන් විශාල දායකත්වයක් ලබා දුන්නා. ඒ පිළිබඳව කිසි විවාදයක් නැහැ. ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතික පාක්ෂිකයන්ට, එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරුන්ට, මන්ත්‍රීවරුන්ට ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඒ ගෞරවය නිර්ලෝභීව හිමි වෙනවා. ඒ පිළිබඳව කිසි වාදයක් නැහැ.

නමුත් අද අපි කථා කරන්නේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගේන ව්‍යවස්ථා සංශෝධනයක් සම්බන්ධවයි. ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ කාරණයේදී අපි ඉතාම සැලකිලිමත් විය යුතු කාරණයක් තිබෙනවා. කඩිමුඩියේ ව්‍යවස්ථා සංශෝධන සිදු කිරීමෙන් සිදු වන අනර්ථය අපි දැකලා තිබෙනවා. දැන් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, 1987 ගෙන එනු ලැබූ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මහා අනර්ථයක් ඇති කළා. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැමැති ගසේ හැදිලා තිබෙන පිළිලයක්. ඒ වාගේම තමයි 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2001 වර්ෂයේදී ගෙනාවා. ඒ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 224 දෙනෙක් ඊට පක්ෂව ඡන්දය පාවිච්චි කළා. නමුත් ඡන්දය දීමෙන් වැළකී සිටියේ සිහල උරුමයේ මන්ත්‍රීවරයා විධියට කටයුතු කරපු පාඨලී චම්පික රණවක මැතිතුමා විතරයි. 224 දෙනෙක් ඊට අත ඉස්සූ පමණින් එය නිවැරැදි වෙන්නේ නැහැ. මොකද අපි කියන්න ඕනෑ, බහුතරයක් එකඟ වුණු පමණින් එය නිවැරැදි වෙන්නේ නැහැ. යමක් උස් හඬින් ප්‍රකාශ කළ පමණින්, ජනප්‍රිය සටන් පාඨයක් වුණු පමණින් එය නිවැරැදි වෙන්නේ නැහැ. ඒක නිසා රටට අවශ්‍ය කරන නිවැරැදි ව්‍යවස්ථා සංශෝධන ගෙනෙන්න අපි කටයුතු කරන්න ඕනෑ. 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙත් ඒ වාගේම දෝෂ තිබෙනවා. ඒ පිළිබඳවත් ගැටලු මතු වුණා. ඒ නිසා අපි කියන්න ඕනෑ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය,

17 වැනි ව්‍යවස්ථා සංශෝධනය, ඒ වාගේම 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය මේවායේ විශාල දෝෂ ප්‍රමාණයක් තිබෙනවා. ගැටලු තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුකරණයේදී, පරිපාලනයේදී, රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නවලදී ඇති කරන ගැටලු පිළිබඳව අපි විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුයි. කරන්නා වූ ඕනෑම ව්‍යවස්ථා සංශෝධනයක් අවසාන වශයෙන් රටේ ස්ථාවරභාවයට හේතු වෙනවාද? නැද්ද? රටේ ජාතික ආරක්ෂාවට හේතු වෙනවාද? නැද්ද? රටේ පරිපාලනය ස්ථාවර කෙරෙනවාද? නැද්ද? කියන එක පිළිබඳව අපි සැලකිලිමත විය යුතුයි. දැන් මේ ඉදිරිපත් කරලා තිබෙන 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ මොකක්ද තිබෙන ගැටලුව?

මේ ගැටලුවලට ප්‍රවේශ වෙන්න කලින් මම කියන්න කැමැතියි. මේ ව්‍යවස්ථා සංශෝධනය තුළ විවෘත භාවයක් තිබුණේ නැහැ. පසුගිය මාර්තු මස 13 වැනිදා පක්ෂ නායකයින්ගේ රැස්වීම කැඳෙව්වා. කැබිනට් මණ්ඩලය කැඳෙව්වා. ගරු අග්‍රාමාත්‍යතුමා කඩිමුඩියේ එදිනම සවස මෙය ගැසට් කිරීම සඳහා මුද්‍රණයට යවන්න කටයුතු සූදානම් කරලා තිබුණේ. ඒ අවස්ථාවේදී අපි ප්‍රකාශ කර සිටියා, 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත කඩිමුඩියේ ගැසට් කරන්න එපා. මේක අධ්‍යයනය කරන්න අපට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න කියලා. ඒ අනුව එදා අපගේ විරෝධය නිසා තමයි දින 02 ක කාලයක් අපට ලබා දුන්නේ. ඒ අනුව මාර්තු 15 වැනිදා පක්ෂ නායකයින්ගේ රැස්වීම උදේ වරුවේ පැවැත් වුණා. සවස් වරුවේ කැබිනට් මණ්ඩලය පැවැත් වුණා. එහිදී දීර්ඝ සාකච්ඡා ඇති වුණා. මත ගැටුම් ඇති වුණා. වාද විවාද ඇති වුණා. අවසානයේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් සියලුදෙනා අතර පුළුල් එකඟතාවයක් ඇති වුණා. නමුත් කනගාටුවට කාරණය පක්ෂ නායකයින් අතර ඇති කරගත්ත එකඟතාවය, කැබිනට් මණ්ඩලය ඇති කරගත්ත එකඟතාවය, ඊට පසු දින එළි දැක් වුණු ගැසට් නිවේදනය තුළ පිළිඹිබු වුණේ නැහැ. මේක තමයි ඇත්ත වශයෙන්ම ගැටලු සහගත තත්ත්වයක් ඇති කරන්න ප්‍රධාන වශයෙන්ම හේතු වුණේ. ඇයි අපි අතර ඇති කරගත්ත ඒ එකඟතාවය ගැසට් නිවේදනය තුළින් පිළිඹිබු වෙන්නේ නැත්තේ? එහි වගන්ති, එහි ඉස්පිලි පාපිලි වෙනස් වුණේ කොහොමද? බලතල වෙනස් වුණේ කොහොමද? වගන්ති වෙනස් වුණේ කොහොමද? කියන එක බරපතළ ගැටලුවක්. මෙන්න මෙතැන තමයි අපි කිව්වේ ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් සිදු වෙනවා කියලා. මොකද, අද මේ ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කරන, විශේෂයෙන්ම විශාරදයන් විධියට කටයුතු කරන, නීතිඥ විශාරදයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විශාරදයන් විධියට කටයුතු කරන අද ඒ අයගේ වෙනත් අභිලාසයන් තිබෙන බව අපට පෙනෙනවා. ඒ අය ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර බලාගෙන සමහරු අද කෙටුම්පත් සකස් කරනවා. ඒක අපට පැහැදිලිව පෙනී ගිහිල්ලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ ගරු අග්‍රමාත්‍යතුමාට තිබෙන ලැදියාවන් මත ඔවුන් කටයුතු කරන බව පෙනී ගිහිල්ලා තිබෙනවා. ඒ නිසයි අපි කිව්වේ ව්‍යවස්ථා කුමන්ත්‍රණවලට ඉඩ දෙන්න බැහැ. හොර පාරෙන් විධායකය සතුව තිබෙන බලතල අගමැතිවරයා අතට ගන්න පුළුවන්කමක් නැහැ. පැහැදිලිව ජනාධිපතිවරයාට ජනවරමක් ලැබිලා තිබෙනවා. ඒ ජනවරම අන්සතු කරන්න බැහැ. ඒ වාගේම ඒක හොර පාරෙන් තමන් අතට ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ, මේකේ සමහරු තමන්ට වාසිදායක කොටස් උපුටා දක්වනවා. මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

*“පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනමත විචාරණයකින් පමණක් වෙනස් කළ හැකි ව්‍යවස්ථා වගන්තිවලට මෙම යෝජිත ව්‍යවස්ථා සංශෝධනයේදී අත නොතබන බවට මම සහතික වෙමි.”*

මේක තමයි පැහැදිලිව සඳහන් කරලා තිබෙන්නේ. ව්‍යවස්ථා සංශෝධනයකදී ජනමතයකට තුඩු දෙන සංශෝධන කරන්නේ නැහැයි කියලා ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරලා තිබෙනවා. එහෙමනම්, අන්න ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලවයි ව්‍යවස්ථා සංශෝධන සිදු කළ යුත්තේ. එහෙම නැතිව මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය උල්ලංඝණය කරනවා නම්, එතැන මේ ජනවරමට විශාල අගෞරවයක් කරනවා. ඒ ජනවරමට අනර්ථයක් සිදු කරනවා. ඒ නිසයි අපි කියන්නේ. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වන

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

ආකාරයට ව්‍යවස්ථා සංශෝධන කරන්න, ව්‍යවස්ථා කුමන්ත්‍රණ කරන්න හදන්න එපා. විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අත්තනෝමතික බලතල ඉවත් කරන්න ඕනෑ. ජනාධිපති ධූරය ප්‍රජාතන්ත්‍රකරණය කරන්න ඕනෑ. නමුත් අපට අවශ්‍ය නැහැ, විධායක අත්තනෝමතික බලතල සහිත අගමැතිවරයෙක් හදන්න. අපි කවුරුවක්වත් ඉල්ලලා නැහැ. ඒක නිසා ජනතාවගේ ජනවරමින් බලයට එන්න බැරි ඇතැම් පිරිස් උත්සාහ කරනවා, මේ ජනවරම පිටිපොකට් ගහගන්න. මේ ජනවරම කොල්ල කා ගන්න. ව්‍යවස්ථා කුමන්ත්‍රණ තුළින් ජනවරම සොරා ගන්න උත්සාහ කරනවා. ඒ නිසයි අපි කියන්නේ, මාළිගා කුමන්ත්‍රණවලට ඉඩ නැහැ. විවෘතව අපි මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. සංවාද කරන්න ඕනෑ. ආප්ප පුච්චනවා වාගේ ව්‍යවස්ථා සංශෝධන ගෙනැල්ලා, ඒවා පාර්ලිමේන්තුවට දාලා සම්මත කරලා මේ සිග්නල් කණු වාගේ, ලයිට් කණු වාගේ අත උස්සන්න කියලා කවුරු හරි කියනවා නම් ඒවාට එකඟ වෙන්නේ නැහැ. ඒ වාගේම මේ පාර්ලිමේන්තු සංයුතියත් තේරුම් ගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තු සංයුතියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මන්ත්‍රී ධූර 127 ක් තිබෙනවා. ඔවුන්ගේ එකඟතාවය නැතිව, ඔවුන් සමඟ සාකච්ඡාවකින් තොරව මේ කිසිදු ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න බැහැ. මේ යථාර්ථය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා තේරුම් ගන්න ඕනෑ. ඒ නිසයි අපි ප්‍රකාශ කර සිටියේ පුළුල් එකඟතාවයකින් තොරව, සම්මුතියකින් තොරව මේ ව්‍යවස්ථා සංශෝධන සිදු කරන්න බැහැයි කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මේ රටේ ජනතාවගේ ප්‍රාර්ථනාවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ රටේ ජනතාවගේ අභිලාෂයක්. ප්‍රාර්ථනාවක්. අන්න ඒ ප්‍රාර්ථනාව ඉෂ්ට කරන්න අපි සියලුදෙනාම කැප වෙන්න ඕනෑ. එහිදී විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. කුමන්ත්‍රණකාරී ආකාරයට කටයුතු කරන්න ගියොත් ඒ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය අසාර්ථක වෙනවා. ඒ නිසයි අපි කියන්නේ. මේ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සාර්ථකව පාර්ලිමේන්තුව තුළ ජයග්‍රහණය කරවන්න එක්සත් ජාතික පක්ෂයට ප්‍රධාන වගකීමක් තිබෙනවා. එහිදී අද අපට පෙනී ගිහිල්ලා තිබෙනවා, සම්මුතිවාදී දේශපාලනයකට සහයෝගීතාවාදී දේශපාලනයකට, සහජීවනවාදී දේශපාලනයකට අනුකූල ආකාරයකට නොවෙයි එක්සත් ජාතික පක්ෂය අද ක්‍රියා කරමින් තිබෙන්නේ කියලා. ඒ නිසයි අද මේ බරපතළ ගැටලුව මතු වෙලා තිබෙන්නේ. මේ යහපාලන ආණ්ඩුවට බරපතළ අනර්ථයක් සිදු කරපු සිදුවීමක්. ඇත්ත වශයෙන්ම ගත්තොත් අපට පසුගිය දිනවල පෙනී ගියා, මහ බැංකුවේ සිදු වුණු මහා මූල්‍ය අපරාධය. මේ මූල්‍ය අපරාධය සම්බන්ධයෙන් ඒක විධායක ජනාධිපතිවරයා කරපු දෙයක් නොවෙයි. විධායක බලය නැතිව මේ තාවකාලිකව දින 100 කට පත් කරපු අගමැතිවරයා යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

සිදු වුණු මහා මූල්‍ය අපරාධයක්. එහෙමනම් මේ මූල්‍ය අපරාධයට සම්බන්ධ අපරාධ සහායකයින් කවුද? ඒ සිද්ධියට සම්බන්ධ පුද්ගලයින් කවුද? ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙලා තිබෙනවාද? මේක තමයි තිබෙන ප්‍රශ්නය. ඉතින් ඒ නිසයි අපි කියන්නේ, අද අපට අවශ්‍ය මේ ව්‍යවස්ථා සංශෝධනය සාර්ථක කරගන්න. ඒ නිසා ජාතික හෙළ උරුමය විධියට අපි නිසි ව්‍යවස්ථා සංශෝධනයක් අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒක ජයග්‍රහණය කරවීම සඳහා කටයුතු කරනවා. මේක අසමත් කරන්න එක්සත් ජාතික පක්ෂය කටයුතු කරනවා නම්, ඒකේ සම්පූර්ණ වගකීම එක්සත් ජාතික පක්ෂය භාර ගන්න ඕනෑ. ඒ නිසා මෙහි සාර්ථකත්වය සඳහා අපි සියලු දෙනාම ඇප කැප වෙලා කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සියලු දෙනාගෙන් අපි ඉල්ලා සිටින්නේ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ අපි සියලුදෙනාගේ එකඟතාවයෙන් සම්මත කරගන්න පුළුවන් ව්‍යවස්ථා සංශෝධනයක් අපි පාර්ලිමේන්තුවට ගෙන එමු. එහෙම

නැතිව තම තමන්ගේ පටු දේශපාලන අරමුණු, එහෙම නැත්නම් තමන්ගේ බලය වැඩි කරගන්න දරන සියලු ආකාරයේ උත්සාහයන් සහ කුමන්ත්‍රණයන් පරාජය කරලා ඉදිරියේදී මේ රට ස්ථාවර කරන, රට අරාජික වෙන්න ඉඩ නොතබන ඒ වාගේම නිසි ව්‍යවස්ථා සංශෝධනයක්, විධායක ජනාධිපති ධුරයේ අත්තනෝමතික බලතල ඉවත් කරලා ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය කරලා මේ රටට අවශ්‍ය කරන ඒ ජනාධිපති ක්‍රමයක් ස්ථාපිත කරන්න අපි ඉදිරි දින කිහිපය ඇතුළතදී කටයුතු කරනවා කියන එක මේ සභාවට ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.02.32]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව සලසා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. මම හිතන්නේ රටක ව්‍යවස්ථාවක් හදද්දී ඉතාමත්ම වැදගත් කාරණාව තමයි රටේ ජනතාවගේ සහ රටේ අවශ්‍යතාවයන් සැලකිල්ලට අරගෙන ඒ ව්‍යවස්ථාව සකස් කිරීම. 1978 ව්‍යවස්ථාව ගැන සලකා බලනවා නම් හොඳ ප්‍රතිපාදන ගණනාවක් ඒකේ තිබුණත් ජනතා විරෝධී, සමාජ විරෝධී විධිවිධාන ගණනාවක් ඒකේ අන්තර්ගත වෙලා තිබුණු බව, යම් යම් පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා යම් යම් විධිවිධාන ඒකට ඇතුළත් කරලා තිබුණු බව අපි කැමැති වුණත්, අකැමැති වුණත් ප්‍රසිද්ධියේ හෝ පිළිගන්නට සිද්ධ වෙනවා. ඒ තිබුණු ව්‍යවස්ථාව තුළ මේ රටේ රජ කාලේ රජ කෙනෙකුට නොතිබුණු විධියේ බලතල ජනාධිපතිතුමාට ලබා දුන්නා. නිදර්ශනයකින් කියනවා නම්, මේ රටේ නීතියට වග කියන්නට ඕනෑ නැති පුද්ගලයෙක් අපි හැදුවා. රටක ඕනෑම පුද්ගලයෙක් නීතියට යටත්. නමුත් නීතියට යටත් නොවන පාර්ලිමේන්තුවට වගකීමක් දරන්නට අවශ්‍ය නොවන පුද්ගලයෙක්ව අපි නිර්මාණය කළා. තමන්ට කැමැති ආකාරයකට ජනතාව පත් කරපු පාර්ලිමේන්තුවක් එක ව්‍යතිරේඛයකට විතරක් යටත්ව දවසක් ඇතුළත, පැය 24 ක් ඇතුළත විසුරුවා හැරීමේ බලතල ජනාධිපතිවරයාට ලබා දුන්නා. එකම ව්‍යතිරේඛය වුණේ අවුරුදු 06 ක කාලයක් ගත කරන්න ඉස්සෙල්ලා යම් පාර්ලිමේන්තුවක් විසුරුවා හැරියා නම් ඊට පස්සේ පත් වන පාර්ලිමේන්තුවට පමණක් අවුරුද්දක කාලයක් ඒ කටයුත්ත කරගෙන යන්න ඒ ව්‍යවස්ථාවෙන් අවසර ලබා දුන්නා. අධිකරණයේ සියලු පත් වීම් අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් තනි පුද්ගලයෙකුට, දේශපාලන නායකත්වය දෙන දේශපාලනයට ඇතුළත් වෙලා ඉන්න තනි පුද්ගලයෙකුට තමන්ගේ කැමැත්ත අනුව පත් කිරීමේ අවස්ථාව සලසා දුන්නා. මේ රටේ තිබෙන සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් තනි පුද්ගලයෙකුට, තනි කැමැත්ත අනුව පත් කරන්නට අවස්ථාව සලසා දුන්නා. මෙන්න මේ වාගේ සමාජ විරෝධී, ජනතා විරෝධී විධිවිධාන මේ ව්‍යවස්ථාවට ඇතුළත් වෙලා තිබුණා.

ඒ කෙසේ වෙතත් ඒක එක්තරා ප්‍රමාණයකට පාලනය කරන්නට පාර්ලිමේන්තුව 17 වැනි සංශෝධනය සම්මත කළා. අඩුපාඩුකම් තිබුණත් මම හිතන්නේ, මේ අසීමිත බලය තිබුණු ජනාධිපතිවරයාගේ බලතල සීමා කිරීම සඳහා 17 වැනි සංශෝධනය මගින් යම්කිසි සීමාවන් ඔහුගේ බලය පාවිච්චි කිරීමට යොදවන්නට පුළුවන් ආකාරයට ක්‍රියාත්මක කරලා ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වා. මම හිතන්නේ, මගේ ජීවිත කාලයේදී මේ රටේ සම්මත කරපු වඩාත්ම ප්‍රගතිශීලී නීතිය හැටියට මම සලකන්නේ 17 වැනි සංශෝධනය. ඒ කෙසේ වෙතත් 17 වැනි සංශෝධනය මීට කලින් හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී සම්පූර්ණයෙන් අහෝසි කරලා 18 වැනි සංශෝධනය නැවතත් ක්‍රියාත්මක කළා. 18 වැනි සංශෝධනය මගින් මේ රටේ ජනතාව යම්කිසි හෝ ජයග්‍රහණයක් ලබාගෙන තිබුණා නම් 17 වැනි සංශෝධනය තුළින් මේ රටේ ජනතාවට යම්කිසි හෝ වාසිදායක තත්ත්වයක් උදා කරලා තිබුණා නම් ඒක සම්පූර්ණයෙන් ආපස්සට හරවලා මේ රටේ ජනතාවගේ බලය, අයිතීන්, නිදහස සම්පූර්ණයෙන් යටපත් කරන්නට පුළුවන් තැනකට නැවතත් ජනාධිපතිවරයා පත් කිරීමට හැකි වන ආකාරයට 18 වැනි සංශෝධනය ක්‍රියාත්මක කළා. ඒකත් එක්ක අපි දැකපු දේ තමයි මේ රටේ නීතිය ක්‍රියාත්මක නොවන තැනකට මේ රට තල්ලු වෙමින් ගියා. මම ඉතාමත්ම අවංකව මේ සභාව ඉදිරියේ කියා සිටිනවා, අවුරුදු තිස් ගණනක අත්දැකීම් තිබෙන ජනාධිපති නීතිඥවරයෙක් හැටියට පවසන්නේ, එක යුගයක් තිබුණා, අපි අධිකරණයට එනකොට දේශපාලනය ගැවුණු නඩුවලට අපි හොඳට දැනගෙන ගියේ, කවරදාකවත් මේ නඩු

[ ගරු ශ්‍රීනාත් ම. පෙරේරා ]

තීන්දුවෙන් සාධාරණත්වයක්, මේ නඩුවේ පාර්ශවකරුවන්ට නොලැබෙන්නේය කියන විශ්වාසය ඇතුවයි. එහෙම ගිහිල්ලා අධිකරණයේ පඹයෝ වාගේ කළු කෝට් දාගෙන කථා කරපු යුගයක් තිබුණා. අන්න ඒ නිසා තමයි මේ රටේ අධිකරණ පද්ධතිය, අපි ඉතාමත්ම කනගාටුදායක යුගයක කල් ගෙව්වා. අන්න ඒ යුගය නැති කරලා, කොපමණද කිව්වොත් ඇත්තටම, මට යම් අවස්ථාවකදී හිතට ආපු සිතුවිල්ලක් තමයි මේ කළු කෝට් එක දාගෙන අධිකරණවලට යනවාට වඩා පාරක් අයිනේ පෙට්ටි කඩයක් දාගෙන ප්ලේන් ටී විකුණනවා නම් මීට වඩා සම්පතයි කියලා හිතුණු වෙලාවල් තිබුණා. මෙන්න මේ වාගේ අධිකරණ ක්‍රමය, මේ රටේ ක්‍රියාත්මක වන නීතිය සියල්ල විනාශකාරී වන තත්ත්වයකට මේ 18 වැනි සංශෝධනයත් සමග රට ගෙන ගියාය කියන එක අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපට පිළිගන්නට සිද්ධ වන දෙයක්.

මම හිතන්නේ, මෙන්න මේ තත්ත්වය යටතේ ජනවාරි මාසේ 08 වැනිදා පැවැත් වුණු ජනාධිපතිවරණයෙන් පස්සේ මේ ක්‍රමය වෙනස් කරන්නට පුළුවන් වාතාවරණයක් ඇති වුණා. මේ රටේ බිහි වුණා. මේ වෙනස්කම කරන්න නම් කොටස් දෙකක සහයෝගය අත්‍යාවශ්‍යයි. එක රටේ ජනාධිපතිවරයාගේ කැමැත්තක් තිබෙන්න ඕනෑ මේ බලතල සීමා කිරීම සඳහා නීති සම්පාදනය කරන්නට. දෙවැනි එක තමයි ඒ වෙනස්කම කරන්නට අඩු තරමින් වර්තමාන පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 150 දෙනෙක් තමන්ගේ අත උස්සන්නට සූදානම් වීම. මේ ක්‍රියාවලියන් දෙකම එකට එකතු වුණේ නැත්නම් කවරදාකවත් මම හිතන්නේ නැහැ, මේ අපට වුණු පරාජය, මේ අපට වුණු හානිය, මේ අපට වුණු ව්‍යසනයෙන් ගැලවෙන්නට අපට පුළුවන්කමක් ලැබෙයි කියලා. මම විශ්වාස කරනවා අද ඉන්න වර්තමාන ජනාධිපතිතුමාට උවමනාවක් තිබෙනවා කියලා, මේ ක්‍රමය වෙනස් කරලා මේ රටට, ජනතාවට සාධාරණීකරණයක් කරන්නට, ව්‍යවස්ථා සංශෝධනයක් කරන්නට. ඒ සඳහා එතුමාගේ කැමැත්තක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. නමුත් මේ කාරණාව ඉෂ්ට කර ගැනීමට යෑමේදී විවිධ පුද්ගලයින් විවිධ ක්‍රමවලට දැනුවත්ව හෝ නොදැනුවත්ව යම් යම් බාධක එල්ල කරන බව ඉතා පැහැදිලියි.

මම ඉතාමත්ම කනගාටුවෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි කියන්නේ, මේ රටේ පිළිගත්තු ක්‍රමයක් තිබෙනවා හදිසි නීතියක් කියලා සහතික කරපු නැති ඕනෑම නීතියක් පාර්ලිමේන්තුවේ සම්මත කිරීමේදී ක්‍රමවේදයක් තිබෙනවා. ජනතාවට ඒ නීතිය මොකක්ද කියලා දැනගන්න ගැසට් පත්‍රයේ පළ කරනවා. එතකොට ගැසට් පත්‍රයේ ඒ නීතිය පළ කළාට පස්සේ ජනතාවට අවස්ථාවක් ලැබෙනවා මේකේ තිබෙන විධිවිධාන, ව්‍යවස්ථා විරෝධී විධිවිධාන තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා දවස් 07 ක කාලයක් ඇතුළත පෙත්සමක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. නමුත් මේ කාරණා අපට පුළුවන් ආකාරයට අපි පාර්ලිමේන්තුවේ නොසිටියාට බොහොම අමාරුවෙන් අපි ඒ ගැසට් පත්‍රයේ පළ කරපු විධිවිධාන පිළිබඳ පොත් පිංච ලබාගත්තා. ලබාගෙන අපි පෙත්සමක් ඉදිරිපත් කළේ නැති වුණාට අපි ගියා අධිකරණයට. මොනවාද මේකේ අද ඇති වන තත්ත්වය කියලා බලන්න.

ඉතාමත්ම කනගාටුයි කියන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු නීතිපතිතුමා අධිකරණයට ඇවිල්ලා කියනවා, සංශෝධන ගණනාවක් මේකට කරලා තිබෙනවා කියලා, ඒ පෙත්සම් ඉදිරිපත් කරපු අයට පමණක් ඒ සංශෝධන භාර දෙනවා. ජනාධිපති නීතිඥවරයෙක් හැටියට, මේ රටේ ජ්‍යෙෂ්ට නීතිඥවරයෙක් හැටියට අද වනකල් මම දන්නේ නැහැ මේ කරපු සංශෝධන මොනවාද කියලා. මේක පිටිපස්සේ ඉන්න පුද්ගලයා හෝ පුද්ගලයින් කවුද කියලා කියන්න මම දන්නේ නැහැ. කවුරු හෝ ඒක කළා නම්, ඒ කළ අය මේ රටේ සමාජයට කරලා තිබෙන්නේ මහා විපත්තිදායක ක්‍රියාවක්. ඒ ක්‍රමවේදය තුළින් මේ අපි බලපොරොත්තු වන අරමුණට යන්නට අපි තියපු පය පස්සට තල්ලු කරන්නට මේකෙන් ක්‍රියාත්මක කරන්න ඕනෑ අයට, ඒකට අපි වේදිකාවක හදලා දීලා තිබෙනවා. මේක හරිම කනගාටුදායක දෙයක්. මම කියන්නේ මෙපමණයි. අපට මේ ලෝකය වෙනස් කරන්නට අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය කාරණා දෙකයි. එකක්, මේ විධායක ජනාධිපති ධුරයේ සමාජ විරෝධී විධිවිධාන සියල්ල සීමා කරන්නට සංශෝධනයක් ගෙන ආ යුතුයි. දෙක, ගිය රජය මගින් කරපු මේ සමාජ විරෝධී ක්‍රියාව එනම් මේ රටේ ස්වාධීන කොමිෂන් සභා නැවත ස්ථාපනය කිරීම සඳහා ඒ වෙනස්කම, ඒ සංශෝධනය කළ යුතුයි. මෙන්න මේ කාරණා දෙක අපට ලබා ගන්න පුළුවන්

නම්, ඉදිරි සති දෙකක කාලය ඇතුළත ඒ ජයග්‍රහණයන් ලබා ගන්න පුළුවන් නම් මම හිතන්නේ ජනවාරි මාසේ 08 වැනිදා අපි ලබපු ජයග්‍රහණය, ඒකෙන් ඓතිහාසිකගත වන තැනකට එම ජයග්‍රහණය අපට යොමු කර ගන්නට පුළුවන්. නමුත් අපි ඉතාමත්ම කනගාටුයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකේදී විවිධ පුද්ගලයින්, එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්. හෙළ උරුමය වෙන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්. මට ඒකෙන් ප්‍රශ්නයක් නැහැ. මම අද මේ සභාවේ කථා කරන්නේ මේ රටට ආදරය කරන පුරවැසියෙක් හැටියට පමණයි. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයෙනුත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත්, හෙළ උරුමයෙනුත්, ජනතා විමුක්ති පෙරමුණෙනුත්, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙනුත් මම ආයාචනයක් කරනවා.

මේ රටට ආදරය කරන මනුස්සයෙක් හැටියට කරුණාකරලා මේ යන ගමනේදී මේ අරමුණ කරා යන්නට වර්තමාන ජනාධිපතිතුමා අපට ඉඩක් දීලා තිබෙන මේ අවස්ථාවේදී මේ අවස්ථාව විනාශ කරන්නට, මේ අවස්ථාව නැති බංගස්තාන කරන්නට කටයුතු කරන්න එපාය කියලා. එහෙම කළොත් මේ අවස්ථාවේදී මේ යන අරමුණ, මේකෙන් වඩා වාසිදායක තැනකට එන්නේ රජය කරවන අයට නොවෙයි. රජයට විරුද්ධව ඉන්න අයට. මේ රජයට විරුද්ධව ඉන්න අය ඉන්නවා නම් ඒ අයට ආරක්ෂණයක් ලැබෙන්නේ මේ වෙනස්කම ඇති කළොත් විතරයි. මේ ක්‍රියාවලිය අපි මොට කරලා දැම්මොත් ඒකෙන් ශක්තියක් ලැබෙන්නේ, හයියක් ලැබෙන්නේ රජය කරවන අයට පමණයි. රජය කරවන්නට බැරුව විපක්ෂයේ ඉන්න, යම් අය ඉන්නවා නම් මහජන නියෝජිතයින් වෙන්න පුළුවන්, වෙනත් පක්ෂවලට සහයෝගය දෙන අය වෙන්න පුළුවන් මේ ක්‍රියාවලිය මොට කරලා දැම්මොත් ඒකෙන් ඉතාමත්ම දුක්ඛිත, කනගාටුදායක තත්ත්වයකට දේශපාලනමය වශයෙන් තල්ලු වෙන්නේ ඒ පුද්ගලයෝ විතරයි. ඒ නිසා මා ආයාචනයක් කරනවා. මේ සභාව හරහා මේ රටේ ඉදිරි ගමනට යම්කිසි හෝ කැමැත්තක් දක්වන පුද්ගලයින් ඉන්නවා නම් මම ආයාචනය කරනවා මේ ගමනේදී බාධා කරන්නේ නැතුව අපේ ප්‍රධානම අරමුණු දෙක ඉෂ්ට කර ගැනීම සඳහා තමන් දැනුවත්ව වෙන්න පුළුවන්, නොදැනුවත්ව වෙන්න පුළුවන් ඕනෑකමින් වෙන්න පුළුවන්, ඕනෑකමක් නැතුව වෙන්න පුළුවන් මේ බාධක ඇති කරන්නේ නැතුව මේ ගමන ගිහිල්ලා අපේ අරමුණ ඉෂ්ට කර ගන්නට ශක්තිය දෙන්නය, අත දෙන්නය කියලා මේ රටේ ඉදිරි ගමන, මේ රටේ ජනතාව ගැන, මේ රටේ අනාගතය ගැන, යහපාලනයක් රටට, ජනතාවට විය යුතු ඇති කළ යුතු සමාජ ක්‍රමයක් ඇති කිරීමට උවමනාවක් තිබෙන පුරවැසියන් ඉන්නවා නම්, ජනතා නියෝජිතයින් ඉන්නවා නම් ඒ සියලු දෙනාගෙන් මම වැඳලා ඉල්ලන්නේ එක දෙයයි. කරුණාකරලා මම කියපු කාරණා දෙකට, එක මේ විධායක ජනාධිපතිතුමාට තිබෙන අනිසි බලතල සීමා කිරීම සඳහා වන සංශෝධනයත්, මේ රටේ ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම සඳහා ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනත් ක්‍රියාත්මක කර ගන්නට අත හිත දෙන්නය කියන ආයාචනය කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මට ලබා දුන් අවස්ථාවට නැවත වාරයක් මගේ ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.02.46]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම මගේ ස්තූතිය පුද කරනවා. මම හිතන්නේ මේ දින 100 එක කාරණාවක් ගැන විතරයි අද අපි කථා කරන්නේ. මම හිතන්නේ මේ දින 100 වැඩ සටහන ගැන වෙනම විවාදයක් අපි කළ යුතු වෙනවා. ඒ සම්බන්ධව කථා කරන්න පුළුවන්. ඒ වාගේම අපේ ජනාධිපති නීතිඥතුමා, එතුමා ඉතාම වැදගත් කරුණු කාරණා රාශියක් මේ සභාවට ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා එක්සත් ජාතික පක්ෂ නායකයෝ මේ විධායක ජනාධිපති ක්‍රමය මේ රටට හඳුන්වා දෙනකොට විධායක ජනාධිපති ක්‍රමයෙන් වෙන්න පුළුවන් දේ ගැන, මේ රටට වෙන්න පුළුවන් විපත ගැන නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා මැතිතුමා කියපු කරුණු කාරණා එදා හිටිය අපේ ප්‍රබුද්ධ දේශපාලඥයෝ, දේශපාලන විචාරකයෝ මේ මතය එදා කිව්වා. හැබැයි, එදා ඒක කියන කොට එක්සත් ජාතික පක්ෂයේ කවුරුත් ඇහුම්කන් දුන්නේ නැහැ. අපි එදා විරුද්ධ වුණත්, එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා 5/6 ක බලයක් තියාගෙන පාර්ලිමේන්තුවේම ජනාධිපති වෙලා, අපි අද හැමෝම කථා කරනවා විධායක ජනාධිපති ක්‍රමය ගැන. හැබැයි ගරු නි යෝජ්‍ය

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

සභාපතිතුමනි, මේ කථා, කථා කරන කොට හැමෝම 18 වැනි සංශෝධනය ගැන තමයි ගොඩක් කථා කරන්නේ. ඒක මේ හිටපු ජනාධිපතිතුමා කළා කියන මතය ගෙනැල්ලා මේක මේ ජනාධිපති ක්‍රමය අපේ ආණ්ඩුව විසින් කරන ලද්දක් බවට හඟවන්න තමයි හදන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා මේ විධායක ජනාධිපති ක්‍රමය එදා ආරම්භ කරපු දවසේ ඉඳලා මේ වනකල් මේ විධායක ජනාධිපති ක්‍රමය මේ රටට ගැළපෙන්නේ නැහැ කියන කාරණාව කිව්වා. නමුත් පවතින ආණ්ඩු එනකොට, අපේ ආණ්ඩුවේ ජනාධිපතිවරු එනකොට අපි කට වහගෙන ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ රජයක් තියෙන කොට ඒකෙන් ජනාධිපති වනකොට ඒ පක්ෂයේ අය කට වහගෙන ඉන්නවා. ඒ නිසා අද වනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා අපේ මන්ත්‍රීතුමා කිව්වා, බනිස් කෑමේ තරගයකට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව ඇදලා දාන්න හදනවා කියලා. මොකද, 29 පාරක් බනිස් කෑමේ තරගයෙන් පැරදුණු රනිල් වික්‍රමසිංහ මහත්මයාට තරගයක් දෙන්න. මොකද, පසුගිය මැතිවරණ දෙකේම රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපතිවරණයට ආවේ නැහැ. එතුමා බනිස් කෑමේ හිටියා. ඉතින් මහින්ද මහත්මයා හිතනවා ඇති බනිස් කෑමේ එකට හරි ඇවිල්ලා මෙයාට තරගයක් දීලා පෙන්වන්න ඕනෑ කියලා.

කොහොම වුණත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව පසුගිය මැතිවරණය වෙද්දී රටේ ලොකු මතයක් ඇති කළා විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියලා. ඒ නිසාම රටේ ජනතාව පක්ෂ භේදයකින් තොරව ඡන්දය දීලා මේක බලාපොරොත්තු වෙනවා. මේ දින 100 එක් වැඩ සටහනක්. මේක කරන්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි අද කථා වෙන්නේ. මගේ පෞද්ගලික මතය, මේක අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතයට වෙනස්. ඒ ව්‍යවස්ථා සංශෝධන කමිටුවේ ඉන්න කෙනෙක් හැටියට මම දැක්කා, මේ කෙටුම්පත පිළිබඳව නොයෙක් අඩුපාඩු තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ මේකේ අඩුපාඩු තිබෙනවා. මේක නොකරන්න ඕනෑ කෙනෙකුට මේක පස්සට ඇදගෙන කථා කරන්න පුළුවන් මාතෘකාවක් බවට පත් කරන්න පුළුවන් තත්ත්වයකට පත් කරලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳ හොඳ අධ්‍යයනයක් කරලා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ගමන් මේ රටට ගැළපෙන මැතිවරණ ක්‍රමයක් එක්ක තියෙන්න ඕනෑ කියන මතයේ මම ඉන්නවා.

හැබැයි, මම දකිනවා පිටිපස්සේ දොරෙන් අගමැතිකමට ආපු රනිල් වික්‍රමසිංහ මහත්මයාට තවත් විධායක ජනාධිපති ක්‍රමයක් අහෝසි කරලා, විධායක අගමැති කෙනෙක් පත් කරන්න හදනවා නම් ඒකත් වැරැදියි. විධායක අගමැතිවරයෙක් පත් කරන්න, එතැනට සම්පූර්ණයෙන් බලතල දෙනවා නම් ඒකත් වෙනස් වෙන්න ඕනෑ. ඒ නිසා මේක පාර්ලිමේන්තුවට වග කියන - කෙටුම්පතේ අඩුපාඩු තිබුණා. ඒක සාකච්ඡා වුණා. ඒකයි මම ඒ කාරණාව කිව්වේ. පාර්ලිමේන්තුවට බලතල තිබෙන තැනකට මේක යන්න ඕනෑ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක කරන්න හදන කොට මෛත්‍රීපාල මහත්මයා ජනාධිපතිවරයා හැටියට පත් කරන්න සහයෝගය දීපු පක්ෂ අතරම නොයෙකුත් මතවාද තිබෙනවා. අද හැමෝම ඒවා ගැන කථා කරනවා. සමහර වෙලාවට අපට හිතෙනවා මේක නොකරන්න මේ කරපු බොරුවක්ද කියලා. හැමෝම කථා වෙනවා. එක එක දේවල් කියනවා. අද ඒ අය අතර එකඟතාවයකට ඉස්සෙල්ලාම පත් වෙන්න ඕනෑ. දැන් අපි දැක්කා පසුගිය කාලේ අපේ සරත් ෆොන්සේකා මැතිතුමා, ෆීල්ඩ් මාෂල්තුමා එක අවස්ථාවකදී කිව්වා, එතුමා හිතාගෙන හිටියා කියලා රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති වනකොට ආර්ථික කප්පිත්තෙක් වෙලා මේ රටේ ආර්ථිකය හදයි. හැබැයි, අද වනකොට කිසිම දෙයක් කළේ නැහැයි කියලා එතුමා රූපවාහිනියේ News වල කියපු එකක් අපි දැක්කා. ඒ වාගේම අද දවස වනකොට හෙළ උරුමයෝ නායකයෝ, අපේ මන්ත්‍රීතුමියලා කථා කරනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා දේශපාලන කපටිකමක් කරන්න හදනවා කියලා. උතුරේ මහ ඇමැතිතුමා අද රනිල් වික්‍රමසිංහ මහත්මයා එන රැස්වීම්වලට සහභාගී වෙන්නේ නැහැ. මේ සහයෝගය දීපු පක්ෂ අතර තිබෙන ගැටළු. ඒ නිසා මේ රටේ අගමැති ධූරයට පත් වෙන්න බලාගෙන ඉන්න රනිල් වික්‍රමසිංහ මහත්මයා ගැන රටේ දේශපාලන පක්ෂ නායකයෝ අතරත් අද විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒ නිසා අද මේක අලුත් කථිකාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසාම මේ ආණ්ඩුව කරගෙන යන්න බැරි තත්ත්වයට, බලයට පත් වෙලා දින 100 වැඩ සටහනට අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් හැටියට ප්‍රතිපත්තිමය වශයෙන් සහයෝගය ලබා දෙනවා කියලා කටයුතු කරනකොට - මෙතැන මන්ත්‍රීවරු කථා කළා ශ්‍රී ලංකා

නිදහස් පක්ෂයේ අය ඇමැතිකම් ගත්තා කියලා. අපි දැක්කා, ආණ්ඩුවට කරගෙන යන්න බැරි තත්ත්වයක් වුණා. හොරකම් කරන්නේ නැහැයි කියලා හොරකම් ගැන කථා කරන්න බලයට ආපු ආණ්ඩුව දින 100 යේදී හොරකම් කරන්න පටන් ගත්තා. අද දින 100 වැඩ සටහනෙන් දෙනවා කියපු දේවල් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන තත්ත්වයට අද ඒ පක්ෂයේම උදව් කරපු අය කථා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුව කරගෙන යන්න බැරි තත්ත්වයට පත් වුණා නම් අපි කනගාටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමක් එකතු කරගෙන ඒ අයට ඇමැතිකම් දීලා මේක ශක්තිමක් කරන්න හදනවා. අපට ආණ්ඩුවක ඇමැතිකම් ගන්න ඕනෑ නැහැ මේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා. විරුද්ධ පක්ෂයේ ඉඳලා හොඳ නම් හොඳ දේට සහයෝගය ලබා දීලා සම්මත කරගන්න පුළුවන්. ඒ නිසා මේ මැතිවරණයෙන් පස්සේ දේශපාලන වශයෙන් අපේ පාක්ෂිකයින්ගෙන් පළිගන්න කොට අපේම කණ්ඩායම් ගිහිල්ලා ජැක් එක ගහලා ආණ්ඩුවේ ඇමැතිකම් අරගෙන මේක රකින්න හදනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා. ආණ්ඩුවේ අය අරගෙන කටයුතු කරන්න හදන්නේ එදා සහයෝගය දීපු පක්ෂ අද තමන් හදපු ආණ්ඩුව විවේචනය කරන කොට අපේ පක්ෂයේ අය ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු ගිහිල්ලා ඒක රකින්න හදනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය පිළිබඳව මීට වඩා පුළුල්ව කථා කළ යුතු වෙනවා. කෙටුම්පත පිළිබඳව විශාල අඩුපාඩු තිබෙනවා. මම ඒ කෙටුම්පත අපි පක්ෂයක් හැටියට ගෙන්නුවා. මේ රටේ ජ්‍යෙෂ්ට නීතිඥවරු ගෙනැල්ලා පක්ෂයේ නායකයින් එක්ක කථා කරන සාකච්ඡාවේ මම හිටියා. ඒකේ අඩුපාඩු විශාල ප්‍රමාණයක් තිබුණා. ඒ නිසා මේ අඩුපාඩු හදලා රටේ අනාගතයට බලපාන කාරණාවක් නිසා මේක හරියටම කරන්න ඕනෑ. මේක වරද්ද ගත්තොත් ආයිත් වෙනස් කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේක ගැන හොඳ අධ්‍යයනයක් කරලා කටයුතු කළ යුතු වෙනවා. අද මේ යෝජනාව පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. දින 100 වැඩ පිළිවෙළට අපි පක්ෂයක් හැටියට සහයෝගය දෙනවා. අපි කවුරුත් මේකට විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න යන වැඩ පිළිවෙළ තුළත්, රජය ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳවත් අපේ අප්‍රසාදය තිබෙනවා කියන එක අපි ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැඩ පිළිවෙළ තුළ අපි දැක්කා, මම උදාහරණයක් කියන්නම්, අපේ නීතිඥ මහත්මයා දැනුවත් කිරීම සඳහා. ඒ කෙටුම්පතේ තිබුණා අග්‍රවිනිශ්චයකාරවරයා පත් කිරීම. Bar Association එකෙන් විමසීමක් කළ යුතුයි කියලා. මම හිතන්නේ නැහැ ඒක කළ යුතුයි කියලා. ඒ වාගේ දේවල් සංශෝධනය විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මේක ගැන දීර්ඝව සාකච්ඡා කරලා, පුද්ගලයෝ බලන්නේ නැතුව රටේ අනාගතය වෙනුවෙන් සුදුසු පරිදි මේකට තීන්දු තීරණ අරගෙන මේ ලැබූ අවස්ථාවේදී උපරිම ප්‍රයෝජන ගත යුතුයි කියන මතය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ඉදිරිපත් කළ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 02 ක කාලයක් ලබා දෙනවා.

[අ.භා.02.51]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විනාඩි 02 කට වැඩිය දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රථමයෙන්ම මගේ ස්තූතිය පුද කර සිටිනවා, මෙම යෝජනාවට සහභාගීවීම පිළිබඳව. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවයක් ගැන තමයි අපි කථා කළේ. ජනතාව පීඩනයට පත් වෙලා අවුරුදු - මම හිතන්නේ මහින්ද රාජපක්ෂ රජය කාලයේ පමණක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය මේ ව්‍යවස්ථාව ගෙනාපු දවසේ ඉඳලා පීඩනයට පත් වෙලා, හිර වෙලා හිටපු ජනතාවට අවස්ථාවක් ලැබුණා එක්සත් ජාතික පක්ෂයත්, හෙළ උරුමයත්, ජනතා විමුක්ති පෙරමුණත්, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත් මේ සියලුම පක්ෂ එකඟතාවයකට ඇවිල්ලා මේ ක්‍රමය වෙනස් කරන්න ජනතාව ඉදිරියට ගියාම ජනතාව ඒක අනුමත කළා. ඒක තමයි මේකේ තිබෙන වැදගත්ම කාරණය. මේක නැත්නම් වෙන ප්‍රශ්නයක් නොවෙයි. සමහර අය මේක වැරැදියට තේරුම් අරගෙන. සමහර අයගේ පොඩි භීතියක් තිබෙනවා,

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

මේ ජනාධිපති ඒකාධිපති බලතල අහෝසි කළාම ඒක අගමැතිකමට යනවා කියලා. ඒ කියන්නේ දැන් ඉන්න වර්තමාන අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒකාධිපති බලතල ඇති අගමැති කෙනෙක් වෙනවා කියන සැකය තමයි මේ අය ළඟ තිබෙන්නේ. හැබැයි අපි ඉතාමත් කරුණාවෙන් මතක් කරලා දෙන්න ඕනෑ. මේ දින 100 වැඩ පිළිවෙළේම තිබෙනවා අප්‍රේල් 23 වැනිදා වනකොට මේ තිබෙන ආණ්ඩුව විසුරුවලා අලුත් ජනවරමකට ගිහිල්ලා අලුත් පාර්ලිමේන්තුවක් පත් කර ගන්නවා කියන එක. ඒක නිසා මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේකට කිසිම බයක් වෙන්න දෙයක් නැහැ. මේක රනිල් වික්‍රමසිංහ මැතිතුමාට පස්සේ දොරෙන් - (බාධා කිරීමක්) සමහර අය හිතනවා මේක කුමන්ත්‍රණයක් කරලා එක්සත් ජාතික පක්ෂයේ බලයේ ඉන්න නිසා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැතිකම ගන්න කරන කුමන්ත්‍රණයක් කියලා. මම හිතන්නේ, මේක රටේ ජනතාවගේ බලාපොරොත්තුව. මේක රටේ ජනතාවගේ අවශ්‍යතාවය. මේ රටේ දේශපාලන සංස්කෘතිය නැවත වරක් වෙනස් කළ යුතු අනගි අවස්ථාවක්. (බාධා කිරීම්) පොඩ්ඩක් අහගන්නවා නම් හොඳයි. මේ වාගේ එකඟතාවයකට මුළු පාර්ලිමේන්තුවක්ම එන අවස්ථාවක් අපට නැවත උදා වන එකක් නැහැ. ඒක නිසා සියලු දෙනාගෙන්ම අපි බලාපොරොත්තු වෙන්නේ, මේ 19 වැනි සංශෝධනය සම්මත කරන්න. මේකේ අඩුපාඩු ඇති. ගරු ප්‍රධාන ඇමැතිතුමා පෙන්නපු විධියට පොඩි පොඩි අඩුපාඩු ඇති. නැත්තෙත් නැහැ. මේ රටේ ගෙනැල්ලා තිබෙන හැම ව්‍යවස්ථාවේම අඩුපාඩු තිබෙනවා. හැබැයි ඒවා සම්මත කරගත්තා.

නමුත් විශේෂයෙන්ම අපේ හෙළ උරුමයේ මන්ත්‍රීතුමා සඳහන් කළා 17 ගෙන එද්දී අත් ඉස්සුවේ නැහැ. 17 කියන්නේ මේ රටේ ස්වාධීන කොමිෂන් සභා පත් කරන එක. ජනාධිපතිගේ විධායක බලතල පාර්ලිමේන්තුවට ලබා දෙනවා කියන එක. එතකොට අත ඉස්සුවේ නැහැ. නමුත් 18 ගෙන එද්දී මේ ජනමත විචාරණයක් ඉල්ලුවේ නැහැ. ජනමතයකට යන්න ඕනෑ කියලා කිව්වේ නැහැ. මේ රටේ ජනතාවට මේක අධ්‍යයනය කරන්න කාලය ඕනෑ කිව්වේ නැහැ. 18 ට අත ඉස්සුවා. අන්ධයෝ, ගොළුවෝ, බීරෝ වාගේ ඔක්කොම ටික අත ඉස්සුවා. ඒ වෙලාවේදී මේකට විරුද්ධ වුණේ එක්සත් ජාතික පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි විතරයි. 19 කියන්නේ මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව. මේ රටේ ජනතාව බලාපොරොත්තු වන වෙනස. මේ දින 100 එකේම තිබෙනවා. වෙනසකට එක් වෙමු කිව්වේ ඒකයි. නැත්නම් වෙනසකට එක්වෙමු කිව්වේ අපි ඔක්කෝම එකතු වෙලා ආණ්ඩුවක් කරගෙන යමු කියන එකට නොවෙයි. වෙනසකට එක් වෙමු කිව්වේ ජනතාව බලාපොරොත්තු වුණු ජනාධිපති ක්‍රමය, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කියන එකයි. අන්න ඒ නිසා හෙළ උරුමයෙන් ඉල්ලා සිටිනවා මේක නැවත වරක් පැත්තෙන් පැත්තට කඹ ඇද ඇද ඉන්න එපා. මේක සම්මත කරලා, පොඩි පොඩි අඩුපාඩු තිබෙනවා නම් ඒවාත් හදාගෙන ඉක්මණින් සම්මත කරලා ජනතාවට - මේ අවස්ථාව නැවත පාර්ලිමේන්තුවට ලැබෙන්නේ නැහැ. ඒ අවස්ථාව නැති කරන්න එපා කියන ඉල්ලීම කරමින් මේ විවාදයට සම්බන්ධ වුණු ඔබ සියලුම දෙනාට ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සියලු දෙනාගේම විවාදයට ඇවිල්ලා - රීති අත්හිටුවීමේ යෝජනාව පිළිබඳ විවාදය මෙතැනින් අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාවය? බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව
BY-LAW ON OPPRESSIVE TRADES, DANGEROUS TRADES AND OPPRESSIVE AND DANGEROUS TRADES : MINUWANGODA PRADESHIYA SABHA

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය යටතේ*

*මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද මීනුවන්ගොඩ ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියැවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(1) වගන්තිය යටතේ එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/13 දරන හා 2014.01.20 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවන්ට, අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම, එම අතුරු ව්‍යවස්ථාවන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියැවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට 2014.08.19 දින ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තවදුරටත් 2015.03.03 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර, තම නිර්දේශයන් සහිත වාර්තාව 20105.03.17 දින මෙම පළාත් සභාවට ඉදිරිපත් කර ඇති හෙයින් එම කාරක සභා නිර්දේශයන් පිළිබඳවද සැළකිලිමත්ව ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කර අද සභාවට ඉදිරිපත් කරන ලද පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනවලට යටත්ව අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ එක්කම මම මතක් කරනවා. 2015 දී එළැඹෙන සිංහල - හින්දු අලුත් අවුරුද්ද සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා**!** කියලා ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනා වෙනුවෙන් මම ප්‍රාර්ථනා කරමින්, සභාවේ පූර්ව භාගයේ යෝජනා අවසන් වෙනවා. මීළඟට 2015 අප්‍රේල් මස 28 වැනි දින පෙරවරු 09.30 දක්වා -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් අපි හැමදාම ඉන්න කට්ටිය. සවස තුන විතර වනතුරු රීති අත්හිටුවීමේ යෝජනාවක් ආවාම මේකේ අපි නිතරම ඉන්නවා. අඩුම ගණනේ දිවා ආහාරයවත් ලැහැස්ති කරන්න බැරි නම් - මම කියන්නේ 02.30, 3.00 වන කොට ෂෝට්ස් එකක්, තේ එකක්වත් දෙන්න වැඩ පිළිවෙළක් ලැහැස්ති කරගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 03.03 ට, 2015 අප්‍රේල් මස 28 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 03.03 p.m till 09.30 a.m, on 28.04.2015.*